# පාලි භාෂාව

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 4 වැනි ශ්‍රේණිය

**(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

**පාලි භාෂාව**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

4 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

**පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරිමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

අකිල විරාජ් කාරියවසම්

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු  කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලුම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

එම්. එන්. රණසිංහ

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

**පෙරවදන**

පිරිවෙන ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍යපරම්පරාව වෙත අච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක වන විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි.එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගුරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412'5'12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පංති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පංති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

**පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය**

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පංතිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

විජිත වෙලගෙදර
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය**

**උපදේශකත්වය හා අනුමැතිය :** ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

**මෙහෙයවීම** : ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්‍ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

විජිත වෙලගෙදර මයා, අධ්‍යාපන අධ්‍යක්‍ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්‍ෂණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා
අධ්‍යක්‍ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : පූජ්‍ය කුකුරම්පොළ ඥාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** : පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය

කේ. ඒ. සුමිත් ධර්මශ්‍රී මයා
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (පාලි භාෂාව)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය** : පූජ්‍ය මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

| | | |
|---|---|---|
| **ලේඛක මණ්ඩලය** | : | පූජ්‍ය මුවපැටිගේවෙල පඤ්ඤාලෝක හිමි<br>කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය පුස්සල්ලාවේ ඤාණරතන හිමි<br>කථිකාචාර්ය (බාහිර), බෞද්ධ අධ්‍යයනාංශය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය මුතුකණ්ඩියේ ඤාණාලෝක හිමි<br>පරිවේණාචාර්ය, විද්‍යාමංගල මහ පිරිවෙණ<br>මංගලගම, මොළගොඩ |
| | | පාලිත ජයසිංහ මයා<br>පරිවේණාචාර්ය, කළු/පතිරාජ මහ පිරිවෙණ<br>අගලවත්ත |
| | | ආර්. ඒ. විමල් ප්‍රේමතිලක මයා<br>කථිකාචාර්ය, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය<br>අවිස්සාවේල්ල |
| **භාෂා හා විෂය කරුණු සංස්කරණය** | : | පූජ්‍ය මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි<br>පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය |
| | | නදී අමා ජයසේකර මිය<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, විභාග දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සෝදුපත් කියැවීම** | : | කේ. ඒ. සුමිත් ධර්මශ්‍රී මයා<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලි භාෂාව)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **පරිගණක වදන් සැකැසීම** | : | නදී අමා ජයසේකර මිය<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, විභාග දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **පිටකවර නිර්මාණය** | : | |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

පාලි භාෂාව වූකලී ලෝකයේ අතිවමත්කාරජනක මධුර මනෝහර භාෂාවන්ගෙන් එකකි. එයින් රචිත ත්‍රිපිටක සාහිත්‍යය ඇතුළු අටුවා ටීකා හා ප්‍රකරණ සාහිත්‍යාගත කෘති දාර්ශනික හා සාහිත්‍යමය වශයෙන් ලෝකයේ කිසිදු සාහිත්‍යයක දක්නට නොමැති වටිනාකමකින් යුක්ත ය. මෙබඳු භාෂාවක් හා සාහිත්‍යයක් රැක ගැනීම හා පෝෂණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය ථේරවාද සම්ප්‍රදායකට ලෝකයෙන් හිමි වන්නේ වර්ණනා විෂායාතික්‍රාන්ත වූ ගරුත්වයක් බව අපි දනිමු. මිනිසකු විසින් ලැබිය හැකි නිරාමිෂ ආස්වාදය හා බුද්ධත්වය දක්වා වූ උත්තරීතර ආධ්‍යාත්මික පරිපෘෂ්ටියත්, තදනුබද්ධ භාවිකත්වය හා බුද්ධිමය සංවර්ධනයත්, ලබා ගත හැකි විශිෂ්ට සාහිත්‍යයක් ශ්‍රී ලාංකික අප සතු වන බව මැනවින් හඳුනා ගත් බටහිර උගතුන් පවා එකී ගරුත්වය හා කෘතඥතාව ශ්‍රී ලංකාව වෙත පුද කොට ඇත. එපමණක් නො ව එම සවිඤ්ඤාණිකත්වය මුළු මහත් ලෝකයට ම ලබා දීම ජීවිත කාලයක කළ හැකි උත්කෘෂ්ට කර්තව්‍යයක් බව හඳුනා ගත් ඔවුන් එය යුරෝපා රටවලට හඳුන්වා දීමට ක්‍රියා කළ බව ද අප විසින් තේරුම් ගත යුත්තක් වේ. ශ්‍රී ලංකාවේ එවකට විසූ විශිෂ්ට පඬිවරයකු වූ **යාත්‍රාමුල්ලේ ධම්මාරාම** හිමියන්ගෙන් පාලි භාෂාව උගත් **රීස් ඬේවිඩ්ස්** පඬිතුමා එංගලන්තයේ **පාලි මූලාශ්‍රය ග්‍රන්ථ ප්‍රකාශන සංගමය**(Pali Text Society) පිහිටුවා අද දක්වා පමණක් නො ව අනාගතයේ ද මුළු ලෝකයාට ම පාලි භාෂාව හා බුද්ධවචනය ආශ්‍රිත ඥාන සම්භාරය ආධ්‍යාත්මගත කිරීමට ඉඩ සලසා තිබීම මෙයට එක් නිදසුනක් පමණකි. මෙහි වටිනාකම මැනවින් හඳුනාගෙන ඇති බටහිර උගත්හු ඉතා උද්‍යෝගයෙන් හා කැපවීමෙන් යුතු ව මීට සම්බන්ධ හැදෑරීම් මේ වන විටත් සිදු කරමින් සිටිති. ත්‍රිපිටක ධර්මයෙහි ඇතුළත් දාර්ශනික සිද්ධාන්ත පමණක් නො ව භාවනාව හා එමගින් සිදු කෙරෙන මානසික සංවර්ධනය මිනිස් ජීවිතයේ ලැබිය හැකි ලෞකික අලෞකික සියලු පුරුෂාර්ථයන් සාධනය කිරීමෙහි ලා මහගු පිටිවහලකි. එහෙත් ශ්‍රී ලාංකික අප මෙබඳු වටිනා ඉගැන්වීමක් හා ධර්ම සාහිත්‍යයක් ළඟ තබා ගනිමින් වර්තමානයෙහි අවිඤ්ඤාණික ව සිටීම බලවත් අභාග්‍යයක සලකුණකි.

ශ්‍රී ලාංකේය සම්බුද්ධ ශාසනය ශෝභමාන කිරීම හා චිරස්ථායී කිරීම සඳහා උගත් බුද්ධිමත් හා ගුණගරුක භික්ෂු භික්ෂුණී පරපුරක් සිටීම අවශ්‍ය වේ. එසේ ම උපාසක, උපාසිකා, ගිහි පිරිස ද ධර්මානුධර්ම ප්‍රතිපන්න විය යුතු ය. මෙම කාර්යය සඳහා නිර්දිෂ්ට මාර්ගය සනිටුහන් වන්නේ පාලි භාෂාවෙන් රචිත ත්‍රිපිටක සාහිත්‍යයේ මිස අන් කිසිදු තැනක නො වේ. එම මාර්ගය සුරක්ෂිත කිරීමත් විවරණය කිරීමත් සඳහා අතීත ශ්‍රී ලාංකික උතුම් මහ සඟරුවන විසින් ජීවිත පරිත්‍යාගයෙන් ඉටු කරන ලද කාර්යය නමස්කාර පූර්වක ව සිහිපත් කළ යුතු ය. එහෙත් වර්තමාන සඟ පරපුරෙන් එම වගකීම හා කාර්යභාරය ගිළිහී ගොස් ඇති බව උකටලී සිතින් මෙනෙහි කිරීමට සිදු වී ඇති බව ද නොවළහා කිව යුතු ය. ශ්‍රී ලාංකේය ථේරවාද සම්ප්‍රදායට අයත් එය සුරක්ෂිත කිරීමට අවශ්‍ය වන අමුද්‍රිත පාලි ටීකා ප්‍රකරණ ග්‍රන්ථාදියෙහි පුස්කොළ හා අත්පිටපත් සිය දහස් ගණනක් මෙතෙක් කිසිවකුගේ අවධානයට පත් නො වී තිබීමත්, ඒවා ඒ ඒ තැන්හි දිරාපත් වෙමින් තිබීමත්, ඇතැම් විට මුදලට විකිණීමත්, යනාදි කරුණු රාශියක් නිසා අපට අහිමි වෙමින් පවතී. මෙයට එක ම හේතුව වන්නේ පාලි භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නො තිබීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වී ඇති විශේෂයෙන් ත්‍රිපිටක සාහිත්‍යයේ ගැඹුර හා අනේකවිධ වටිනාකම් පිළිබඳ අවබෝධයක් නො තිබීමත් ය.

මෙයට විසඳුම කුමක් ද? එය අන් කිසිවක් නො ව පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ අනාගත පරපුර ප්‍රවීණයන් කිරීම යි. එය කළ හැකි වන්නේ අනුක්‍රමික ව පාලි භාෂාව ඉගෙනීම සඳහා ආධුනිකයන් පුරුදු පුහුණු කිරීමෙන් හා එය වැඩි දුරටත් ප්‍රගුණ කිරීම සඳහා ශිෂ්‍යයන් තුළ උත්තේජනයක් ඇති කිරීමෙනි. ලෝකයේ විශිෂ්ටතම සාහිත්‍යය, දර්ශනය හා ජීවිත විද්‍යාව ඇත්තේ පාලි ත්‍රිපිටක සාහිත්‍යයේ බව පාලි විෂය උගන්වන ගුරුවරයා විසින් මෙන් ම ආධුනිකයා විසින් ද දත යුත්තකි. විශිෂ්ට පර්යේෂණ ක්‍රමයක් හා ගැඹුරු ඥාන සම්භාරයක් අටුවා හා ටීකාවල ඇතුළත් බව ඔවුන් විසින් තේරුම් ගත යුතු ය. ශ්‍රී ලාංකික අපගේ ඉතිහාසය තේරුම් ගත හැක්කේ **මහාවංසය දීපවංසය** ඇතුළු වංසකථා ග්‍රන්ථවලින් හා පාලි අට්ඨකථා ග්‍රන්ථවලිනි. එපමණක් නො ව මෙම සාහිත්‍යයේ **පජ්ජමධු** වැනි කාව්‍ය ග්‍රන්ථ ද, **වුත්තෝදය** වැනි ඡන්දස් ග්‍රන්ථ හා **සුබෝධාලංකාරය** වැනි අලංකාර ග්‍රන්ථ ද, **ජිනවංසදීපමහාකාව්‍ය** වැනි මහාකාව්‍ය ග්‍රන්ථ ද, **මහානෙක්ඛම්මචම්පු** වැනි චම්පු කාව්‍ය ග්‍රන්ථ ද, **බාලාවතාර, රූපසිද්ධි** වැනි ව්‍යාකරණ ග්‍රන්ථ ද, **අභිධානප්පදීපිකාව** හා **එකක්ඛරකොස** වැනි කෝෂ ග්‍රන්ථ ද, **ධම්මනීති, ලොකනීති** වැනි නීති ග්‍රන්ථ ද, **භෙසජ්ජමඤ්ජුසා** වැනි වෛද්‍ය ග්‍රන්ථ ද, **මිලින්දපඤ්හ** වැනි තර්ක ග්‍රන්ථ ද, **වුත්තමාලාසතක සිරිසුමංගලසතක** වැනි ශතක ග්‍රන්ථ ද, **මහානාගකුලසන්දෙසය** වැනි සන්දේශ ග්‍රන්ථ ද, **කල්‍යාණිසිලාලිපි** වැනි ශිලාලේඛන ද, **චක්කවාළදීපනී** වැනි විශ්වය පිළිබඳ ග්‍රන්ථ ද, යනාදි වශයෙන් අනේකවිධ විෂයයන් සම්බන්ධයෙන් පාලි භාෂාවෙන් ලියැවුණු බොහෝ කෘති ඇත. මේ නිසා පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ මනා දැනුමක් ඇති කෙනකු විවිධ ශබ්ද ශාස්ත්‍රයන් පිළිබඳ නිරායාශයෙන් ම අද්විතීය විද්වතකු බවට පත් වේ. එබඳු උගතකු රටක තුන්කාලයට අයත් අගනා වස්තුවක් බව අමුතුවෙන් කිව යුත්තක් නො වේ. තව ද අප විසින් දත යුත්තක් වේ. එනම් කෙනකු තුළ පවතින උගත්කම පමණක් වටිනා අබරණයක් නො වේ. එයට හැදිච්චකම ද එකතු විය යුතු ය. පාලි පොතපත කියවීමෙන් මිනිසකුගේ ආධ්‍යාත්මයෙහි නො සිතිය හැකි තරම් ආලෝකයක් විහිදේ. ඔහු ඉතා උසස් මිනිසකු වේ. තථාගත දේශනාව ඇතුළත් මෙම පොතපත කියවීමෙන් ලැබෙන දැනුම හා හැදියාව විස්මය ජනක වන්නේ එහෙයිනි.

**යාවත්කාලීන වීම**

මූලික පිරිවෙන් සඳහා නිර්දේශිත ග්‍රන්ථ මාලාව ඉහත කී ප්‍රධාන අරමුණු ඉලක්ක කර ගත් කෘති සමුදායකි. ඒවා මැනැවින් අධ්‍යයනය කිරීමෙන් පසු ආධුනිකයකුට පාලි භාෂාවෙන් ලියැවී ඇති කවර කෘතියක් වුව ද කියවා තේරුම් ගැනීමට අවශ්‍ය මූලික පදනම ලැබෙනු ඇත. එහි සැකසුම හා එය කළ යුතු ආකාරය පිළිබඳ පාලි භාෂාව උගන්වනු ලබන ගුරුවරයාට මනා අවබෝධයක් තිබිය යුතු බව මුලින් ම තේරුම් ගන්න. අධ්‍යාපනය යන්න මුළුමනින් ම පාහේ රැ දී ඇත්තේ ගුරුවරයා මත ය. ඔහුගේ කාර්යය වන්නේ නො දන්නා දෙය දන්නා දෙයක් බවට පත් කිරීමත් නො හැක්කා හැකි අයකු බවට පත් කිරීමත් ය. එබැවින් ගුරුවරයා නො දන්නෙක් හෝ හැකියාව නැත්තෙක් නො විය යුතු ය. ගුරුවරයා මුලින් ම පූර්ව සූදානමකින් ශිෂ්‍යයා පුහුණු කිරීමේ කාර්යයෙහි නිරත විය යුතු ය. කිසි විටෙකත් ගුරුවරයා නො දන්නකු හෝ නො හැකියාව ඇත්තකු හෝ බව ශිෂ්‍යයාගේ මනසට සම්ප්‍රේෂණය නො කිරීමට වග බලා ගත යුතු ය. මේ සඳහා ගුරුවරයකුට ඇති ප්‍රබලතම ශක්තිය වන්නේ ඔහු සතු ඥානය හා එම ඥානයෙහි යාවත්කාලීන බව යි. එබැවින් පාලි ගුරුවරයා දිනපතා පාලි භාෂාව සම්බන්ධයෙන් තම දැනුම පෝෂණය කර ගත යුතු අතර ම ඒ සම්බන්ධ අලුතෙන් ම ලියැවෙන පොතපත කියවීම, අලුත් වචන හා එහි සංවර්ධනීය

ලක්ෂණ, නවතම ඉගැන්වීම ක්‍රම යනාදිය පිළිබඳ අවබෝධයෙන් සිටිය යුතු ය. එය මූලික අවශ්‍යතාවකි.

**ඉගැන්වීම් ක්‍රම**

ගුරුවරයාගේ ඉගැන්වීමේ කාර්යය සිදු විය යුතු ආකාරය PPP Theory ලෙස වර්තමාන අධ්‍යාපනඥයන් විසින් පෙන්වා දී ඇත. එය 1. Presentation (ප්‍රස්තුතීකරණය), 2. Practice (භාවිතය) 3. Production (නිෂ්පාදනය) යනුවෙන් දක්වා ඇත.

පළමු වන පියවර වන **ප්‍රස්තුතීකරණයේ** දී කෙරෙනුයේ නියමිත පාඩමට අදාළ දත්ත ගෙනහැර දැක්වීම යි. මෙය ගුරුවරයා විසින් කළ යුත්තකි. ඔහු විසින් විවිධ ක්‍රමෝපායන් යොදා ගනිමින් අදාළ පාඩම ශිෂ්‍යයාගේ මනසට කාවදින ලෙස විස්තර කර දිය යුතු ය. ඒ සඳහා අදාළ මාතෘකාව නිර්වචනය කිරීම, විස්තර කිරීම, නිදසුන් දැක්වීම, පුවරුවක පෙන්වීම, උපමා රූපක චිත්‍ර සටහන් ගෙන හැර දැක්වීම, සංයුක්ත තැටි හෝ වීඩියෝ දර්ශන ඉදිරිපත් කිරීම, අතීතකථා ජනකථා වර්තමාන සිද්ධි මගින් තහවුරු කිරීම යනාදි විවිධ ක්‍රියාකාරකම් කළ හැකි ය. මෙකී කවරාකාර විධියකින් හෝ අදාළ ඉදිරිපත් කිරීම චිත්තාකර්ෂණීය ලෙස සිදු කළ යුතු ය. මෙහි දී ගුරුවරයාගේ කාර්යභාරය 90%ක් වන අතර ශිෂ්‍යයාගේ සහභාගිත්වය සිදු වනුයේ 10%කිනි.

දෙවන පියවර වන **භාවිතයේ** දී එකී පාඩමට අදාළ ප්‍රායෝගික භාවිතයන් නැතහොත් පුරුදු පුහුණු කිරීම් ශිෂ්‍යයා ලවා සිදු කරවිය යුතු ය. එහි දී ශිෂ්‍යයාගේ සහභාගිත්වය 60%ක් වන අතර ගුරුවරයා විසින් 40%ක දායකත්වයක් සැපයිය යුතු ය. ප්‍රශ්න කිරීමට හා තම අදහස් ප්‍රකාශ කිරීමට හා ලියා ගැනීමට අවස්ථාව දීම, සජ්ඣායනා කරවීම, අභ්‍යාස කරවීම යනාදි ක්‍රියාකාරකම් කරවීම මෙහි දී සිදු විය යුතු ය. ගුරුවරයා විසින් මඟ පෙන්වීම කළ යුතු ය. අවසානයේ දී ගුරුවරයා විසින් ශිෂ්‍යයන්ගේ පොදු වැරදි හඳුනා ගනිමින් ඒවා නිවැරැදි කරවිය යුතු ය.

තුන් වන පියවර වන **නිෂ්පාදනයේ** දී ශිෂ්‍යයාගේ අවබෝධය ඔහුගේ ක්‍රියාකාරකම්වලින් ප්‍රකාශ කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතු ය. මෙහි 90%ක් ම සිදු කරනු ලබනුයේ ශිෂ්‍යයා විසින් වන අතර, ගුරුවරයාගේ කාර්යභාරය 10%කි. එහි දී ඔහු අදාළ පාඩම සම්බන්ධයෙන් කරුණු දක්වයි. උදාහරණ දෙමින් පැහැදිලි කරමින් ලිවීම කථා කිරීම නිර්මාණ ගෙනහැර දැක්වීම සිදුකෙරේ.

බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයෙහි ඊට වඩා අතිශයින් ම හරවත් අනුක්‍රමයක් දක්වා ඇත. **සුචිපුලිහා මුත්තො කථං පණ්ඩිතො භවෙය්‍ය** යනුවෙන් අර්ථකථාචාරීහු **සු-චි-පු-ලි-හා** යන මෙයින් තොර ව උගතෙකු විය නො හැකි බව කී හ.

**සු** යන්නෙන් අදහස් වන්නේ **සුණාති** (Listens - අසයි) යන්න යි. ඒ අනුව මුලින් ම ශිෂ්‍යයාට පාඩම අසා ගෙන සිටීමට සැලැස්විය යුතු ය.

**චි** යන්නෙන් අදහස් වන්නේ **චින්තෙති** (Thinks - සිතයි) යන්න යි. දෙවනු ව ඇසූ පාඩම පිළිබඳ යමක් සිතීමට හා මතකයෙහි රඳවා ගැනීමට ඉඩ සැලසිය යුතු ය.

**පු** යන්නෙන් අදහස් වන්නේ **පුච්ඡති** (Questions - විමසයි) යන්න යි. ඒ අනුව ශිෂ්‍යයාට යම් යම් දේ තමාගෙන් (ගුරුවරයාගෙන්) ප්‍රශ්න කිරීමට අවස්ථාව සැලසිය යුතු ය.

**ලි** යන්නෙන් අදහස් වන්නේ **ලිඛති** (Writes - ලියයි) යන්න යි. ලේඛනය යි.

ලිවීම, කියැවීම මෙන්ම අදාළ දත්ත ඒකරාශී කර ගැනීමට ඉඩ සැලසීම මෙයින් අදහස් කෙරේ. එනම් තමා උගත් දේ දීර්ඝකාලීන මතකයක් කරා රැගෙන යාම පිණිස ලියා තබා ගැනීම ඇතුළුව ඉදිරි ප්‍රයෝජනය සඳහා අවශ්‍ය අභ්‍යාස කිරීමට පෙළඹවීම මෙයින් අදහස් කෙරේ.

**භා** යන්නෙන් අදහස් වන්නේ **භාසති** (speaks/Expresses - ප්‍රකාශ කරයි) යන්න යි. අවසාන වශයෙන් ශිෂ්‍යයාට තමා ඉගෙන ගත්, අවබෝධ කර ගත් දේ වාචික ව හෝ නිර්මාණාත්මක ව හෝ වෙනත් යම් විධියකින් හෝ ප්‍රකාශයට පත් කිරීමට හැකි වෙයි.
මේ අනුව බෞද්ධ සම්ප්‍රදාය සතු ඉගැන්වීම් ක්‍රම කෙතරම් යාවත්කාලීන ද යන්න මැනැවින් තහවුරු වෙයි. ගුරුවරයකු වශයෙන් ඔබට අපට ම අනන්‍ය වූ මෙම ක්‍රමවේදය අභිමනින් යුතු ව අනුගමනය කළ හැකි ය.

තව ද බුදුන් වහන්සේ හඳුන්වනු ලබන විශේෂණවාචී එක් පර්යාය නාමයක් වන්නේ **සත්ථා** (teacher or instructor) යන්න යි. ඒ අනුව උන්වහන්සේ ද ගුරුවරයෙකි, නැතහොත් උපදේශකයෙකි, එසේත් නැත්නම් මාර්ගය පෙන්වන්නෙකි. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමවලින් එකක් දක්වෙන පාඨයක් බොහෝ සූත්‍රාන්ත දේශනාවල දක්නා ලැබේ. එනම් **අහං ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි** යන්න යි. **මම කියමි** (tell) **දේශනා කරමි** (preach) **පණවමි** (declare/appoint) **පිහිටුවමි** (establish) **විවරණය කරමි** (explain) **බෙදා දක්වමි** (analyse) **ගැටලුවෙන් එතෙර කරමි** (make clear) යනු එහි තේරුම යි.

1. **ආචික්ඛති** - ගුරුවරයා පළමු ව පාඩම සම්බන්ධයෙන් සුහදශීලී යමක් කියයි.
2. **දෙසෙති** - තමාගේ කීමට ගරුත්වයක් ආරෝපණය වන පරිදි තම භාෂාව හසුරුවයි. එය දේශනාවක් මෙන් ගැඹුරු පිළිගැනීමක් සහිත වූවකි.
3. **පඤ්ඤාපෙති** - එම පාඩම සම්බන්ධයෙන් වැදගත් ම මූලික සංකල්පයක් දක්වයි. නිදසුනක් ලෙස **සමාස** ගැන යැයි සිතන්න. 'සමාසවලින් පද රාශියක් එකතු කොට කෙටිපදයක් සාදා අදහස් රාශියක් කෙටියෙන් කිව හැකි ය' යනුවෙන් **පැණවීමක් නැතහොත් ස්ථිර මතයක්** දක්විය හැකි ය. වෙනත් විධියකින් කිවහොත් **සමාසො පද සංඛෙපො** යනුවෙන් පාඩමට ප්‍රවේශයක් ලබාගත හැකි ය.
4. **පට්ඨපෙති** - අදාළ කරුණු දක්වමින් ශිෂ්‍යයා තුළ විශ්වාසය හා රුචිකත්වය ගොඩ නගමින් එකී ඉගැන්වීම තුළ ශිෂ්‍යයා පිහිටුවයි.
5. **විවරති** - විස්තර විවරණ දක්වමින් කරුණ පැහැදිලි කරයි.
6. **විභජති** - විශ්ලේෂණය කරයි. බෙදා දක්වයි. සමාස නම් එහි විග්‍රහ වාක්‍ය **මහන්තො ච සො පුරිසො මහාපුරිසො** (මහත් වූයේත් ඔහු ය පුරුෂයකු වූයේත් ඔහු නුයි මහාපුරුෂ නම් වේ.) යනාදි නයින් විග්‍රහ වාක්‍ය දක්වීම එයින් දිගු අදහසක් කෙටි වී ඇති ආකාරය, එබඳු පද භාෂාවේ යෙදී ඇති ආකාරය, ඒවා නාමපද මෙන් විභක්තිවල වරනැගෙන ආකාරය, එයින් අර්ථය වෙනස් වන අයුරු, භාෂාව අලංකාරවත් හා ඕජෝ ගුණයෙන් යුක්ත වන ආකාරය යනාදිය පැහැදිලි කරයි. අනතුරු ව සමාස බෙදා දක්වමින් 'බෙදා දක්වා හෙවත් විභජනය කොට' ඒ සම්බන්ධයෙන් පරිසමාප්ත දැනුමක් ලබා දෙයි.
7. **උත්තානීකරොති** - ගැටලුවෙන් නිදහස් කෙරේ. ශිෂ්‍යයා සමාස පිළිබඳ තිබූ සියලු ගැටළුවලින් නිදහස් කෙරේ.

බුදුදහම තුළ පවත්නා මෙවන් සුවිශේෂ ක්‍රමවේද ඕනෑ ම කාලයක කවර ම හෝ විෂයකට කෙතරම් උචිත ද යන්න විමසා බැලීම වටී. තමා උගන්වනු ලබන සෑම පාඩමක දී ම මෙබඳු පැහැදිලි රාමුවක් තුළ හිඳිමින් සැලසුම් සහගත ව කරුණු ඉදිරිපත් කිරීම ගුරුවරයා සතු වගකීමකි.

**අවධානය රඳවා ගැනීම**

ඉගැන්වීම වූ කලී හැම අයුරකින් ම සැලසුම් සහගත, විධිමත් හා යහපත් පරිදි සිදු විය යුතු කාර්යයකි. බුදුරජාණන් වහන්සේගේ කරුණු ගෙනහැර දැක්වීමේ ස්වභාවය විවරණය කෙරෙන පද කිහිපයක් පෙළෙහි දක්වා ඇත. එම පද **සං** (යහපත් ලෙස) යන උපසර්ගය පූර්වක වන පරිදි යොදා තිබීම විශේෂයක් වේ.

**සන්දස්සෙති** - කරුණු මනා ව දක්වයි.

**සමාදපෙති** - එම කරුණු කෙරෙහි මනා විශ්වාසයක් ගොඩනගයි.

**සම්පහංසෙති** - ශිෂ්‍යයා තුළ ඉගැන්වූ කරුණු කෙරෙහි සතුටක් ඇති කරවයි.

**සමුත්තෙජෙති** - ඉගෙනීම කෙරෙහි උත්තේජනයක් ඇති කරවයි.

ගුරුවරයා විසින් කරනු ලබන කාර්යය විධිමත් වූ ද, මානසික සතුට උපදවන්නා වූ ද, ශිෂ්‍යයාට වැඩිදුර හැදෑරීම සඳහා උත්තේජනයක් ඇති කරවන්නා වූ ද, ක්‍රියාවලියක් විය යුතු ම ය. ශිෂ්‍ය අවධානය දිනා ගැනීම කිසි සේත් ඕලාරික පහත් ග්‍රාම්‍ය කථා ආදිය කීමෙන් සිදු නො කළ යුතු ය. එය බෞද්ධ ක්‍රමවේදය නො වේ. එසේ ම එවැනි දෑ තුළ ස්ථිරසාර දීර්ඝකාලීන වටිනාකමක් ද නැත. ගුරුවරයාගේ ශිෂ්ට සම්පන්න බව හා ප්‍රියශීලී හෘදයාංගම භාෂාව, දයාබරිත බව, පාඩමට අදාළ ව ම කරුණු දැක්වීම, පැහැදිලි හා නිරවුල් උච්චාරණය, සරල ඉගැන්වීම් ක්‍රම, ආකර්ෂණීය ශිෂ්‍ය ක්‍රියාකාරකම් යනාදිය ශිෂ්‍ය අවධානය රඳවා ගැනීමේ හේතු ය. බුදුරජාණන් වහන්සේ එවන් ආදර්ශමත් ඉගැන්වීමක නිරත වූ ශාස්තෘවරයෙකි.

**ව්‍යාකරණය හා පරිවර්තනය**

මූලික පිරිවෙන් පාලි විෂය ග්‍රන්ථ මාලාවෙහි සෑම පාඩමක් ම සැකසී ඇත්තේ කිසියම් ව්‍යාකරණාංගයක් ඉගැන්වීමට අදාළ වන පාලි පාඨයක් ප්‍රස්තුත කොට ගනිමිනි. එම පාඨ හුදු පරිවර්තනයක් කිරීම පමණක් අරමුණු කොට ගත් ඒවා නො වේ. බොහෝ විට පාලි ඉගෙනීම සඳහා අනුගමනය කරනුයේ ව්‍යාකරණ ඉගෙනීමත් පරිවර්තනය කිරීමත් යන ක්‍රම දෙක යි. මෙම ක්‍රමය 18 වන සියවස දී පමණ ක්‍රියාත්මක වූ දැනට යල් පැනගිය ක්‍රමයකි. ව්‍යාකරණය හා පර්වර්තනය කිරීමේ ක්‍රමවේදයෙන් කිසිදු ජීව භාෂාවක් සාර්ථක ව ඉගෙන ගත නො හැකි ය. එහෙයින් සෑම පාඩමක් ම ආරම්භ කෙරෙන පාලි ඡේදය දෙස ඊට වඩා පුළුල් ඇසකින් බැලිය යුතු ය. පළමු වන ශ්‍රේණියේ සිට පස් වන ශ්‍රේණිය දක්වා සෑම පෙළ පොතක් ම සැකසී ඇත්තේ අනිවාර්යයෙන් ම දත යුතු ව්‍යාකරණාංග කිහිපය කෙරේ දැනුම පුළුල් වන පරිදි ය. නිදසුනක් ලෙස සෑම පන්තියකට ම අදාළ ග්‍රන්ථයේ මුල් ම පාඩම වන්නේ පාලි අක්ෂර මාලාව යි. දෙවැන්න නාමපද යි. සෙසු පාඩම් ද එසේ ම ය. ඒවා කිසියම් රටාවකට සැකසී ඇත. එම පාඩම් අනුක්‍රමයෙන් ශිෂ්‍යයාගේ දැනුම දියුණු කිරීම අරමුණු කොට සකසා ඇති බව පාඩම් සැසඳීමෙන් වටහා ගන්න. එය ඒ ඒ පන්තියේ දී තම අවධානය වැඩි වශයෙන් යොමු කළ යුත්තේ කවර විෂය සීමාවක් කෙරෙහි ද යන්න අවබෝධ කර ගැනීමට ඔබට උපකාරී වනු ඇත. එකී සෑම පාලි ඡේදයක් ම මැනවින් උච්චාරණය කිරීම, ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දීම, එයින් ලැබෙන ජීවිත අවබෝධය සාකච්ඡා කිරීම, කාව්‍යමය හා සාහිත්‍යමය ලක්ෂණ පෙන්වා දෙමින් රසාස්වාදය කිරීම, සමාජ සංස්කෘතික හර පද්ධතීන් විවරණය කිරීම, ආගමික කාර්යයන් සඳහා යොමු කරවීම, නිර්මාණාත්මක වාක්‍ය රටා සෑදීමට යොමු කරවීම යනාදිය ඒ ඒ පන්තියේ ශිෂ්‍යයන්ගේ වයස් මට්ටම් ආදිය කෙරෙහි සැලකිල්ලක් දක්වමින් සිදු කළ හැකි ය. ඒ සඳහා උපකාර වන මග පෙන්වීම් පාඩම

අවසානයේ අභ්‍යාස මගින් පෙන්වා දී ඇත. මෙයින් අපේක්ෂිත කාර්යය වන්නේ අනුක්‍රමික ව ශිෂ්‍යයාගේ දැනුම මෙන් ම හදවත ද පෝෂණය කිරීම යි.

සෑම භාෂාවක ම ව්‍යාකරණය වූ කලී ශිෂ්‍යයන් විසින් ඉතා අපහසු යැයි සලකනු ලබන විෂය පරිපාථයක් වේ. එහෙත් එය සත්‍යය නො වේ. භාෂාවේ ඇතැම් රීති අප ඉගෙන ගෙන ඇත්තේ කිසියම් ව්‍යාකරණ කෘතියකින් නො වේ. ඒවා බොහෝ විට ඉගෙන ගන්නේ පොතපතෙහි යෙදී ඇති ආකාරය බහුල වශයෙන් දැකීමෙනි. ඒ අනුව පොතපත වැඩි වශයෙන් කියවීම, නිවැරදි ලෙස උච්චාරණය කිරීම, පරිවර්තනය කිරීම, අරුත් තේරුම් ගැනීම යනාදියෙන් එහි ශෛලිය හා භාෂා රීතිය හඳුනා ගත හැකි ය. ඒ අනුව කෙනකුට ව්‍යාකරණ ඉගෙනීමකින් තොර ව වුව ද භාෂාවක් හැසිරවීමේ ශක්තිය ලැබේ. අනෙක් කිසිදු බුද්ධ දේශනාවක ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දී නැත. එසේ ම ව්‍යාකරණය ඉගෙනීම සඳහා ශ්‍රාවකයන් දිරිමත් කළ අවස්ථාවක් ද නැත. ව්‍යාකරණයෙහි ප්‍රවීණ වූ කිසියම් ශ්‍රාවකයකු අග තනතුරු දීම් ආදියෙන් ඇගයීමක් කළ බවට ද සාධක නැත. එහෙත් ව්‍යාකරණ හැදෑරීමකින් තොර ව බුද්ධවචනය වටහා ගැනීමෙන් මාර්ග ඵල අවබෝධ කොට ගෙන ඇත. එයින් තහවුරු වන්නේ ව්‍යාකරණය පිළිබඳ අනවශ්‍ය වටිනාකමක් දීමට මුල් කාලීන බෞද්ධ සම්ප්‍රදාය තුළ උද්‍යෝගයක් නො පැවති බව යි. එබැවින් භාෂාව ඉගැන්වීමේ දී ශිෂ්‍යයා කෙරෙහි ව්‍යාකරණය සම්බන්ධයෙන් අනවශ්‍ය භීතියක් ඇති නො කරවීමට ගුරුවරයා විසින් වග බලාගත යුතු ය.

ඉහත කී අදහස දැඩි ව ගෙන වරදවා වටහා නො ගත යුතු ය. බුද්ධකාලීන ශ්‍රාවකයන් ව්‍යාකරණය නො දත් බවත් එහෙයින් මෙ කල ද ව්‍යාකරණය දැන ගැනීම අවශ්‍ය නො වන බවත් තහවුරු කිරීමට උත්සුක නො විය යුතු වන්නේ ඔවුන් සංස්කෘත භාෂාව දැන සිටි බැවින් පාලි භාෂාවේ භාවිතය ඔවුන්ට වහා වටහා ගත හැකි වූ හෙයිනි. එනිසා ඔවුන්ට ව්‍යාකරණමය දැනුමක් නො තිබූ බව කීම නිවැරැදි නො වේ. අපට ද සංස්කෘත භාෂා ඥානය මැනවින් ඇත්නම් පාලි ව්‍යාකරණ සිද්ධාන්ත ද ඒ අනුව බොහෝ සෙයින් වටහා ගත හැකි ය. මේ නිසා ව්‍යාකරණය සම්බන්ධයෙන් පහත දැක්වෙන අපගේ සාම්පදායික අදහස ද සම්භාවනීයත්වයෙන් පිළිගත යුත්තකි.

**යො නිරුත්තිං න ජානාති - ජානාති පිටකත්තයං**

**පදෙ පදෙ විකංඛෙය්‍ය - වනෙ අන්ධගජො විය**

**'යමෙක් ව්‍යාකරණය නො දනී ද, පිටකත්‍රය දනී ද, ඔහු වනයෙහි සැරිසරන අන්ධ ඇතකු මෙන් පියවරක් පාසා සැක කරයි'** යනු එහි දළ අදහස යි. මෙයින් අදහස් වන්නේ ව්‍යාකරණය නො දනී නම් බුද්ධවචනය හැදෑරීමේ දී නිතර ම ගැටලුවලට මුහුණ පාන බව යි. එයින් ගම්‍ය වන්නේ ව්‍යාකරණ ඥානයෙන් තොර ව බුද්ධවචනය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම අපහසු බව යි. මේ නිසා ව්‍යාකරණ ඥානය බුද්ධවචනය හැදෑරීමේ අත්‍යවශ්‍ය අංගයක් වේ. ලෞකික විෂයයන් හැදෑරීම සඳහා අප විසින් යොදා ගනු ලබන ඉංග්‍රීසි සිංහල භාෂාවලට වඩා බුද්ධවචනය ප්‍රකාශ වන පාලි භාෂාව වෙනස් ය. එය කිසි සේත් සෙසු භාෂාවලට සම කළ නො හැකි ය. ඊට හේතුව එය **සාත්ථ සබ්‍යඤ්ජන** ගුණයෙන් යුක්ත වීමත් ශබ්ද ධ්වනි ආශ්‍රිත ශක්ති විශේෂයන් පැවතීමත් නිසා ය. එම නිසා තනි අක්ෂරයක් වුව ද වැදගත් ය. වෙනත් භාෂාවල අක්ෂරයක් වැරදුණු පමණකින් අර්ථයට මහත් හානියක් සිදු නො වේ. එහෙත් පාලියේ අක්ෂරයක් වැරදුණ හොත්

එයින් අර්ථයට සිදු වන හානිය විශාල ය. එබැවින් ආගමික භාෂාවක් වන පාලියේ සියලු භාෂාත්මක ප්‍රයෝග සැලකිල්ලෙන් භාවිත කළ යුතු වේ. පාලි භාෂාවේ දී ව්‍යාකරණය වැදගත් වන්නේ එහෙයිනි. මෙම වචනවල තේරුම බලන්න. **අත්ථි ලිඞ්ගං (ලිංගයක් ඇත) අත්තිලිඞ්ගං (ලිංගත්‍රයක් නැත), මච්චො (මිනිසා) මච්ඡො (මත්ස්‍යයා), අච්චි (ගිනිදැල්) අච්ඡි (ඇස)** යනාදි වශයෙනි. එක් අක්ෂරයක වෙනස නිසා අර්ථමය වශයෙන් සිදුවන වෙනස එයින් පෙනේ. ඇතැම් පද ලියන්නේ එක සමාන ව වුවත් උච්චාරණයෙන් වෙනස පෙන්නුම් කළ යුතු ය. **අජහිතො** යන්නෙහි තේරුම **'අජානං හිතො අජහිතො'** යනුවෙන් තත්පුරිස සමාස පදයක් ලෙස ගෙන **එළුවන්ට හිතවත් වූ තැනැත්තා** යනුවෙන් අර්ථ දැක්විය හැකි ය. එසේම එයට **අජහිතො** යන්නෙහි **අත් නො හළ තැනැත්තා(න ජහිතො)** යනුවෙන් ද අරුත් කිව හැකි ය. මේ නිසා පාලි-සංස්කෘත වැනි භාෂාවල උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතියේ හික්මවීමක් ද සිදු කෙරේ. එබැවින් කළයුතු වන්නේ කුමක් ද යන්න ඉතා පැහැදිලි ය. එනම් ව්‍යාකරණය පිළිබඳ නිරවුල් දැනුමක් තිබීම භාෂාවක් හැදෑරීමේ දී අත්‍යවශ්‍ය අංගයක් බව ශිෂ්‍යයාට අවබෝධ කර දීම හා ඒ සඳහා ඔහු තුළ උත්තේජනයක් ඇති කිරීම යි.

**ව්‍යාකරණයේ සරල බව**

පාලි භාෂාව මැනවින් හැදෑරීමට අවශ්‍ය වන පාලි ව්‍යාකරණය කෙනකුට වටහා ගත නො හැකි තරමට සංකීර්ණ වූවක් හෝ පුළුල් වූවක් හෝ දුෂ්කර වූවක් හෝ නො වේ. එහි විෂය සීමාව ව්‍යාකරණාංග කිහිපයකට පමණක් සීමා වේ. ඒ අනුව යමකුට අවම වශයෙන් **අක්ෂර මාලාව, නාමපද, සන්ධි, සමාස, තද්ධිත, කාරක, කිතක හා ආඛ්‍යාත** යන ව්‍යාකරණාංග 08 පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇත්නම් ඔහුට පාලි භාෂාව මැනවින් හැසිරවීමේ හැකියාවක් ලැබේ. පාලි විෂය මූලික පිරිවෙන් පොත් පෙළෙහි මෙම ව්‍යාකරණාංග කිහිපය ඉතා විධිමත් ව හා සර්ව සම්පූර්ණ ලෙස ඉගැන්වීමට හැකි වන පරිදි කරුණු පෙළ ගස්වා ඇත. මෙය ගුරුවරයා විසින් මෙන් ම ශිෂ්‍යයා විසින් ද මනා ව තේරුම් ගත යුත්තකි. මේවා ඉගැන්වීමේ දී ගුරුවරයකු වශයෙන් ඔබ තුළ ඉතා පිරිසිදු දැනුමක් තිබීම අතිශය වැදගත් බව තේරුම් ගන්න.

ව්‍යාකරණය ඉගෙනීම යනු භාෂාවක් භාවිත කරන ආකාරය දැන ගැනීම යි. විශේෂයෙන් එහි වාක්‍යයක පද යෙදීමේ රටාව තේරුම් ගැනීම යි. එය ශිෂ්‍යයාට පහසුවෙන් ග්‍රහණය කරගත හැකි වන පරිදි ගොනු කොට දැක්වීමට දක්ෂ ගුරුවරයා සමත් වෙයි. ඔහු ඒ සඳහා විවිධ උපාය මාර්ග අනුගමනය කරයි. පාඩමක මුලින් ම දක්වා ඇති පාඨයක් ශබ්ද නගා කියැවීම, සජ්ඣායනා කිරීම, පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීම ආදි ක්‍රමවලින් ශිෂ්‍යයා වාග් කෝෂය දියුණු කර ගනී. නිවැරදි උච්චාරණ රටාව හා නිවැරදි ලේඛනය හඳුනා ගනී. තිත් කොමා ආදිය නිසි පරිදි තැබිය යුතු ස්ථාන තේරුම් ගනී. පාඨයේ අර්ථය වටහා ගනී. මෙබඳු ප්‍රයෝජන රාශියක් සිදු වේ. මේවා සියල්ල ම ව්‍යාකරණට අයත් කරුණු ය. ඒ අතර ව්‍යාකරණ ග්‍රන්ථවල උගන්වනු ලබන ඉහත කී මාතෘකා ගැන ද ගුරුවරයා සිහිපත් කරයි. තමා ඉගෙන ගත් ව්‍යාකරණ සිද්ධාන්තය එකී පාඨය තුලින් ශිෂ්‍යයා මෙනෙහි කරන අතර එහි අපැහැදිලි බවක් වේ නම් ඔහු විසින් ප්‍රශ්න කරනු ඇත.

ගුරුවරයා වූ කලී සම්පාදකයෙකි (provider). ඔහු සියල්ල සපයන්නෙකි. මෙම කාර්යය වඩා සාර්ථක ව කළ හැකි වන්නේ විෂය පිළිබඳ යාවත්කාලීන දැනුමක් සහිත ව ගුරු භූමිකාවෙහි සිටින කෙනකුට පමණකි. ගුරුවරයා සිතිය යුත්තේ පියෙකු දරුවන් කෙරෙහි සිතන ආකරයට බව

බුදුරජාණන් වහන්සේ වදාළේ එහෙයිනි. එහෙයින් පොතෙහි දී ඇති පාඩමට අදාළ කරුණු පිළිබඳ පමණක් නො ව තත් විෂය සම්බන්ධ අනෙකුත් කරුණු පිළිබඳ ද විශේෂඥ දැනීමක් තිබීම ගුරුවරයකුට ඉගැන්වීමේ දී අතිශය ප්‍රයෝජනවත් වේ. නිදසුනක් ලෙස ආධුනිකයකු අක්ෂර මාලාව පිළිබඳ දත යුත්තේ එහි මූලික කරුණු කිහිපයකි. ඒ අනුව ඔහු භාෂාව මැනවින් භාවිත කරයි. එහෙත් ගුරුවරයා අක්ෂර මූලික කොට ගෙන භාෂාවක ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ ද හැදෑරීමට හැකි බව දැන සිටිය යුතු ය. නිදසුනක් ලෙස **චතුහි වාතෙහි අසම්පකම්පියො** යනුවෙන් යෙදිය හැකි පාඨය **චතුබ්භි වාතෙහි අසම්පකම්පියො** යනුවෙන් යොදා ඇත්තේ ශබ්ද විද්‍යාත්මක අවශ්‍යතාවක් නිසා ය. එකී යෙදුමෙහි ශබ්ද ධ්වනියක් ඇත. එහෙයින් ම එයින් කාව්‍යමය ගුණයක් ද ප්‍රකාශ වේ. අනෙක් අතින් මෙහි සංස්කෘතයෙහි බලපෑමක් ද විද්‍යමාන වේ. එහෙයින් ම එම ප්‍රයෝගය ඓතිහාසික ව්‍යාකරණය අනුව ද විශ්ලේෂණය කළ හැකි ය. මෙබඳු භාවිතයන් පාලියෙහි සුලබ වන හෙයින් ඒවා අධ්‍යයනය කිරීම ද භාෂාවක් පිළිබඳ ගැඹුරු විඤ්ඤාණයක් ඇති වීමට ඉවහල් වේ. අනෙක් අතින් පාලියේ එක ම තනි අක්ෂරයක වුව ද අරුත් කිහිපයක් ඇත. 'ඛ' යන අක්ෂරය **අහස, හිස්** යන අර්ථ ද්වයක් දෙයි. ඒ අනුව **ඛෙ (අහසෙහි), ඛග (කුරුල්ලා), ඛයං (ක්ෂය වීම හෝ නිවන)** යනාදි විවිධ වචන නිර්මාණය වේ. මේ නිසා ආධුනිකයකුට ඉගැන්වීමෙහි නිරත වන ගුරුවරයාට ශිෂ්‍යයා ඉදිරියෙහි තම දැනුම ප්‍රකාශ කිරීමට එයින් මහත් පිටිවහලක් ලැබේ.

ගුරුවරයා විෂය ප්‍රවීණයකු වේ නම් ඔහුට අදාළ පාඩමට ඇතුළත් විය යුතු කරුණු මනා ව පෙළගස්වා ශිෂ්‍යයාට වැඩිදුර ඉගෙනීමට මංපෙත් විවර කර දිය හැකි ය. නිදසුනක් ලෙස පාලියෙහි **කාරක විභක්ති** ප්‍රයෝග භාවිතය දෙස බලන්න. එහි දක්වා ඇත්තේ විභක්තියට අදාළ රීති කිහිපයක් පමණකි. **සමඟ** යන අර්ථය දීමට යොදන **සහ, සද්ධිං** යන නිපාත පද තතියා විභක්ති නාම පද සමඟ යෙදිය යුතු ය යන්න රීතියකි. එසේ ම **අතුරෙන්/අතරින්/අතර** යන අදහස පැවසීමට නාම පදය ඡට්ඨී හෝ සත්තමී බහුවචනයෙන් යෙදිය යුතු බව කාරක ප්‍රයෝගයකි. ඒ අනුව **ප්‍රඥාවන්තයන් අතුරෙන්** යැයි පැවසිය යුතු විට **පඤ්ඤාවන්තානං** හෝ **පඤ්ඤාවන්තෙසු** යැයි යෙදිය යුතු ය. මෙම දැනුම තරමක් වැඩුණු දැනුමක් සහිත ශිෂ්‍යයකු විසින් දැන ගෙන තිබීම ප්‍රමාණවත් ය. එහෙත් ගුරුවරයකු විසින් තම දැනුම මීට ද වඩා පුළුල් කොට ගෙන තිබිය යුතු ය. **සබ්බං රසං ධම්මරසො ජිනාති** යන්නෙහි තේරුම **'සියලු රස අතුරෙන් ධර්ම රසය ජය ගනියි'** යන්න යි. එම වාක්‍යයෙහි ඡට්ඨී හෝ සත්තමී රීතිය ක්‍රියාත්මක වී ඇද්ද? නැත. එයින් පෙනෙනුයේ එහි **අතුරෙන්** යන අදහස ප්‍රකාශ කිරීමට **දුතියා** විභක්තිය ද යෙදී ඇති බව යි. ගුරුවරයා මෙය දනී නම් ඔහුට ඉගැන්වීමේ කාර්යයේ දී වඩාත් ආත්ම විශ්වාසයෙන් යුතු ව අදාළ ව්‍යාකරණ සිද්ධාන්තය ඉගැන්විය හැකි ය. ශිෂ්‍යයකු යම් අවස්ථාවක එබඳු ගැටලු ගැන ප්‍රශ්න කළ හොත් නිවැරදි පිළිතුරක් සැපයීමට හැකි වීම, ගුරුවරයාගේ සුවිශේෂ දැනුම තුළින් ශිෂ්‍යයා වැඩිදුර සෙවීමට පෙළඹවීම, අතිරේක පොතපත කියවීමට පෙළඹවීම, විශ්ලේෂණ විමර්ශන හා චින්තන ශක්තිය දියුණු කිරීම, අදාළ පාඩම සිහි කල්පනාවෙන් නැවත නැවතත් අධ්‍යයනය කිරීමට උත්තේජනයක් ඇති වීම ආදි ප්‍රයෝජන රාශියක් එයින් ලැබේ.

මෙපමණක් නො ව ගුරුවරයා තම පුළුල් දැනුමෙන් ශිෂ්‍යයාගේ අවබෝධය පුළුල් කිරීමේ උපාය මාර්ගය ද යොදයි. නිදසුනක් ලෙස ඔබ ශිෂ්‍යයකුගෙන් **එදා** යන්න පාලියෙන් කිව හැක්කේ කෙසේ දැයි ප්‍රශ්න කළහොත් ඔහු වහා **තදා** යැයි පිළිතුරු දෙනු ඇත. එහෙත් දක්ෂ ගුරුවරයා එම අදහස පැවසිය හැකි වෙනත් ආකාර ද පෙන්වා දීමෙන් භාෂාව වඩාත් පහසු ලෙස හා විධිමත් ලෙස භාවිත කිරීමට ශිෂ්‍යයාට මඟ පෙන්වයි. පහත දැක්වෙන නිදසුන් බලන්න.

| | | |
|---|---|---|
| එදා/එදවස | - තදා | (තදා අරඤ්ඤෙ එකො තාපසො අහොසි.) |
| | තස්මිං දිවසෙ | (තස්මිං දිවසෙ මනුස්සා දීඝායුකා අහෙසුං) |
| | තස්මිං සමයෙ | (තස්මිං සමයෙ ත්වං කුහිං විහාසි?) |
| | තෙන ඛො පන සමයෙන | (තෙන ඛො පන සමයෙන භගවා එවං දෙසෙසි.) |
| එක් දවසක | - එකදා | (එකදා අහං ජම්බුදීපෙ වසිං) |
| | එකස්මිං දිවසෙ | (එකස්මිං අහං දිවසෙ ජම්බුදීපෙ අචරිං) |
| | එකස්මිං කාලෙ | (එකස්මිං කාලෙ අහං ජම්බුදීපෙ උග්ගණ්හිං) |
| | එකං සමයං | (එකස්මිං සමයෙ අහං ජම්බුදීපෙ විහාසිං) |
| හොඳයි/මැනවි | - සාධු | (සාධු සාධු මහාකච්චාන) |
| | භද්දං | (භද්දං තෙ දස්සනං) |
| | කල්‍යාණං | (කල්‍යාණං තවාගමනං) |
| | අභික්කන්තං | (අභික්කන්තං භො ගොතම) |
| | යන්නූන | (යන්නූන ත්වං මෙත්තං චිත්තං භාවෙය්‍යාසි) |
| නම් වූ | - නාම | (සන්තින්ද්‍රියො නමා සාමණෙරො) |
| | නාමො | (සුමනපාලො නාමො මහාසයො) |
| | සමඤ්ඤො | (සුමනො සමඤ්ඤො සමණො අහොසි.) |
| | අභිධානො | (හික්කඩුවේ සිරි සුමංගලාභිධානො නායකත්ථෙරො.) |
| | ආඛ්‍යො | (හත්ථිසෙලපුරාඛ්‍යො නගරෙ) |
| | අව්හයො | (ධම්මප්පියව්හයා භික්ඛුනී සීලවතී හොති.) |

මෙයින් පැහැදිලි වන්නේ එක ම අදහස විවිධ අයුරින් පැවසිය හැකි බව යි. මෙසේ එක ම අදහස පැවසිය හැකි ක්‍රම හඳුනා ගැනීමෙන් ශිෂ්‍යයා තම අදහස ඉතා ව්‍යක්ත ආකාරයෙන් පාලියෙන් පැවසීමේ කුශලතාව වර්ධනය කර ගනී. මෙබඳු ක්‍රම ශිෂ්‍යයාගේ මනසට මැනවින් තහවුරු වූ කල්හි පන්තියේ කරනු ලබන පරිවර්තනවල දී පාඨ ග්‍රන්ථ කියවීමේ දී හා සූත්‍ර සජ්ඣායනයේ දී ඔහු ඒ බව ස්මරණය කොට ලේඛනයේ දී පෙන්නුම් කරයි.

එපමණක් නො ව ඇතැම් යෙදුම් මතකයේ තබා ගත හැකි නම් අපට වඩාත් ව්‍යක්ත ලෙස වාක්‍ය ලිවීමටත් භාෂාව කථා කිරීමටත් හැකි වේ. නිදසුනක් ලෙස **කච්චි තෙ කස්සප ඛමනීයං? (කාශ්‍යපය, ඔබට ඉවසන්ට පුළුවන් ද?)** යන මෙම ප්‍රකාශය බලන්න. මෙම පාඨය මතකයේ ඇති ශිෂ්‍යයකුට **කච්චි තෙ ආවුසො ගමනීයං? (අවැත්නි ඔබට යන්ට පුළුවන් ද?)**
**කච්චි තෙ උපාසිකෙ පචනීයං? (උපසාසිකාවෙනි, ඔබට උයන්ට පුළුවන් ද?)**
**කච්චි තෙ මහාසය, අජ්ජ කරණීයමිදං කම්මං? (මහත්තයෝ අද මේ වැඩේ කරන්ට පුළුවන් ද?)**
යනාදි වශයෙන් බොහෝ විවිධ වාක්‍ය නිර්මාණය කළ හැකි ය. මෙබඳු වාක්‍ය මෙම පොත් පෙළෙහි විවිධ තැන්වල යෙදී තිබෙනු දැකිය හැකි ය.
නිදසුන් -
**මා රොදසීති මාතා ඔවදි.** (හඬන්න එපා කියලා අම්මා අවවාද කළා. - 2 ශ්‍රේණිය, 5 පාඩම)

**උත්තරදිසායං දමිළා, දක්ඛිණපස්සෙ ගොඨසමුද්දො, කථං සුඛෙනාහං සයාමි?**
(උතුරු පැත්තේ දෙමළු, දකුණු පැත්තේ ගොළු මුහුද, මං කොහොම සැප සේ නිදන්න ද?
2 ශ්‍රේණිය, 6 පාඩම)

**තං කිං මඤ්ඤසි මහාරාජ?** (මහරජතුමෙනි, ඔබ ඒ ගැන මොකද හිතන්නෙ? - 3 ශ්‍රේණිය, 11 පාඩම)

**අත්ථංගතෙ සුරියෙ සායමාසං භුඤ්ජිත්වා** (හිරු බැස ගිය කල්හි රාත්‍රී ආහාරය අනුභව කොට - 4 ශ්‍රේණිය, 8 පාඩම)

**බුද්දපුත්තාම්හි සමණ පොස මං** (ශ්‍රමණය, මම කුඩා දරුවකු ඇත්තියක් වෙමි. මා පෝෂණය කරන්න. - 5 ශ්‍රේණිය, 16 පාඩම)

ඉහත වාක්‍යවල කිසියම් භාෂා රීතියක් දක්නට ඇත. එම වාක්‍ය ශිෂ්‍යයාට මතකයේ දරා ගත හැකි නම් ඔහුට එම ශෛලියෙන් ම එබඳු සිය දහස් ගණනක් වාක්‍ය නිර්මාණය කළ හැකි ය. එබැවින් ඉගැන්වීමේ දී එබඳු වාක්‍ය ශිෂ්‍යයාගේ මතකයෙහි රඳවාලීමට ගුරුවරයා සමත්විය යුතු ය.

**පාඨ විවරණය**

සෑම පාඩමක් ම කිසියම් පාඨයකින් ආරම්භ වීම මෙම ග්‍රන්ථවල මූලික ලක්ෂණයක් බව මුලින් කියන ලදී. එම පාඨ පරිවර්තනය කිරීම, ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දීම, අලුත් වචන හඳුනා ගැනීම පමණක් නො ව එම පාඨයෙන් කියැවෙන ආගමික සාමාජික සාහිත්‍යාත්මක හා ඓතිහාසික ආදි කරුණු විවරණය කොට දීම ද ඒවායින් අපේක්ෂිත කාර්යය වේ. මෙය පැහැදිලි කිරීම සඳහා මූලික පිරිවෙණ 3 ශ්‍රේණිය පොතෙහි 08 වන පාඩම ගනිමු.

> 'මන්දාර පර්වතයෙහි දුර්දාන්ත නමින් එක් සිංහයෙක් විසී ය. ඌ විසින් දිනපතා බොහෝ සිවුපාවුන් මරන ලද බැවින් කැලෑවේ සිවුපාවෝ රැස් වී 'අප අතරින් එකකු දිනපතා ඔබගේ සමීපයට එවන්නෙමු' යි කී හ. ඔහු 'ඉතා මැනවැ' යි එය පිළිගති. දිනක් මහලු හාවකුගේ වාරය පැමිණියේ ය. ඔහු 'කෙසේ නම් මරණයෙන් මිදෙන්නෙම් ද'යි සිතමින් උපායක් සිතමින් තැන තැන කල් යවමින් සිංහයා වෙතට පැමිණියේ ය. බඩගින්නෙන් පෙළුණු සිංහයා කෝපාවිෂ්ට ව 'තෝ කුමක් නිසා පරක්කු වී ආවේ ද'යි ඇසී ය. 'ස්වාමීනි, මගේ වරදක් නැත. අතරමග දී වෙනත් සිංහයකු විසින් මම නවත්වන ලද්දෙමි. මම ඔබතුමාගේ ළඟට අවුත් නැවත එමි යි කියන තුරු මට එන්නට නො දුන්නේ යැ'යි හාවා කී ය. එයින් අතිශය කෝපයට පත් සිංහයා 'මට වහා ඒ උඩඟු සිංහයා පෙන්වව'යි කියමින් ඔහු සමීපයට යන්නට නික්මිණි. ඉක්බිති සාවා ඔහු ඉතා ගැඹුරු ළිදක් ළඟට පමුණුවා 'බලන්න ස්වාමීනි, ඒ දුෂ්ටයා මේ ළිඳ ඇතුළේ වෙසේ යැ'යි කියමින් ළිං ජලයෙහි පෙනෙන ඔහුගේ ම ඡායාව පෙන්වී ය. උඩඟු වූ සිංහයා මහත් හඬින් ගොරවමින් ළිඳට පැන එහි ම මළේ ය.'

ඉහත දැක්වෙන ඉතා කුඩා කථා වස්තුව රසවත් කිරීම සඳහා සාහිත්‍යකරුවා උපක්‍රම කිහිපයක් යොදයි. සිංහයා සහ හාවා අතර සංවාදය ඉන් එකකි. අවස්ථා නිරූපණය තවත් උපක්‍රමයකි. භාෂා ශෛලිය තවෙකකි. ඊට අමතර ව කථාවෙන් නො කියැවෙන බොහෝ දේ ඉස්මතු කිරීමට සංකේතාත්මක භාෂාව ද භාවිත කරයි. නිදසුනක් ලෙස මෙහි කථා නායකයාට සිංහයා යොදා

ගැනීමෙන් සමාජයේ කවරාකාර උසස් යැයි සම්මත කෙනකුට වුව ද මෙහි දැක්වෙන සිද්ධි දාමය අදාළ වන බව සංකේතවත් කෙරේ. එසේ ම මෙහි සිංහයා නො හික්මුණු දඩබ්බර කෙනකු බව වචනයකිනුදු නො කියැවේ. එහෙත් ඔහු හිතුවක්කාරයෙක් බව හැඟවේ. එය සංකේතවත් කෙරෙනුයේ ඔහු හඳුන්වනු ලබන නාමයෙනි. එනම් **දුර්දාන්ත** (දුද්දන්ත) යන්නෙනි. එයින් අදහස් කෙරෙනුයේ කිසි දමනයක් නැති අසංවර චණ්ඩ කෙනකු බව යි. **වුද්ධසසක** (මහලු සාවා) යන්නෙන් අදහස් කෙරෙනුයේ මුහුකුරා ගිය චින්තන ශක්තිය යි. ළිං ජලයෙහි ඡායාවෙන් අදහස් වන්නේ මායාව යි. මෙබඳු සංකේතාත්මක අදහස් පැවසීමක් මෙම කථා වස්තුවෙහි භාවිත පදවල දක්නා ලැබේ. අනෙක් අතින් මෙයින් ලැබෙන සමාජ විඥානය ද පුළුල් ය. තරුණකම, ශක්තිය හා බලවත්කම යනාදිය සෑම විට ම ජීවිතයක් ගෙවීමේ දී ප්‍රබලතම සාධක නො වේ. ඇතැම් විට සමාජ මට්ටමෙන් කුඩා කෙනකුට වුවත් ඔහුට වයසින් මුහුකුරා ගිය බුද්ධියක් ඇත්නම් උපායශීලී ව ඇතැම් ගැටලු විසඳා ගත හැකි ය. අනෙක් අතින් අවිඥානික ජන සමාජයක දුබලයා හැමවිට ම ප්‍රබලයාගේ ගොදුරක් බවට පත් වන බව ද උපන්‍යාසයකි. මහලු සාවාගේ උපායශීලිත්වයෙන් අපට උගන්වනු ලබන පාඩම එය යි. එබැවින් මහල්ලන්ට ගැරහීම තරුණ ප්‍රජාව විසින් කිසි විටෙකත් නො කළ යුත්තක් ය යන උපදේශය ලැබේ. මෙසේ මෙම කථා වස්තු පිළිබඳ විග්‍රහයක් කිරීමෙන් ද ශිෂ්‍යයාගේ ජීවිත විඥානය හා රසාස්වාද ශක්තිය පුළුල් කළ හැකි ය.

ඉහත දැක්වූ කරුණු අනුව ඉගැන්වීමේ කාර්යයේ දී ගුරුවරයකුට වගකීම් හා කාර්යභාරයන් රාශියක් ඇත. ශිෂ්‍යයා තම ගුරුවරයාගේ ඥාන ශක්තියේ ගැඹුර හා පිරිසිදුභාවය දැකීමෙන් බොහෝ දෑ ඉගෙන ගනී. ඉගැන්වීම යනු ගුරුවරයාගේ ඇඳුම, පැළඳුම, ගමනබිමන, ගතිගුණ, කතාබහ, හැසිරීම, භාෂා පරිහරණය, කරුණු දැක්වීම, රිද්මයානුකූල අවයව චලනය ආදී ශරීරයේ සියලු ඉරියව් මගින් කරනු ලබන මග පෙන්වීමකි. එක් අතකින් ගුරුවරයා ශිෂ්‍යයාගේ දකුණ අත වැනි ය. කෙනකුගේ ජවය, ශක්තිය, හැකියාව සඳහා දකුණු අත බලපාන ආකාරය ඔබ දනී. ශිෂ්‍යයා ද පසුකාලීන ව සමාජයට බොහෝ දෑ කරනු ලබන්නේ ගුරුවරයාගෙන් ලද පන්නරය නිසා ය. බුදුන් වහන්සේ විසිනුදු **ආචරියා දක්ඛිණා දිසා** යනුවෙන් ප්‍රකාශ කිරීම ද සලකා බලන්න. පාලි භාෂාව ත්‍රිපිටක භාෂාව බව අපි දනිමු. මෙම භාෂාව ඉගෙනීමෙන් ශිෂ්‍යයාට දැනුම ලබා දීම නූතන අධ්‍යාපනයේ මූලික අරමුණ වුවත් බෞද්ධ සම්ප්‍රදාය තුළ ඊට සමගාමී ලෙස ශිෂ්‍යයාගේ හදවත පෝෂණය කිරීම ද අපේක්ෂා කෙරෙන බව තේරුම් ගන්න. සමාජයට බුද්ධිමත් මෙන් ම ගුණගරුක මිනිසකු ප්‍රදානය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. විශේෂයෙන් පාලි භාෂාව බහුල වශයෙන් හදාරනු ලබනුයේ සාමණේර භික්ෂූන් වහන්සේලා විසින් හෙයින් උන්වහන්සේලාගේ ශ්‍රමණ සාරුප්‍ය ගුණය වර්ධනය වන මානසික ඒකාග්‍රතාවට තුඩු දෙන දැනුම් සම්භාරයක් ද, නිර්වාණගාමී මාර්ගය කෙරෙහි ප්‍රවණතාවක් හා උත්තේජනයක් ද, ඇති වන පරිදි ඉගැන්වීමේ කාර්යය සිදු විය යුතු බව ගුරුවරයා අවබෝධ කර ගත යුතු ය.

**මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ පණිවිඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xii |
| පටුන | xxii |
| ජාතික අරමුණු | xxiii |
| මූලික නිපුණතා | xxiv |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xxvi |
| විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xxvii |
| විෂය නිර්දේශය | xxviii |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxxii |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | 1 |
| පාඩම 1 - පාලි අක්‍ෂරමාලාව | 4 |
| පාඩම 2 - අක්‍ෂර උත්පත්තිස්ථාන | 8 |
| පාඩම 3 - විභක්ත්‍යර්ථ | 11 |
| පාඩම 4 - සර්වනාම | 15 |
| පාඩම 5 - නාම වරනැගීම | 18 |
| පාඩම 6 - ත්‍රෛකාලික ආඛ්‍යාත | 21 |
| පාඩම 7 - පඤ්චමී සහ සත්තමී ආඛ්‍යාත | 25 |
| පාඩම 8 - හීයත්තනී, පරොක්ඛා, කාලාතිපත්ති ආඛ්‍යාත | 28 |
| පාඩම 9 - වාක්‍ය රචනය I | 31 |
| පාඩම 10 - වාක්‍ය රචනය II | 34 |
| පාඩම 11 - වාක්‍ය පරිවර්තනය I | 36 |
| පාඩම 12 - වාක්‍ය පරිවර්තනය II | 38 |
| පාඩම 13 - පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කිරීම | 41 |
| පාඩම 14 - නිර්දිෂ්ට සූත්‍ර ගණසජ්ඣායනය | 43 |
| පාඩම 15 - සන්ධි | 45 |
| පාඩම 16 - සමාස | 48 |
| පාඩම 17 - තද්ධිත | 51 |
| පාඩම 18 - කිතක | 62 |
| පාඩම 19 - නිර්දිෂ්ට පද්‍ය පාඨ - මහාවංශය | 66 |
| පාඩම 20 - නිර්දිෂ්ට ගද්‍ය පාඨ | 68 |
| තක්සේරුව සහ ඇගයීම | 70 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම.

තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ ඵලදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. පාලි භාෂාව නිවැරැදිව උච්චාරණය කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම

02. පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ පද, විවිධ වාක්‍ය රටා හා රචනය හුරු කිරීම

03. පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘභාෂාවටත්, මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම

04. පාලි සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කර ගනිමින් පෞරුෂේය චරිතයක් බිහිකිරීම

05. ත්‍රිපිටකාගත හරධර්ම චරිතායනය කෙරෙන ආදර්ශවත් හා මනා පෞරුෂයක් සහිත භික්ෂු පිරිසක් රටට දායාද කිරීම

06. පාලි භාෂාව පිළිබඳ දැනුම සිංහල භාෂාඥානයේ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කිරීම

07. පාලි භාෂාව තමාගේ මෙන්ම ජාතියේ ද සියරටේ ද උරුමයක් බව තහවුරු කිරීම

08. ත්‍රිපිටකය හැදෑරීම සඳහා පාලි භාෂාව මූලික අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම

09. ත්‍රිපිටකය හා අටුවා පරිශීලනය කරමින් ධර්මය නිවැරැදිව අර්ථකථනය කරන භික්ෂු පිරිසක් ශාසනයට දායක කිරීම

10. ත්‍රිපිටක බුද්ධවචනය නිවැරදිව ග්‍රහණය කිරීම පිණිස ඇති ඒකායන මාර්ගය පාලි භාෂාව ඉගෙනීම බව පසක් කිරීම

11. ත්‍රිපිටක බුද්ධවචනය ඉදිරියට පවත්වාගෙන යැමට ප්‍රතිබල සම්පන්න පිරිසක් බිහිකිරීම

12. මහාවිහාරීය භික්ෂු සම්ප්‍රදාය විසින් සුරක්ෂිත විශිෂ්ට ඥාණ සම්භාරය නොනසා ආරක්ෂා කිරීම

13. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත කිරීම සඳහා සිසුන් යොමු කිරීම

14. පාලි භාෂාව ඉගෙනීමෙන් තමන්ටත් සිව්පසය සපයන දායක පිරිසටත් මෙලොව පරලොව සුභසිද්ධිය ළඟා කරවා ගත හැකි බව තහවුරු කිරීම

## පාලි භාෂාව
## විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 04 | I | 1.1, 1.2, 2.1, 2.2, 2.3, 3.1, 3.2, 3.3, 4.1, 4.2, 4.3, | 46 |
| | II | 5.1, 5.2, 5.3, 6.1, 6.2, 6.3 | 51 |
| | III | 7.1, 7.2, 7.3 8.1, 8.2, 8.3, 8.4, 8.5, 9.1, 9.2, 9.3, 10.1, 10.2, 10.3, 11.1, 11.2, 11.3, 11.4 | 53 |
| | | එකතුව | 150 |

# පාලි භාෂාව - විෂය නිර්දේශය

## 4 ශ්‍රේණිය

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පාලි අක්ෂරමාලාව ප්‍රභේද ගතකර භාවිත කරයි. | 1.0<br>1.1 පාලි අක්ෂරමාලාව ප්‍රභේද කර ලියයි.<br>1.2 අක්ෂර උත්පත්තිස්ථාන හඳුන්වා ඊට අයත් අකුරු ලියයි. | 1.0<br>• පාලි අක්ෂර මාලාව<br>• ස්වර ප්‍රභේද<br>• ව්‍යඤ්ජන ප්‍රභේද<br>• අක්ෂර උත්පත්ති ස්ථාන | 1.0<br>• පාලි අක්ෂර මාලාව නිවැරදි ව පිළිවෙළින් ලියා දක්වයි.<br>• පාලි අක්ෂරමාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.<br>• පාලි අක්ෂරමාලාව නිවැරදි ව කියවයි.<br>• පාලි අක්ෂරමාලාවේ ප්‍රභේද ලියයි.<br>• අක්ෂර උත්පත්තිස්ථාන නම් කරයි.<br>• ඒ ඒ ස්ථානයෙන් උපදින අකුරු ලියා වගුගත කරයි.<br>• බාලාවතාර සූත්‍රානුසාරයෙන් අක්ෂර උත්පත්තිස්ථාන පැහැදිලි කරයි. | 12 |
| 2.0. පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි. | 2.0<br>2.1 නාම විභක්තිවල විභක්ත්‍යර්ථ පෙන්වා දෙයි.<br>2.2 නාම විශේෂණපද ලෙස නාම පද භාවිත කරයි.<br>2.3 නියමිත ශබ්ද ලිංගත්‍රයේ වරනගයි. | 2.0<br>• ගුණවන්තු ශබ්දය<br>• ගච්ඡන්ත ශබ්දය<br>• සර්වනාම<br>  • ත ශබ්දය<br>  • එත ශබ්දය<br>  • ඉම ශබ්දය<br>  • කිං ශබ්දය | 2.0<br>• නාම විභක්තිරූපවල අර්ථය ලියයි.<br>• නියමිත ශබ්ද නාමපද ලෙස වාක්‍යවල යොදයි.<br>• නියමිත සර්වනාම ශබ්ද විශේෂණපද ලෙස භාවිත කරයි.<br>• **ගුණවන්තු** ශබ්දය සහ **ගච්ඡන්ත** ශබ්දය ලිංගත්‍රයේ වරනගයි.<br>• සර්වනාම ලිංගත්‍රයේ වරනගයි. | 12 |
| 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | 3.0<br>3.1 ත්‍රෛකාලික ආඛ්‍යාත වගුගත කරයි.<br>3.2 පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත වරනගා අර්ථ ගන්වයි.<br>3.3 හීයත්තනී, පරොක්ඛා, කාලාතිපත්ති ආඛ්‍යාත උභයපදයෙහි වරනගයි. | 3.0<br>• ත්‍රෛකාලික ආඛ්‍යාතය<br>• පඤ්චමීති ආඛ්‍යාතය<br>• සත්තමී ආඛ්‍යාතය<br>• හීයත්තනී ආඛ්‍යාතය<br>• පරොක්ඛා ආඛ්‍යාතය<br>• කාලාතිපත්ති ආඛ්‍යාතය | 3.0<br>• ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කරයි.<br>• ආඛ්‍යාත වගුගත කර ප්‍රදර්ශනය කරයි.<br>• ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ප්‍රකාශ කරයි.<br>• ඒ ඒ ආඛ්‍යාත පද අර්ථ ගන්වයි.<br>• විවිධ ධාතු ඒ ඒ ආඛ්‍යාතවල වරනගා වගුගත කර දක්වයි.<br>• නියමිත ආඛ්‍යාත මතකයෙන් කියයි, ලියයි. | 10 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි. | 4.0<br>4.1 සරල වාක්‍ය මගින් වාක්‍ය රචනාවක් ලියයි.<br>4.2 වර්තමානකාල කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා<br>4.3 වර්තමානකාල කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියයි. | 4.0<br>• කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය<br>• ත්‍රෛකාලික ක්‍රියා<br>• නිපාත<br>• උපසර්ග | 4.0<br>• මාතෘකානුකූල ව වැකි පහක රචනාවක් ලියයි.<br>• දින, මාස හා සංඛ්‍යා පාලියෙන් කියයි, ලියයි.<br>• කර්තෘකාරක වාක්‍යයක මූලික ලක්‍ෂණ දක්වයි.<br>• කර්මකාරක වාක්‍යයක මූලික ලක්‍ෂණ දක්වයි.<br>• කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයෙන් ලියා දක්වයි.<br>• කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයෙන් ලියා දක්වයි. | 12 |
| 5.0 නිවැරදි වියරණ විධි සහිතව පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 5.0<br>5.1 සරල පාලි ඡේද රීත්‍යනුකූලව මාධ්‍ය භාෂාවට නගයි.<br>5.2 මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගයි.<br>5.3 කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් පාලි භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් නගයි. | 5.0<br>• සරල පාලි ඡේද<br>• මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය<br>• කර්තෘ, කාරක වාක්‍ය<br>• කර්ම, කාරක වාක්‍ය | 5.0<br>• සරල පාලි ඡේද මාධ්‍ය භාෂාවෙන් ලියයි.<br>• මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවෙන් ලියයි.<br>• කර්තෘකාරක හා කර්මකාරක සරල වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.<br>• මාධ්‍ය භාෂාගත කර්තෘකාරක සරල වාක්‍ය පාලි භාෂාවට නගා ලියයි. | 16 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි. | 6.0<br>6.1 බාලාවතාරයේ නිර්දිෂ්ට කොටස් වාචෝද්ගත කරයි.<br>6.2 ආඛ්‍යාත වරනැගිල්ල වාචෝද්ගත කරයි.<br>6.3 ධාතුමඤ්ජුසාව වාචෝද්ගත කරයි.<br>6.4 නිර්දිෂ්ට සූත්‍ර ගණසජ්ඣායනය කරයි. | 6.0<br>• වරනැගීම හා වාචෝද්ගත කිරීම<br>  • බාලාවතාර නාම හා සමාස කාණ්ඩ<br>• ආඛ්‍යාත වරනැගිල්ල<br>• ධාතුමඤ්ජුසාව - 1, 2, 3, 4, 85, 86, 87, 97, 98, 99, 102, 103, 104, 105, 106, 119, 129 යන ගාථා<br>• ගණසජ්ඣායනය<br>  • ධම්මචක්කප්පවත්තන සූත්‍රය | 6.0<br>• බාලාවතාරය නාම හා සමාස කාණ්ඩවලට අයත් සූත්‍ර හා වෘත්ති මතකයෙන් කියයි, ලියයි.<br>• ආඛ්‍යාත වරනැගිල්ලේ නියමිත කොටස් මතකයෙන් ලියා දක්වයි.<br>• ධාතුමඤ්ජුසාවේ නියමිත කොටස් මතකයෙන් ලියයි.<br>• ධම්මචක්කප්පවත්තන සූත්‍රය ගණසජ්ඣායනා කරයි. | 25 |
| 7.0 පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි. | 7.0<br>7.1 සන්ධි යනු මොනවා දැයි හඳුන්වා සන්ධි ප්‍රභේද නම් කරයි.<br>7.2 සන්ධි ප්‍රභේදවල ලක්ෂණ පෙන්වා දෙයි.<br>7.3 සන්ධි විධි යොදා ගනිමින් ඒ ඒ සන්ධි ප්‍රභේදය විස්තර කරයි. | 7.0<br>• සන්ධි විධි සන්ධි ප්‍රයෝජන<br>• ස්වර සන්ධි<br>• ව්‍යඤ්ජන සන්ධි<br>• නිග්ගහීත සන්ධි | 7.0<br>• සන්ධි යනු මොනවා දැයි හඳුන්වයි.<br>• සන්ධි ප්‍රභේද ලියයි.<br>• ඒ ඒ සන්ධියේ මූලික ලක්ෂණ පෙන්වයි.<br>• ඒ ඒ සන්ධි ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>• සන්ධි විධි යොදා ගනිමින් විසන්ධි පද සන්ධි කරයි.<br>• සන්ධි පද විසන්ධි කොට දක්වයි.<br>• සන්ධි පදයක් කිනම් සන්ධි ප්‍රභේදයකට අයත් දැයි ලියයි. | 10 |
| 8.0 පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිත කරයි. | 8.0<br>8.1 සමාස යනු මොනවාදැයි හඳුන්වයි.<br>8.2 සමාස ප්‍රයෝජන ලියයි.<br>8.3 සමාස ප්‍රභේද දක්වයි. | 8.0<br>• සමාස හැඳින්වීම<br>• සමාස ප්‍රයෝජන<br>• සමාස ප්‍රභේද<br>• සමාස පද සාධනය | 8.0<br>• සමාස පදයක ලක්ෂණ පෙන්වයි.<br>• සමාස ප්‍රභේද නම් කරයි.<br>• ඒ ඒ සමාස ප්‍රභේදය සඳහා නිදසුන් දක්වයි.<br>• සමාස පද සකසා ගන්නා අයුරු පෙන්වයි.<br>• සමාස ප්‍රයෝජන ලියයි. | 07 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.4 ඒ ඒ සමාස ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>8.5 සමාසවල පද සාධනය පැහැදිලි කරයි. | | | |
| 9.0 පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි. | 9.0<br>9.1 තද්ධිත පිළිබඳ හඳුන්වා තද්ධිත ප්‍රභේද නම් කරයි.<br>9.2 තද්ධිත ප්‍රභේද විස්තර කර ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>9.3 තද්ධිත පදවල ප්‍රභේද නම් කරයි. | 9.0<br>• තද්ධිත හැඳින්වීම<br>• තද්ධිත ප්‍රයෝජන<br>• තද්ධිත ප්‍රභේද<br>• තද්ධිත පද සාධනය | 9.0<br>• තද්ධිත නාමයක් යනු කුමක්දැයි පැහැදිලි කරයි.<br>• තද්ධිත ප්‍රභේද නම් කරයි.<br>• ඒ ඒ තද්ධිත ප්‍රභේද නිදසුන් මගින් පැහැදිලි කරයි.<br>• දෙනු ලබන තද්ධිත පදවල ප්‍රභේද නම් කරයි.<br>• තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය පෙන්වයි.<br>• නාමයකට තද්ධිත ප්‍රත්‍යයක් එක්කොට තද්ධිත නාමයක් සාදයි. | 07 |
| 10.0 පාලි භාෂාවේ කිතක හඳුනාගෙන භාවිත කරයි. | 10.0<br>10.1 කිතක පද භාවිතය පෙන්වා දෙයි.<br>10.2 කිතක හඳුන්වා ප්‍රභේද නම් කරයි.<br>10.3 කිතක ප්‍රභේදවලට නිදසුන් සපයයි. | 10.0<br>• කිතක නාම<br>• කිතක ආඛ්‍යාත<br>• කිත් ප්‍රත්‍යය<br>• කිතක<br>• තෛකාලික කිතක | 10.0<br>• කිතක යනු මොනවා දැයි හඳුන්වයි.<br>• නාමපද වශයෙන් කිතක යෙදෙන අයුරු දක්වයි.<br>• ක්‍රියාපද වශයෙන් කිතක යෙදෙන අයුරු දක්වයි.<br>• කිතක ප්‍රභේද නම් කරයි.<br>• ඒ ඒ කිතක ප්‍රභේදයට නිදසුන් සපයයි.<br>• විවිධ ධාතු යොදා ගනිමින් කිතක පද සකස් කරයි.<br>• නිර්දිෂ්ට පාඨවල ඇති කිතක පද උපුටා දක්වයි. | 07 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - පාලි භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි. | 11.0<br>11.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>11.2 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>11.3 නිර්දිෂ්ට කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි.<br>11.4 නිර්දිෂ්ට පාඨවල ඇති වටිනාකම් ප්‍රකාශ කරයි. | 11.0<br>• මහාවංසය - 6 පරිච්ඡේදය<br>  • විජයාගමනං<br>• පාලි පාඨාවලී 1 සිට 10 කථා<br>  • මච්ඡරී බ්‍රාහ්මණො<br>  • අකාරුණිකො වෙජ්ජො<br>  • බුද්ධුපට්ඨාකා ද්වෙ තිරච්ඡානා<br>  • උප්පාතිකො සුනඛො<br>  • කතඤ්ඤූ සිගාලො<br>  • කතවේදී සුනඛො<br>  • නකුලඋපාසකස්ස වත්ථු<br>  • අඤ්ඤෙසං කතො අනත්ථො අත්තනො උපරි පතිස්සති<br>  • මුඛරභාවස්ස දොසො<br>  • පණ්ඩිත අතිපණ්ඩිත වාණිජා | 11.0<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස්වල අර්ථය පහදයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය රස වින්දනයේ යෙදෙයි.<br>• පාලි පාඨ මාධ්‍ය භාෂාවට නගයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍යවල සාරධර්ම චරිතායනය කරයි.<br>• නියමිත කතාවස්තු කෙටියෙන් කියයි. | 32 |

## නිර්දිෂ්ට ග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ

- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල
- චතුභාණවාර පාළි
- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි ව්‍යාකරණය හා රචනා
- පාලි රචනා 1 - බද්දේගම විමලවංස හිමි
- පාලි භාෂාවතරණය 1 සහ 11
- පාලි පාඨ මඤ්ජරී 1 සහ 11
- පාලි කථාමඤ්ජුසා
- ධම්මපදය
- කච්චායන ධාතු මඤ්ජුසාව
- අභිදානප්පදීපිකාව
- පාලි රචනා 1 සහ 11
- බාලාවතාරදීපනී
- පාලි සාහිත්‍යය
- උදාන පාළි
- ධම්මපදට්ඨ කතා
- අපදාන පාළි
- මහා වංසය
- පාලි පාඨාවලී
- පාලි භාෂාව පිරිවෙන් පෙළපොත්
- පාලි පාඨ මඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් පාලි භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් පාලි භාෂාවෙන් ලබා ගත හැකි ය.

දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වේ.

01. පාලි භාෂා දින සුවිශේෂ වැඩ සටහන් සංවිධානය කිරීම
02. කණ්ඩායම් සංවාද හා කෙටි නාට්‍ය නිර්මාණය
03. ගාථා හා සූත්‍ර ගායනා තරග සංවිධානය කිරීම
04. පාලි කථික තරග සංවිධානය කිරීම
05. බිත්ති පුවත්පතක් ක්‍රියාත්මක කිරීම
06. රාජ්‍ය ආයතන, පාසල් ආදියේ භාවිත උපදෙස් පාඨ රැස් කිරීම
07. පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ගවේෂණාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම
08. පාලි සමිතියක් ක්‍රියාත්මක කිරීම

## ඇගැයීම් හා තක්සේරු කාර්යය

**පාසල පදනම් කරගත් ඇගයීම්** වැඩපිළිවෙළ පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

පාලි භාෂාව පිළිබඳ මූලික පිරිවෙන් අවසාන නව විෂය නිර්දේශය සකස් කොට ඇත්තේ නිපුණතා පාදක කර ගෙනය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රමුඛ ස්ථානයක් ගනී. අද වන විට විශේෂයෙන් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් වී ඇත්තේ දේශන ක්‍රමය කේන්ද්‍ර කර ගත් සම්ප්‍රේෂණ භූමිකාවක ගුරුවරයා සිටින ආකාරයෙනි. එහෙත් නව නිපුණතා පාදක අධ්‍යාපනයේ දී පැරණි සම්ප්‍රේෂණ භූමිකාව හැරදමා ගුරුවරයා සිසුන් ගවේෂණයට යොමු කරන මාර්ගෝපදේශකයෙකු විය යුතු ය. මෙහි දී පාලි භාෂාවේ සුවිශේෂ අධ්‍යාපන ක්‍රම හා නවීන ක්‍රම ශිල්ප කිහිපයක් යොදාගත හැකි ආකාරය පිළිබඳ කෙටියෙන් සඳහන් කරමු.

බුදුරජාණන් වහන්සේ මාර්ග දර්ශකයාණෝ ය. ගුරුවරයා විසින් පාලි භාෂාව ඉගැන්විමේ දී බුදුරදුන් අනුගමනය කළ ක්‍රමවේදය උපයෝග කර ගැනීම වඩාත් සුදුසු ය. එබැවින් නූතන ගුරුවරයා මනෝ මූලික හා විෂය මූලික සාධක ඔස්සේ පූර්ව විනිශ්චවලට නොඑළඹ ශිෂ්‍යයා ගවේෂකයෙකු හා නවෝත්පාදකයෙකු කිරීමට මාර්ගෝපදේශ සැපයීම මැනවි.

**1 ක්‍රමය**

**'සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං' (මහාවග්ගපාළි)**

| | | |
|---|---|---|
| ආදිකල්‍යාණං | - | පාඩමක ආරම්භය ශිෂ්‍යයා පොළඹවන, සිත්ගන්නාසුලු චමත්කාරජනක අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් විය යුතු ය. |
| මජ්ඣෙ කල්‍යාණං | - | පාඩමෙහි මැද සාරවත් කරුණු අන්තර්ගත විය යුතුවා සේම පැහැදිලි හා නිරවුල් ද විය යුතු ය. තව දුරටත් ශිෂ්‍යයා මාතෘකාවට පොළඹවන, ගවේෂකයෙකු කරවන ක්‍රියාවලියක් විය යුතු ය. |
| පරියොසානකල්‍යාණං | - | පාඩමේ අවසානය ශිෂ්‍යයා ප්‍රාප්ති මට්ටමකට පමුණුවා ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීමට සමත් විය යුතු ය. |
| සාත්ථං | - | පාඩම සරල සුගම හා අර්ථවත් කරුණුවලින් සමන්විත විය යුතු ය. |
| සබ්‍යඤ්ජනං | - | යොදා ගන්නා වාග්මාලාව අරුත් ප්‍රකට කරවන අදහස් නිවැරදිව සන්නිවේදනය කරවන්නක් විය යුතු ය. |
| පරිසුද්ධං | - | පාඩම අසභ්‍ය හා ග්‍රාම්‍ය ව්‍යවහාරයෙන් තොර විය යුතුය. |
| කේවලපරිපුණ්ණං | - | පාඩම ඌනතාවලින් තොරව භාෂණය, ලේඛනය, චින්තනය, චරිතායනය කර ගැනීමට හැකිවන අංගයන්ගෙන් සමුපලක්ෂිත විය යුතු ය. |

මෙම ලක්ෂණවලින් යුතුව පාඩමක් මෙහෙයවීමෙන් ශිෂ්‍යයා නිපුණතාවට ළංවන අතර ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ද ඇති කළ හැකි ය.

**2 ක්‍රමය**

**ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානිකම්මං (සච්චවිභංග සුත්ත - මජ්ඣිමනිකාය)**

| | | |
|---|---|---|
| ආචික්ඛනා | - | පාඩමට අදාළව අපේක්ෂිත කරුණු කෙටියෙන් කීම |
| දෙසනා | - | උචිත භාෂාව යොදා ගනිමින් කෙටියෙන් කී කරුණු ගුරුවරයා කෙරෙහි ප්‍රාමාණික විශ්වාසයක් ඇති වන පරිදි ධර්මානුකූලව විස්තර කිරීම |
| පඤ්ඤපනා | - | ශිෂ්‍යයාගේ බුද්ධියට හා ප්‍රඥාවට යෝග්‍ය ලෙස කරුණු පෙළ ගැස්වීම |
| පට්ඨපනා | - | අපේක්ෂිත අරමුණෙහි ශිෂ්‍යයා පිහිටුවීම |
| විවරණා | - | වසා තිබූවක් විවෘත කරන්නාක් සේ හේතුඵලවාදී ව කරුණු විවරණය කිරීම |
| විභජනා | - | කරුණු විශ්ලේෂණය කොට කුඩා අනුකුඩා කොටස්වලට බෙදා විග්‍රහ කිරීම |
| උත්තානිකම්මං | - | සංයුක්ත සංකල්ප නිදසුන් වශයෙන් ගෙනහැර දක්වමින් ශ්‍රාවක බුද්ධියට ගෝචරවන ලෙස මතුකර දැක්වීම හා ශිෂ්‍යයා ගැටලුවෙන් නිදහස් කිරීම |

3 ක්‍රමය

**ශිෂ්‍යයාගේ අවබෝධය දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමය අනුපූර්ව ප්‍රතිපදාවයි.**

ශිෂ්‍යයාට අලුත් අත්දකීම් ලබා දෙන විට එය ඔහුගේ අතීත අත්දකීම්වලට සම්බන්ධ දෙයක්වීම වැදගත් වේ. ශිෂ්‍යයා ආස්වාදිත දෙයෙහි සිට නොදන්නා සත්‍යය කරා යොමු කරවීම මෙම අධ්‍යාපන ක්‍රමයේ පිළිවෙළයි.

| | | |
|---|---|---|
| සද්ධාජාතො උපසංකමති | - | ශ්‍රද්ධාව ඇතිකර ගැනීමයි. එසේ ගුරුවරයා කෙරේ ශිෂ්‍යයාගේ විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරුවරයා වෙත එළඹෙයි. |
| පයිරුපාසති | - | විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරු ඇසුර ලැබීමට ප්‍රිය කරයි. |
| සොතං ඔදහති | - | පාඩමට සාවධාන ව හා අවික්ෂිප්ත ව ඇහුම්කන් දෙයි. |
| සුත්වා ධාරෙති | - | ඇසූ පාඩම සිතේ දරා ගනියි. |
| අත්ථං උපපරික්ඛති | - | දරාගත් කරුණුවල අර්ථය නුවණින් පරීක්ෂා කර බලයි. |
| ධම්මා නිජ්ඣානං ඛමන්ති | - | කරුණු නුවණින් සලකා බලා වටහා ගනියි. |
| ඡන්දො ජායති | - | කරුණු වටහා ගැනීම නිසා ගුරුවරයාගේ පාඩමට රුචියක් ඇති වෙයි. |
| උස්සහති | - | පාඩමේ කරුණුවල ප්‍රාප්ති මට්ටමට ළඟාවීමට උත්සාහ කරයි. |
| තුලෙති | - | වෙනත් කරුණු හා තුලනය කර බලයි. |
| පදහති | - | සංසන්දනය කොට නිපුණතා මට්ටමට යාමට වීර්ය කරයි. |
| සච්චං සච්ඡිකරොති | - | සත්‍ය වූ තත්ත්වය අවබෝධ සාක්ෂාත් කර ගනියි. |
| පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති | - | නුවණින් ද එය විනිවිද දකී. (කීටාගිරි සූත්ත - මජ්ඣිමනිකාය) |

සරල අවස්ථාවේ සිට අනුක්‍රමයෙන් ගැඹුරට යන ආකාරයේ පිළිවෙළක් මෙහි දක්නට ඇත. පාලි භාෂාව විෂයෙහි ශිෂ්‍ය නිපුණතාව ඇති කිරීමේ දී මෙම ඉගැන්වීම් ක්‍රම උපයෝග කර ගත හැකි ය. මෙබඳු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම රාශියක් පාලි සාහිත්‍යයේ අඩංගු ය.

පාලි භාෂාවේ නව විෂය නිර්දේශය ඉගැන්වීමට සරල සුගම ක්‍රමවේදයක් මෙහිලා දක්වමු. (ආශ්‍රය - පාලි භාෂාව 9 - 10 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1984)

i. පියවර - නිර්දිෂ්ට පාලි පාඨ හා ඡේද උස් හඬින් ගුරුවරයා විසින් කියවීම, පාලි විෂයේ ආරම්භක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම භාෂාව කනට හුරු කරවීම මෙයින් අපේක්ෂා කෙරේ. පාලි භාෂා ව්‍යවහාරය දරුවන්ගේ ඇසට, කනට හුරු කරවීමට මෙම ක්‍රමය යෝග්‍ය වේ.

ii. පියවර - අනතුරුව ගුරුවරයා විසින් කළ යුත්තේ එකී කොටස අර්ථවත් ලෙස භාවාර්ථ පැහැදිලි වන පරිදි ඉදිරිපත් කිරීමයි. එමඟින් පාලි භාෂා ව්‍යවහාරය හා රීතිය ශිෂ්‍යයාගේ ඉන්ද්‍රියයන්ට හුරුවනු ඇත.

iii. පියවර - කාලවේලාව අනුව පාලි උද්ධෘතය ශිෂ්‍යයන් ලවා සාමූහික ව හෝ වෙන් වෙන් වශයෙන් හෝ නිවැරදි උච්චාරණය සහිත ව කියවීම ප්‍රයොජනවත් ය.

iv. පියවර - පාලි උද්ධෘතයන්හි අර්ථය අවබෝධ කර ගැනීමට ගුරුවරයා සිසුන්ට උදව් කළ යුතු ය.

v. පියවර - උද්ධෘත ඡේදවල වාක්‍ය හා වාක්‍යාංශ හුණුපුවරුවේ ලියා එම යෙදුම් රටාව ශිෂ්‍යයාට පැහැදිලි කළ යුතු ය.

vi. පියවර - උද්ධෘත ඡේදවල ඇතුළත් පද හා වාක්‍යවල ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි කළ යුතු ය. මෙය සරල ක්‍රමවේදවලින් පටන් ගෙන සංකීර්ණ ක්‍රම දක්වා වැඩි කිරීම සුදුසු ය.

vii. පියවර - වැදගත් ගාථා හා ඡේද වනපොත් කිරීමේ අවශ්‍යතාව ශිෂ්‍යයන්ට ඒත්තු ගැන්වීම අවශ්‍ය වෙයි.

මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම මගින් ශිෂ්‍යයන් අපේක්ෂිත නිපුණතා මට්ටමට ළඟාවනු ඇත. සිසුන් කරුණු හා තොරතුරු ගවේෂණයට යොමු කළ යුතු ය. ගවේෂිත කරුණු අධීක්ෂණය ගුරුවරයා විසින් කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පන්ති කාමරයට පමණක් සීමා නොකොට බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ද යොමු කිරීම ගුරුවරයාගේ යුතුකමකි. සිසු දරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරතුරු අවධානයෙන් සිටීමෙන් ඇගයීම හා තක්සේරුව ද විනිවිදභාවයකින් යුතුව කිරීමට ගුරුවරයාට ඉඩකඩ සැලසේ. මෙම නව විෂයමාලා සංශෝධනයේ අපේක්ෂාව ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර වූ සම්ප්‍රේෂණ අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කර ක්‍රියාකාරී ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයකට යොමු කිරීම හා එමගින් සිසුන්ගේ නිපුණතාව ඉහළ නංවා සමාජයට රටට යෝග්‍ය පුරවැසියන් බිහි කිරීමයි.

# පාඩම 1 - පාලි අක්ෂරමාලාව

**නිපුණතාව** : 1.0 පාලි අක්ෂරමාලාව ප්‍රභේදගත කර භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 පාලි අක්ෂරමාලාව ප්‍රභේද කර ලියයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :
- පාලි අක්ෂරමාලාව නිවැරදි ව පිළිවෙළින් ලියයි.
- පාලි අක්ෂරමාලාව නිවැරදි ව කියවයි.
- පාලි අක්ෂරමාලාවේ ප්‍රභේද ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ශිෂ්‍යයන් කිහිප දෙනෙකුට පාලි අක්ෂරමාලාව මතකයෙන් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- පෙළපොතේ ඇති පාලි අක්ෂරමාලාව ප්‍රදර්ශනය කරමින් පෙර දැනුම තහවුරු කර ගැනීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 01**
- ඇමුණුම 01 හි පරිදි අක්ෂර මාලාවේ ප්‍රභේද ඇතුළත් චාට් සටහන පන්තියට ඉදිරිපත් කරන්න.
- පාලි ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව වර්ණමාලාව සංඛ්‍යාත්මකව වෙනස් වන බව පෙන්වා දෙන්න.
- අප මෙහි දී අවධානය යොමු කරන්නේ කච්චායන සහ මොග්ගල්ලායන සම්ප්‍රදාය දෙක කෙරෙහි පමණක් බවට සිසුන් දැනුවත් කරන්න.
- කච්චායන සම්ප්‍රදායේ අක්ෂර 41ක් බව පෙන්වා දෙන්න.
- මොග්ගල්ලායන සම්ප්‍රදායෙහි ඒ, ඕ යන අක්ෂර ද සමග ස්වර 10 ක් බව පෙන්වා දෙන්න.
- දැනට බහුලව භාවිත ව්‍යාකරණ සම්ප්‍රදාය වන්නේ කච්චායන සම්ප්‍රදාය බව පෙන්වා දෙන්න.
- කච්චායන සම්ප්‍රදායේ වර්ණ මාලාව සිසුන් සමග හඬනගා කියවන්න.

**පියවර 02**
- ස්වරවල ප්‍රභේද හඳුන්වා, ඒ ඒ ප්‍රභේදවලට අයත් අක්ෂර ලියා දක්වන්න.
- ව්‍යඤ්ජනවල ප්‍රභේද හඳුන්වා, ඒ ඒ ප්‍රභේදවලට අයත් අක්ෂර ලියා දක්වන්න.
- වර්ණ මාලාවේ ස්වර හා ව්‍යඤ්ජන ප්‍රභේද නිවැරදිව මතකයෙන් කියවීමටත්, ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට අදාළ අක්ෂර මාලාව ඇමුණුම 02 හි වගුව ඇසුරු කර ගනිමින් හුණු පුවරුවේ මතකයෙන් ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 03 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප**
- **අක්ෂර** - අක්ෂර යනු භාෂාවක් ලිවීමට හා කියවීමට යොදා ගනු ලබන සංකේත
- **ස්වර** - තනි ව උච්චාරණය කළ හැකි අක්ෂර හෙවත් ප්‍රාණාක්ෂර
- **දීර්ඝ** - උච්චාරණයේ දී මාත්‍රා දෙකක කාලයක් ගත වන අක්ෂර

- **හ්‍රස්ව** - උච්චාරණයේ දී එක් මාත්‍රාවක කාලයක් ගත වන අක්‍ෂර
- **ව්‍යඤ්ජන** - ගාත්‍රාක්‍ෂර යි. තනි ව උච්චාරණය කළ නො හැකිය.
  ස්වරයක උපකාරය අවශ්‍ය වේ.
- **අඝෝෂ** - **'වග්ගානං පඨමදුතියා සොවාසොසා'**
  වර්ගාක්ෂරවල පළමු වන, දෙවන අක්‍ෂර හා 'ස' අක්‍ෂරය
- **ඝෝෂ** - **'ළන්තාඤ්ඤෙ ඝොසා'**
  'ළ' අක්‍ෂරය අවසන් කොට ඇති සෙසු ව්‍යඤ්ජන අක්‍ෂර
- **අල්පප්‍රාණ** - වර්ගාක්ෂරවල පළමු වන සහ තෙවන අක්ෂර යි.
  උච්චාරණයේ දී අඩු උත්සාහයක් ගනී.
- **මහප්‍රාණ** - වර්ගාක්ෂරවල දෙවන සහ සිව්වන අක්ෂර යි.
  උච්චාරණයේ දී වැඩි උත්සාහයක් ගනී.

## ඇගයීම හා තක්සේරුකරණය :

- පාලි ව්‍යාකරණ සම්ප්‍රදායවල ඇති අක්ෂර වෙන වෙනම ලියා දැක්වීම
- කච්චායන සම්ප්‍රදායේ පාලි වර්ණ මාලාව පිළිවෙළින් ලියා දැක්වීම
- ස්වර ප්‍රභේද දක්වා එම ප්‍රභේදවලට අයත් අක්ෂර ලියා දැක්වීම
- ව්‍යඤ්ජන ප්‍රභේද දක්වා එම ප්‍රභේදවලට අයත් අක්ෂර ලියා දැක්වීම
- ඝෝෂ-අඝෝෂ, අල්පප්‍රාණ-මහප්‍රාණ අක්‍ෂර නිසි ලෙස උච්චාරණය කිරීම
- අක්ෂර මාලවේ ප්‍රභේද වගුගත කොට දැක්වීම

## ගුණාත්මක යෙදවුම් :


- ඇමුණුම 01 හා 02
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි ව්‍යාකරණ - පල්ලත්තර සුමනජෝති හිමි
- පාලි ව්‍යාකරණ විවරණය - මයිලැවේ සිරිනිවාස හිමි
- පාලි භාෂාව හා රචනය - පැණිහෙල සිරිසම්බෝධි හිමි

ඇමුණුම 1

| | | | |
|---|---|---|---|
| ස්වර අක්ෂර | හ්‍රස්ව 3 | අ ඉ උ | ලහුමත්තා තයො රස්සා |
| | දීර්ඝ 5 | ආ ඊ ඌ එ ඔ | අඤ්ඤෙ දීඝා |



**ඇමුණුම 02**

| අක්ෂරමාලාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ස්වර | | ව්‍යඤ්ජන | | | | | | |
| හ්‍රස්ව | දීර්ඝ | වර්ගාක්ෂර | අල්පප්‍රාණ | මහප්‍රාණ | වර්ගාන්ත | ඝෝෂ | අඝෝෂ | ඊෂත්පෘෂ්ට |
| | | | | | | | | |

**ඇමුණුම 03**

01. පාලි අක්ෂරමාලාව පිළිවෙළින් ලියා දක්වන්න.

02. අක්ෂරමාලාවේ ප්‍රභේද ඉස්මතු වන සේ වගුවක් සකස් කරන්න.

03. කච්චායන හා මොග්ගල්ලායන සම්ප්‍රදායවල අක්ෂරමාලාවේ දක්නට ලැබෙන වෙනස්කම් පෙන්වා දෙන්න.

04. '**බින්දුචූලාමනාකාරෝ**' යන ගාථාව සම්පූර්ණ කොට අර්ථය ද සහිතව ලියන්න.

05. '**වග්ගානං පඨමදුතියා ඝොචාඝොසා**' මෙම සූත්‍රයට අදාළ අක්ෂර පෙන්වා දෙන්න.

# පාඩම 2 - අක්‍ෂර උත්පත්තිස්ථාන

**නිපුණතාව** : 1.0 පාලි අක්‍ෂරමාලාව ප්‍රභේදගත කර භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 අක්ෂර උත්පත්තිස්ථාන හඳුන්වා ඊට අයත් අකුරු ලියයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- අක්ෂර උත්පත්තිස්ථාන නම් කරයි.
- ඒ ඒ ස්ථානයෙන් උපදින අකුරු ලියා වගුගත කරයි.
- බාලාවතාර සූත්‍රානුසාරයෙන් අක්ෂර උත්පත්තිස්ථාන පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයː**

- පහත සඳහන් උද්ධෘතය හුණු පුවරුවේ ලියා දක්වන්න.

  **අකවග්ගහා - කණ්ඨජා**

  **ඉචවග්ගයා - තාලුජා**

  **ටවග්ගරළා - මුද්ධජා**

  **තවග්ගලසා - දන්තජා**
- එය සජ්ඣායනය කිරීමට සිසුන් මෙහෙයවන්න.
- උච්චාරණ ඉන්ද්‍රිය ආධාරයෙන් අකුරක් උපදින ආකාරය ඉහත උද්ධෘතය ඇසුරින් පහදා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනයː**

**පියවර 01**

- පෙළපොතෙහි එන වගුව සහ ඇමුණුම 01 ඇසුරින් පාලි වර්ණ මාලාව අක්ෂර උත්පත්තිස්ථාන අනුව වෙන්කර ඇති ආකාරය තහවුරු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- උත්පත්තිස්ථානය හැඟවෙන පරිදි සිසුන් සමග අක්ෂර ශබ්දනගා උච්චාරණය කරන්න.
- උත්පත්තිස්ථාන නම් කර ඒවාට අයත් අක්ෂර ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- වර්ණ මාලාව අක්ෂර උත්පත්තිස්ථාන සහිතව මතකයෙන් හුණු පුවරුවේ ලියවන්න.
- උත්පත්තිස්ථානය කියූ විට අක්ෂර ලිවීමටත්, අක්ෂර කියූ විට උත්පත්ති ස්ථානය ලිවීමටත් සිසුන් හුරු කරන්න.

**පියවර 02**

- පෙළපොතේ අදාළ පාඩමෙහි අඩංගු වගුවේ දැක්වෙන බාලාවතාර සූත්‍ර සිසුන් ලවා හඬනගා උච්චාරණය කරවන්න.
- උත්පත්තිස්ථාන ලියා ඊට අයත් බාලාවතාර සූත්‍ර පාඨ අභ්‍යාස පොතේ ලිවීමට සිසුන් මෙහෙයවන්න.
- උත්පත්තිස්ථාන දැක්වෙන බාලාවතාර සූත්‍ර පාඨ වාචෝද්ගත කරවන්න.
- බාලාවතාර සූත්‍ර පාඨය ඉදිරියේ, උත්පත්ති ස්ථානයට අයත් අක්ෂර ලියා දැක්වීමට සිසුන් හුරු කරන්න.
- උත්පත්තිස්ථාන සහිතව වර්ණ මාලාව වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- බාලාවතාර සූත්‍රානුසාරයෙන් අක්ෂර උත්පත්තිස්ථාන මතකයෙන් කීමට හා ලිවීමට සිසුන් යොමු කරන්න.

- කිසියම් නිර්මාණාත්මක ක්‍රමවේදයක් ඔස්සේ අක්ෂර උත්පත්තිස්ථාන, අක්ෂර හා බාලාවතාර සූත්‍ර පාඨ යොදා පෝස්ටරයක් නිර්මාණය කර පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඇමුණුම 02 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්ප

- **කණ්ඨ** - උගුර
- **තාලු** - තල්ල
- **මුද්ධ** - තල්ලේ මුදුන
- **දන්ත** - දත්
- **ඔට්ඨ** - තොල්
- **කණ්ඨතාලු** - උගුර හා තල්ල
- **කණ්ඨ ඔට්ඨ (කණ්ඨොට්ඨ)** - උගුර හා තොල්
- **දන්ත ඔට්ඨ (දන්තොට්ඨ)** - දත් හා තොල්

## ඇගයීම හා තක්සේරුකරණය :

- අක්ෂර උත්පත්තිස්ථාන නම් කිරීම
- ඒ ඒ උත්පත්තිස්ථානයට අයත් අක්ෂර ලියා දැක්වීම
- බාලාවතාර සූත්‍ර පාඨ මතකයෙන් කියවීම
- බාලාවතාර සූත්‍රය සහ අදාළ අක්ෂර උත්පත්තිස්ථානය ගළපාලීම
- උත්පත්තිස්ථාන සහිත පාලි වර්ණ මාලාව නිර්මාණාත්මක ක්‍රමවේදයක් ඔස්සේ පන්තියේ ප්‍රදර්ශනය කිරීම

## ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 01 සහ 02
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි ව්‍යාකරණ - පල්ලත්තර සුමනජෝති හිමි
- පාලි ව්‍යාකරණ විවරණය - මයිලෑවේ සිරිනිවාස හිමි
- පාලි භාෂාව හා රචනය - පැණිහෙල සිරිසම්බෝධි හිමි
- බාලාවතාරය

**ඇමුණුම 01**

| අක්ෂර උපදින ස්ථාන | උපදින අක්ෂර | බාලාවතාර සූත්‍රය |
|---|---|---|
| උගුර - කණ්ඨ | අ ආ ක ඛ ග ඝ ඞ හ | අකවග්ගහා කණ්ඨජා |
| තල්ල - තාලු | ඉ ඊ ච ඡ ජ ඣ ඤ ය | ඉචවග්ගයා තාලුජා |
| තල්ලේ මුදුන - මුද්ධ | ට ඨ ඩ ඪ ණ ර ළ | ටවග්ගරළා මුද්ධජා |
| දත් - දන්ත | ත ථ ද ධ න ල ස | තවග්ගලසා දන්තජා |
| තොල් - ඔට්ඨ | උ ඌ ප ඵ බ භ ම | උපවග්ගා ඔට්ඨජා |
| උගුර හා තල්ල - කණ්ඨතාලු | එ | එකණ්ඨතාලුජො |
| උගුර හා තොල් - කණ්ඨ ඔට්ඨ | ඔ | ඔකණ්ඨොට්ඨජො |
| දත් හා තොල් - දන්ත ඔට්ඨ | ව | වොදන්තොට්ඨජො |

**ඇමුණුම 02**

01. අක්ෂර උත්පත්තිස්ථාන නම් කරන්න.

02. පහත සඳහන් උත්පත්තිස්ථානයන්ට අදාළ අක්ෂර වෙන වෙන ම ලියන්න.
කණ්ඨජ
තාලුජ
මුද්ධජ
දන්තජ
ඔට්ඨජ

03. 'එ, ඔ, ව' යන අකුරු උත්පත්තියේ දී දක්නට ලැබෙන විශේෂතා පෙන්වා දෙන්න.

04. උගුර, තල්ල, මුදුන, දත්, තොල් යනාදි ස්ථානවලින් උපදින අකුරුවලට අදාළ බාලාවතාර සූත්‍ර පාඨ ලියන්න.

# පාඩම 3 - විභක්ත්‍යර්ථ

**නිපුණතාව** : 2.0 පාලි නාම පද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 නාම විභක්තිවල විභක්ත්‍යර්ථ පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නාම විභක්තිරූපවල අර්ථය ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**

- පෙළපොතේ දෙවන පාඩමෙහි සඳහන් **ගුණවන්තු** ශබ්දයේ වරනැගීම හඬනගා කියවීමට සිසුන් යොමු කරන්න.
- නාම වරනැගීම සම්බන්ධ පෙර දැනුම ද උපයෝග කර ගනිමින් නාම වරනැගීම යනු නාමයක් විභක්ති අනුව අර්ථ ගැන්වීම බව සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 01**

- පාලි භාෂාවේ නාම විභක්ති හඳුන්වන්න.
- ඇමුණුම 01 සහ පෙළපොත සැලකිල්ලට ගනිමින් නාම විභක්තිවල විභක්ත්‍යර්ථ කෙටියෙන් සාකච්ඡා කරන්න.
- විභක්ත්‍යර්ථ ප්‍රකාශ වන බාලාවතාර පාඨ හා එහි තේරුම සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- ඇමුණුම 02 හි දැක්වෙන පරිදි මාධ්‍ය භාෂාගත වාක්‍ය පාලියෙහි යෙදෙන ආකාරය පෙන්වා දෙන්න.
- ඇමුණුම 02 හි ප්‍රශ්න ක්‍රමය යොදා ගනිමින් සිසුන් සමඟ විභක්ත්‍යර්ථ පිළිබඳ සාකච්ඡාවක් පවත්වන්න.
- විභක්තිය හා එයින් ප්‍රකාශ වන අර්ථය වගුවක් මගින් හුණු පුවරුවෙහි ලියා දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒ ඒ විභක්තියට නිදසුන් වන පාලි වාක්‍ය සිසුන්ගෙන් විමසන්න.
- සරල සිංහල වැකි කීපයක් දී විභක්ති අර්ථ ප්‍රකාශ වන පරිදි ඒවා පාලියට නැගීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 03 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප**

- **විභක්ති අර්ථ :** කිසියම් විභක්තියක් මගින් ප්‍රකාශ වන මූලික අර්ථ විභක්ත්‍යර්ථ නම් වේ.

**ඇගයීම හා තක්සේරුකරණය:**

- පාලි වාක්‍යයක භාවිත නාමපද කුමන විභක්තියකට අයත්දැයි ප්‍රකාශ කිරීම
- ඒ ඒ විභක්ති යෙදෙන අර්ථ නිදසුන් මගින් ප්‍රකාශ කිරීම
- විභක්ත්‍යර්ථ සැලැකිල්ලට ගනිමින් සරල සිංහල වැකි පාලියට පරිවර්තනය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01, 02 සහ 03
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාම වරනැගිල්ල
- බාලාවතාරය
- පාලි භාෂාවතරණය 1

**ඇමුණුම 01**

පඨමා:

- **ලිඞ්ගත්‍ථෙ පඨමා.** ලිංගාර්ථයෙහි පඨමා විභක්තිය යෙදේ. ශබ්ද ප්‍රකෘතිය පැවසිය යුතු විට පඨමා විභක්තිය යෙදේ. ලිංගාර්ථය යනු කර්ම ආදි වෙනත් විභක්තියකින් නො යෙදී ව්‍යවහාර අර්ථය ලබා දීමයි. ශබ්දකෝෂවල, රචනා මාතෘකාවල සහ දැන්වීම් පුවරු ආදියෙහි මෙය යෙදේ.
  උදා : දෙවො, බුද්ධො, කඤ්ඤා, මාලා, ඵලං
- කර්තෘකාරක වාක්‍යයක උක්ත කර්තෘ යොදනු ලබන්නේ පඨමා විභක්තියෙනි. උක්ත කර්තෘ යනු අවසාන ක්‍රියාවෙන් කියවෙන කර්තෘ පදයයි.
  උදා: <u>මනුස්සො</u> ධාවති.
- කර්මකාරක වාක්‍යයක උක්ත කර්මය යොදනු ලබන්නේ ද පඨමා විභක්තියෙනි. උක්ත කර්මය යනු අවසාන ක්‍රියාවෙන් උක්ත වන කර්ම පදයයි. එවිට අනුක්ත කර්තෘ තතියා විභක්තියෙන් යෙදේ.
  උදා: දාසෙන <u>ඔදනො</u> පච්චතෙ.

ආලපන:

- **අභිමුඛීකරණමාලපනං.** ආමන්ත්‍රණ අර්ථයෙහි ආලපන විභක්තිය යෙදේ.
  උදා: බාලක, අම්ම, දෙව, රාජ
  මෙහි දී අවසාන ක්‍රියාව සඳහා පඤ්චමී විභක්ති ආඛ්‍යාතය යොදා ගනු ලැබේ.

දුතියා:

- **කම්මත්‍ථෙ දුතියා.** වාක්‍යයක කර්මය දුතියා විභක්තියෙන් යෙදේ. කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය කර්මයයි.
  උදා: මනුස්සො <u>ධම්මං</u> සුණාති.

තතියා:

- **කත්තරි තතියා.** යමෙක් ක්‍රියාව කරයි ද, හෙතෙම කර්තෘයි. උක්ත කර්තෘ පඨමාවෙන් යෙදෙන අතර අනුක්ත කර්තෘ තතියා විභක්තියෙන් යෙදේ. කර්මකාරක වාක්‍යවල කර්මය උක්ත වන අතර, කර්තෘ අනුක්ත වේ. ඒ අනුක්ත කර්තෘ තතියා විභක්තියෙන් යෙදේ. එවිට උක්ත කර්මය පඨමා විභක්තියෙන් යෙදේ. උදා: <u>බුද්ධෙන</u> ධම්මො දෙසීයති.

කරණ:

- **කරණෙ තතියා.** කර්තෘගේ ක්‍රියාවට අතිශයින් උපකාරී වන පදය කරණ විභක්තියෙන් යෙදේ.
  උදා: සිස්සො <u>රථෙන</u> ගෙහං ගච්ඡති.

චතුත්‍ථී

- **සම්පදානෙ චතුත්‍ථී.** සම්ප්‍රදාන අර්ථයෙහි චතුත්‍ථී විභක්තිය යෙදේ. සම්ප්‍රදානය යනු යහපත් පිරිනැමීමයි. ඒ පිරිනමන දෙය ලබන්නා චතුත්‍ථී විභක්තියෙන් යෙදේ.
  උදා: දායකො <u>භික්ඛුස්ස</u> දානං දෙති.

පඤ්චමී

- **අපාදානෙ පඤ්චමී.** අපාදාන අර්ථයෙහි පඤ්චමී විභක්තිය යෙදේ. අපාදානය යනු යමකින් යමක් වෙන් වීම හෝ යමකින් යමෙක් බිය වීමයි. එම සීමාව දක්වන පදය පඤ්චමී විභක්තියෙන් යෙදේ.
  උදා: වානරො <u>රුක්ඛග්ගම්හා</u> පතති. මිගො <u>සීහම්හා</u> භායති.

**ඡට්ඨී** • **සාමිස්මිං ඡට්ඨී.** යමෙකුගේ අයිතිය, ස්වාමිත්වය පැවසීම සඳහා ඡට්ඨී විභක්තිය යෙදේ. උදා: බුද්ධස්ස ධම්මං, භික්ඛුස්ස චීවරං

**සත්තමී** • **ඔකාසෙ සත්තමී.** ආධාරය ඔකාස නම් වේ. එම අර්ථයෙහි සත්තමී විභක්තිය යෙදේ. උදා: කුමාරො පීඨෙ නිසීදති. අහං විහාරෙ වසාමි.

## ඇමුණුම 02

- සිංහල වාක්‍යයක් ගත් විට එහි ඇති පද යෙදිය යුත්තේ කුමන විභක්තියෙන්දැයි දැන ගැනීම සඳහා මෙම සරල ප්‍රශ්න ක්‍රමය සිසුන්ට කියා දෙන්න.

**පඨමා:** • කවු ද? මොනව ද?
උදා: ළමයා බත් කයි. කවු ද කන්නෙ?
දාසයා විසින් බත පිසෙයි. මොනව ද පිසෙන්නෙ?

**දුතියා:** • මොනව ද? කොතනට ද?
උදා: ළමයා බත් කයි. මොනව ද කන්නෙ? මම විහාරයට යමි. කොතනට ද යන්නෙ?

**තතියා:** • කවුරුන් විසින් ද?
උදා: දාසයා විසින් බත පිසෙයි. පිසින්නෙ කවුරුන් විසින් ද?

**කරණ:** • කුමක් කරණකොට ද?
උදා: දාසයා පොරවෙන් දර පලයි. දර පලන්නෙ කුමකින් ද?

**චතුත්ථී:** • කාට ද?
උදා: උපාසකයා භික්‍ෂුවට දන් දෙයි. දෙන්නෙ කාට ද?

**පඤ්චමී:** • කොහෙන් ද? කුමකින් ද? කාගෙන් ද?
උදා: ගසෙන් ගෙඩිය වැටෙයි. වැටෙන්නෙ කොහෙන් ද?

**ඡට්ඨී:** • කාගෙ ද? මොකේ ද?
උදා: ගොපල්ලාගේ පුතා ගෙදර යයි. පුතා කාගෙ ද?

**සත්තමී:** • කොහේ ද ?
උදා: කුරුල්ලා ගසෙහි සිටියි. කුරුල්ලා ඉන්නෙ කොහේ ද?

* මෙහි අංකිත කොට ඇති පද ඒ ඒ විභක්තිවලින් යෙදිය යුතුය.
උදා: ළමයා - පඨමා විභක්ති ඒකවචන (බාලකො)

## ඇමුණුම 03

**නියමිත ශබ්ද නාමපද ලෙස වාක්‍යවල යොදන්න.**

| | | |
|---|---|---|
| ........................................ ගාමං ගච්ඡති.<br>(ගුණවතා ගමට යයි) | - | ........................................ ගාමෙ ගච්ඡන්ති.<br>(ගුණවත්තු ගම්වලට යති) |
| ........................................ නගරෙ වසති.<br>(ධනවතා නගරයෙහි වසයි) | - | ........................................ නගරෙසු වසන්ති.<br>(ධනවත්තු නගරවල වසති) |

.............................................. පඤ්චසීලං රක්ඛති. - ..................................... පඤ්චසීලං රක්ඛන්ති.
(සිල්වතා පඤ්චශීලය රකියි) (සිල්වත්තු පඤ්චශීලය රකිති)

.............................................. ඔදනං භුඤ්ජති. - .............................................. ඔදනං භුඤ්ජන්ති.
(ගුණැත්තිය ආහාර අනුභව කරයි) - (ගුණැත්තියෝ ආහාර අනුභව කරති)

.............................................. ලෙඛනං ලිඛති. - .............................................. ලෙඛනෙ ලිඛන්ති.
(ලේඛිකාව ලිපියක් ලියයි) (ලේඛිකාවෝ ලිපි ලියති)

**නියමිත ශබ්ද විශේෂණපද ලෙස යොදා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.**

.............................................. මනුස්සො ගාමං ගච්ඡති. - ...................................මනුස්සා ගාමෙ ගච්ඡන්ති.
(ගුණවත් මිනිසා ගමට යයි) (ගුණවත් මිනිස්සු ගම්වලට යති)

.............................................. රාජා නගරෙ වසති. - .............................රාජානො නගරෙසු වසන්ති.
(ධනවත් රජ නගරයෙහි වසයි) (ධනවත් රජවරු නගරවල වසති)

..................................උපාසකො පඤ්චසීලං රක්ඛති. - ..................... උපාසකා පඤ්චසීලං රක්ඛන්ති.
(සිල්වත් උපාසකයා පඤ්චශීලය රකියි) (සිල්වත් උපාසකවරු පඤ්චශීලය රකිති)

.............................................කඤ්ඤා ඔදනං භුඤ්ජති. - ....................කඤ්ඤායො ඔදනං භුඤ්ජන්ති.
(ගුණවත් කන්‍යාව ආහාර අනුභව කරයි) - (ගුණවත් කන්‍යාවෝ ආහාර අනුභව කරති)

.............................................වනිතා ලෙඛනං ලිඛති. - ....................... වනිතායො ලෙඛනෙ ලිඛන්ති.
(ලියන ස්ත්‍රිය ලිපියක් ලියයි.) (ලියන ස්ත්‍රීහු ලිපි ලියති)

# පාඩම 4 - සර්වනාම

**නිපුණතාව** : 2.0 පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.2 නාම විශේෂණපද ලෙස නාම පද භාවිත කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නියමිත ශබ්ද නාමපද ලෙස වාක්‍යවල යොදයි.
- නියමිත සර්වනාම ශබ්ද විශේෂණපද ලෙස භාවිත කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයः**

- තමා දන්නා සර්වනාමපද කිහිපයක් හුණුපුවරුවේ ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ පෙර දැනුම විමසා **ත, එත, ඉම** සහ **කිං** යන සර්වනාම හඳුන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එම සර්වනාම යොදා වාක්‍ය නිර්මාණය කරවන්න.
- භාෂාවක සුමට බව, ලාලිත්‍යය සහ සුබෝච්චාරණය සඳහා සර්වනාමවල දායකත්වය පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනයः**

**පියවර 01**

- පෙළපොත කෙරෙහි අවධානය යොමු කරමින් නාමයක හා සර්වනාමයක ඇති වෙනස්කම් ඉස්මතු කර පෙන්වන්න.
- විශේෂණපද යනු මොනවා දැයි පැහැදිලි කරන්න.
- ඇමුණුම 01 සිසුන්ට සපයමින් විශේෂණ සහ විශේෂ්‍ය යන්න පැහැදිලි කරන්න.
- විශේෂණපද ලෙස සර්වනාම භාවිත වන ආකාරය පැහැදිලි කරන්න.
- නාමපදයක මුලට විශේෂණපදයක් යොදන ආකාරය පෙන්වා දෙන්න.
- පාලි රීතියට අනුව විශේෂණ සහ විශේෂ්‍ය දෙකෙහි සමවිෂමතා පෙන්වා දෙන්න.
- ඇමුණුම 02 ඉදිරිපත් කරමින් විශේෂණ සහ විශේෂ්‍යවල දී අධිකරණ හෙවත් ලිංග, විභක්ති, වචන සමාන විය යුතු බව අවධාරණය කරමින් සිසුන් සමග සාකච්ඡාවක් පවත්වන්න.
- සර්වනාම විශේෂණපද ලෙස යොදා ගනිමින් පාලි භාෂාවෙන් සරල වාක්‍ය නිර්මාණයට සිසුන්ට අවස්ථාව දෙන්න.

**මූලික වදන් සංකල්ප**

- **නාමපද** : විභක්ති ගන්වන ලද නාම
- **විශේෂණ පද** : යම් දෙයක හෝ පුද්ගලයෙකුගේ දක්නට ඇති ගුණය
- **සර්වනාම පද** : ලිංගත්‍රයෙහි ම වරනැගෙන ශබ්ද

**ඇගයීම හා තක්සේරුකරණයः**

- සර්වනාම ශබ්ද නාමපද ලෙස වාක්‍යවල යෙදීම
- **ගච්ඡන්ත, ගුණවන්තු** ශබ්ද විශේෂණ පද ලෙස වාක්‍යවල යෙදීම
- සර්වනාම ශබ්ද විශේෂණ පද ලෙස යොදා වාක්‍ය ලිවීම
- සර්වනාම **කිං** ශබ්දය යොදා ගනිමින් ප්‍රශ්න ඇසීම

**ගුණාත්මක යෙදවුම් :**
- ඇමුණුම 01 සහ 02
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට
- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාම වරනැගිල්ල
- බාලාවතාරය
- පාලි භාෂාවතරණය 1

**ඇමුණුම 01**

| ලිඞ්ග | විශේෂ්‍යපද | විශේෂණපද |
|---|---|---|
| පුල්ලිඞ්ග | සුරො, පුරිසො, මනුස්සො, යක්ඛො, වානරො | ගච්ඡන්තො, ගුණවන්තො, සො, එසො, අයං, කො |
| ඉත්ථිලිඞ්ග | වනිතා, දාරිකා, මාලා, කඤ්ඤා, නාවා | ගච්ඡන්තී, ගුණවන්තී, සා, එසා, අයං, කා |
| නපුංසකලිඞ්ග | ඵලං, පුඤ්ඤං, පාපං, රූපං, දානං | ගච්ඡන්තං, ගුණවන්තං, තං, එතං, ඉදං, කං |

**විශේෂණපද:** යම් දෙයක හෝ පුද්ගලයෙකුගේ දක්නට ඇති ගුණය විශේෂණ නම් වේ.
**විශේෂ්‍යපද :** එම ගුණයට යටත් වන පදය විශේෂ්‍ය නම් වේ.
**උදා: ගුණවන්තො** (විශේෂණය) **මනුස්සො** (විශේෂ්‍යය)

**ඇමුණුම 02**

පාලි භාෂාවෙහි විශේෂණ සහ විශේෂ්‍ය දෙකෙහි අධිකරණ සමාන විය යුතුයි. මෙහි අධිකරණ යන්නෙන් අදහස් වන්නේ ලිංග, විභක්ති, වචන යන තුනෙහි සමානත්වයයි.
එය පහත පරිදි වේ.
**විශේෂ්‍යය අයත් ලිංගය පුල්ලිංග නම් විශේෂණය ද පුල්ලිංග විය යුතුය. විශේෂ්‍යය අයත් විභක්තිය පඨමා විභක්ති නම් විශේෂණය ද පඨමා විභක්ති විය යුතුය. විශේෂ්‍යය අයත් වචනය ඒකවචන නම් විශේෂණය ද ඒකවචන විය යුතුය.**

**මේ සඳහා අපට යොදා ගත හැකි සරල ක්‍රමයක්.**
'**ගුණවත් පුරුෂයා**' යන මෙය පාලියට නැගීමට අවශ්‍ය වූ විට මෙහි විශේෂ්‍ය පදය මුලින් සොයා ගන්න. මෙහි ඇති විශේෂ්‍ය පදය වන්නේ '**පුරුෂයා**' යන්නයි. එය පාලි භාෂාවෙහි පඨමා විභත්ති ඒක වචනයෙන් යෙදිය යුතුයි. එවිට '**පුරිසො**' කියා සිටියි. එහි ශබ්ද ප්‍රකෘතිය

'පුරිස' යන්නයි. එයට එක් වී ඇති ප්‍රත්‍යය 'ඔ' යන්නයි. අනතුරුව විශේෂ්‍ය පදය වන ගුණවන්තු ශබ්දය ගෙන එම ඔ ප්‍රත්‍යය එයට එකතු කරන්න.
ගුණවන්තු + ඔ = ගුණවන්තො (අනිත් විභක්ති ද ප්‍රත්‍ය එකතු කොට මෙසේ සාදා ගත හැකි ය.)

**උදාහරණ**

| | | |
|---|---|---|
| යන මිනිසාට | - | ගච්ඡන්තස්ස මනුස්සස්ස |
| යන මිනිසුන්ට | - | ගච්ඡන්තානං මනුස්සානං |
| ඒ යන මිනිසාට | - | තස්ස ගච්ඡන්තස්ස මනුස්සස්ස |
| ඒ යන ගුණවත් මිනිසාට | - | තස්ස ගච්ඡන්තස්ස ගුණවන්තස්ස මනුස්සස්ස |

## ඇමුණුම 03

**01. පහත සඳහන් ඡේදයෙහි ඇති සර්වනාමපද තෝරා ඒවායෙහි නාම මූලය, විභක්තිය සහ වචනය වෙන වෙන ම ලියන්න.**

ඉමං ධම්මදෙසනං සත්ථා තස්මිං ජෙතවනෙ විහරන්තො අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ ආරබ්භ කථෙසි. දෙසනා පන තස්මිං කීටාගිරිස්මිං සමුට්ඨිතා. තෙ කිර ද්වෙ භික්ඛූ තෙසන්නං අග්ගසාවකානං සද්ධිවිහාරිකා අලජ්ජිනො පන අහෙසුං පාපභික්ඛූ. තෙ අත්තනො පරිවාරෙහි පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං කීටාගිරිස්මිං විහරන්තා තං මාලාවච්ඡං රොපෙන්තිපි කරොන්තා නං කුලදූසනකම්මං කත්වා තතො උප්පන්නෙහි පච්චයෙහි තෙසං ජීවිකං කප්පෙන්තා තං ආවාසං පෙසලානං භික්ඛූනං අනාවාසං අකංසු. සො සත්ථා තං පවත්තිං සුත්වා තෙසං පබ්බාජනීයකම්මකරණත්ථාය සපරිවාරෙ සාරිපුත්තමොග්ගල්ලානෙ ද්වෙ අග්ගසාවකෙ ආමන්තෙත්වා "ගච්ඡථ සාරිපුත්තා තෙසු යෙ තුම්භාකං තං වචනං න කරොන්ති, තෙසං පබ්බාජනීයකම්මං කරොථ. යෙ පන යානි කරොන්ති තෙ ඔවදථ අනුසාසථ."

# පාඩම 5 - නාම වරනැගීම

**නිපුණතාව** : 2.0 පාලි නාමපද විභක්ත්‍යර්ථ පිළිබඳ අවබෝධයෙන් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.2 නියමිත ශබ්ද ලිංගත්‍රයේ වරනගයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- **ගුණවන්තු** ශබ්දය සහ **ගච්ඡන්ත** ශබ්දය ලිංගත්‍රයේ වරනගයි.
- සර්වනාම ලිංගත්‍රයේ වරනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- නාම වරනැගීම පිළිබඳ සිසු පෙර දැනුම විමසන්න.
- පෙළපොතේ **ගුණවන්තු** ශබ්දය වරනගා ඇති වගුවට සිසු අවධානය යොමු කරන්න.
- නාමයක් විභක්ති අනුව වරනැගෙන ආකාරය ඉහත ශබ්දය නිදසුනක් ලෙස ගෙන සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 01**

- නාමය වරනැගෙන ස්වරූපය අනුව එය කිසියම් ලිංගයකට අයත් වන ආකාරය පෙන්වා දෙන්න.
- ඇමුණුම 01 සිසුන්ට සපයමින් **ගුණවන්තු** ශබ්දය හා සමානව වරනැගෙන අනෙකුත් උකාරාන්ත ශබ්ද කීපයක් සිසුනට පෙන්වා දෙන්න.
- පෙළ පොතෙහි එන ගුණවන්තු ශබ්දය අනුව ඒ හා සමාන එක් ශබ්දය බැගින් හඬ නගා වරනැගීමට සිසුන්ට කේවල වශයෙන් අවස්ථාව දෙන්න.
- ඇමුණුම 01 හි පරිදි අකාරාන්ත **ගච්ඡන්ත** ශබ්දය හා නපුංසකලිංග ශබ්ද කීපයක් වරනැගීමට සිසුන් යොමු කරන්න.
- පුල්ලිංග ශබ්ද හා නපුංසකලිංග ශබ්ද වරනැගීමේ දී ඇතැම් විභක්තිවල වරනැගීම් සමාන බව පෙන්වා දෙන්න.
- සර්වනාම ශබ්ද ලිංගත්‍රයෙහි ම වරනැගෙන බව නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න.
- ඇමුණුම 02 හි සඳහන් පාලියෙහි දක්නට ඇති සර්වනාම ශබ්ද ලැයිස්තුව සිසුන්ට ලබා දෙන්න.
- ලිංගත්‍රයට අයත් සර්වනාම ශබ්ද වරනැගීමට සිසු කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.
- වරනගන ලද සර්වනාම ශබ්ද වාක්‍යවල යොදා පෙන්වීමට සිසුන් මෙහෙයවන්න.
- ඇමුණුම 03 අභ්‍යාසය සිසුන්ට ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණයඃ**

- **ගුණවන්තු** ශබ්දය ලිංගත්‍රයේ වරනැගීම
- **ගුණවන්තු** ශබ්දය හා සමාන ශබ්ද සියලු විභක්තිවල වරනැගීම
- නිර්දිෂ්ට ශබ්ද ලිංගත්‍රයේ වරනැගෙන ආකාරය ලියා දැක්වීම
- පුල්ලිංග හා නපුංසකලිංග ශබ්දවල සම-විෂමතා පෙන්වා දීම
- පුල්ලිංග ශබ්දයක් ලබා දුන් විට ඉත්ථිලිංගයට හරවා වරනගා දැක්වීම
- ඉත්ථිලිංග ශබ්ද විභක්තිවල වරනගා දැක්වීම
- සර්වනාම ශබ්ද ලිංගත්‍රයේ වරනගා දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01 සහ 02
- පෙළපොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාම වරනැගිල්ල
- බාලාවතාරය
- පාලි භාෂාවතරණය 1

**ඇමුණුම 01**

- උකාරාන්ත පුල්ලිංග **ගුණවන්තු** ශබ්දය හා සමානව වරනැගෙන උකාරාන්ත ශබ්ද කීපයක්.

  මසවන්තු - ශක්‍රයා
  ධනවන්තු - ධනය ඇත්තා
  සතිමන්තු - සිහිය ඇත්තා
  බුද්ධිමන්තු - නුවණැත්තා
  චක්ඛුමන්තු - ඇස් ඇත්තා (බුදුරජ)
  බන්‍ධුමන්තු - නෑයින් ඇත්තා
  සීලවන්තු - සිල්වතා

- නපුංසකලිංග අකාරාන්ත **ගච්ඡන්ත** ශබ්දය හා සමාන ව වරනැගෙන අකාරාන්ත ශබ්ද කීපයක් :

  චරන්ත (හැසිරෙන්නා)
  තිට්ඨන්ත (සිටින්නා)
  ධාවන්ත (දුවන්නා)
  හසන්ත (සිනාසෙන්නා)
  සුණන්ත (අසන්නා)
  පචන්ත (පිසින්නා)
  ජයන්ත (දිනන්නා)
  විචරන්ත (හැසිරෙන්නා)
  වන්‍දන්ත (වඳින්නා)
  ලිඛන්ත (ලියන්නා)

- පුල්ලිංග ශබ්ද හා නපුංසකලිංග ශබ්ද වරනැගීමේ දී වෙනස් වන්නේ පඨමා, ආලපන සහ දුතියා යන විභක්ති තුන පමණි. දුතියාවේ සිට සත්තමී විභක්තිය දක්වා සෙසු විභක්ති වරනැගෙන ආකාරය සමාන ය.

**ඇමුණුම 02**

| | | |
|---|---|---|
| **සබ්බ** | **කතම** | **උභය** |
| **ඉතර** | **අඤ්ඤතර** | **අඤ්ඤතම** |
| **පුබ්බ** | **පර** | **අපර** |
| **දක්ඛිණ** | **උත්තර** | **ය** |
| **ත** | **එත** | **ඉම** |
| **කිං** | **අම්හ** | **තුම්හ** |

මේ සියලු ශබ්ද ලිංගත්‍රයේ ම වරනැගේ.

## ඇමුණුම 03

01. චක්ඛුමන්තු ශබ්දය වරනගා පහත සඳහන් වගුව සම්පූර්ණ කර අර්ථය ද ලියන්න.

| චක්ඛුමන්තු ශබ්දය | | |
|---|---|---|
| විභත්ති | ඒකවචන | බහුවචන |
| පඨමා | | |
| ආලපන | | |
| දුතියා | | |
| තතියා | | |
| කරණ | | |
| චතුත්ථී | | |
| පඤ්චමී | | |
| ඡට්ඨී | | |
| සත්තමී | | |

02. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| නාම මූලය | පඨමා ඒකවචන | තතියා බහුවචන | චතුත්ථී ඒකවචන | පඤ්චමී ඒකවචන | සත්තමී බහුවචන |
|---|---|---|---|---|---|
| සතිමන්තු | | | | | |
| විචරන්ත | | | | | |
| සීලවන්තු | | | | | |
| හසන්ත | | | | | |
| ඉම | | | | | |
| එත | | | | | |
| අම්හ | | | | | |
| තුම්හ | | | | | |
| අපර | | | | | |

# පාඩම 6 - ත්‍රෛකාලික ආඛ්‍යාත

**නිපුණතාව** : 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 ත්‍රෛකාලික ආඛ්‍යාත වගුගත කරයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල :**

- ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කරයි.
- ආඛ්‍යාත වගුගත කර ප්‍රදර්ශනය කරයි.
- ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ප්‍රකාශ කරයි.
- ඒ ඒ ආඛ්‍යාත පද අර්ථ ගන්වයි.
- විවිධ ධාතු ඒ ඒ ආඛ්‍යාතවල වරනගා වගුගත කර දක්වයි.
- නියමිත ආඛ්‍යාත මතකයෙන් කියයි, ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයː**

- කාලත්‍රයේ යෙදෙන ආඛ්‍යාත පිළිබඳ සිසු පෙර දැනුම විමසන්න.
- '**අගච්ඡි, ගච්ඡති, ගච්ඡිස්සති**' යන ආඛ්‍යාත රූප හුණු පුවරුවෙහි ලියන්න.
- ඒවා කාලත්‍රයට අනුව වරනැඟී ඇති බව සාකච්ඡා කරන්න.
- ඒ හා සමානව තවත් බොහෝ ආඛ්‍යාත කාලත්‍රයේ යෙදෙන බව සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 01**

- ඇමුණුම 01 හි අඩංගු ත්‍රෛකාලික ආඛ්‍යාත ප්‍රත්‍යය මාලාව සහිත වගුව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ආඛ්‍යාත පිළිබඳ 03 ශ්‍රේණියේ දී උගත් කරුණු ඇසුරෙන් ශිෂ්‍යයන්ගේ මතකය අවදි කරමින් ත්‍රෛකාලික ආඛ්‍යාත විභක්ති හඳුනා ගැනීමට සිසුන් මෙහෙයවන්න.
- ත්‍රෛකාලික ආඛ්‍යාත උභයපදයේ වරනැඟෙන ආකාරය සාකච්ඡා කරන්න.
- ත්‍රෛකාලික ආඛ්‍යාත වරනැඟීම්වල අර්ථ වෙන්කර ලියන්න.
- ධාතු කීපයක් ලබා දී කාලත්‍රයේ වරනැඟීමට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 02 නිදසුනක් ලෙස භාවිත කරමින් ත්‍රෛකාලික ආඛ්‍යාත පද කාලත්‍රයට වෙන් කරන්න.
- ත්‍රෛකාලික ආඛ්‍යාත ප්‍රත්‍යයමාලා වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 03 අභ්‍යාසවලට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණයː**

- ආඛ්‍යාතයක් යනු කුමක් දැයි පැහැදිලි කිරීම
- ත්‍රෛකාලික ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කර ලියා දැක්වීම
- ත්‍රෛකාලික ආඛ්‍යාත වරනැඟීම් මතකයෙන් ප්‍රකාශ කිරීම
- දෙනු ලබන ආඛ්‍යාත පද කවර ආඛ්‍යාත විභක්තියකට අයත් දැයි පෙන්වා දීම
- ත්‍රෛකාලික ආඛ්‍යාත වරනැඟීම්වල අර්ථය මාධ්‍ය භාෂාවෙන් ප්‍රකාශ කිරීම හා ලිවීම

**ගුණාත්මක යෙදවුම්ː**

- ඇමුණුම අංක 01, 02 සහ 03
- පෙළපොත

**මූලික වදන් සංකල්ප :**

- **ත්‍රෛකාලික ආඛ්‍යාත** - වර්තමාන, අතීත හා අනාගත යන කාලත්‍රයට අයත් ක්‍රියා පද
- **උභය පද** - පරස්සපද (ක්‍රියා ඵලය අනුන් වෙත පැමිණීම)
  අත්තනොපද (ක්‍රියා ඵලය තමන් වෙත පැමිණීම)
- **පුරුෂ** - පඨමපුරිස, මජ්ඣිමපුරිස, උත්තමපුරිස
- **වචන** - ඒකවචන, බහුවචන

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාම ආඛ්‍යාත වරනැගිල්ල
- පාලි භාෂාවතරණය 01

**ඇමුණුම 01**

**පරස්සපද**

| පුරුෂය | වත්තමානා | අජ්ජතනී | භවිස්සන්ති | පඤ්චමී | සත්තමී | හීයත්තනී | පරොක්ඛා | කාලාතිපත්ති |
|---|---|---|---|---|---|---|---|---|
| පඨම<br>පුරිස | ති<br>න්ති | ඉ<br>උං | ස්සති<br>ස්සන්ති | තු<br>අන්තු | එය්‍ය<br>එය්‍යුං | ආ<br>ඌ | ආ<br>උ | ස්සා<br>ස්සංසු |
| මජ්ඣිම<br>පුරිස | සි<br>ථ | ඔ<br>ත්ථ | ස්සසි<br>ස්සථ | හි<br>ථ | එය්‍යාසි<br>එය්‍යාථ | ඔ<br>ත්ථ | ඒ<br>ත්ථ | ස්සෙ<br>ස්සථ |
| උත්තම<br>පුරිස | මි<br>ම | ඉං<br>ම්හා | ස්සාමි<br>ස්සාම | මි<br>ම | එය්‍යාමි<br>එය්‍යාම | අ<br>ම්හා | අ<br>ම්හ | ස්සං<br>ස්සම්හා |

**අත්තනොපද**

| පුරුෂය | වත්තමානා | අජ්ජතනී | භවිස්සන්ති | පඤ්චමී | සත්තමී | හීයත්තනී | පරොක්ඛා | කාලාතිපත්ති |
|---|---|---|---|---|---|---|---|---|
| පඨම<br>පුරිස | තෙ<br>න්තෙ | ආ<br>ඌ | ස්සතෙ<br>ස්සන්තෙ | තං<br>අන්තං | එථ<br>එරං | ත්ථ<br>ත්ථුං | ත්ථ<br>රෙ | ස්සථ<br>ස්සිංසු |
| මජ්ඣිම<br>පුරිස | සෙ<br>ව්හෙ | සෙ<br>ව්හං | ස්සසෙ<br>ස්සව්හෙ | ස්සු<br>ව්හො | එථො<br>එය්‍යාව්හො | සෙ<br>ව්හං | ත්ථො<br>ව්හො | ස්සසෙ<br>ස්සව්හෙ |
| උත්තම<br>පුරිස | ඒ<br>ම්හෙ | අ<br>ම්හෙ | ස්සං<br>ස්සාම්හෙ | ඒ<br>ආමසෙ | එය්‍යං<br>එය්‍යාම්හෙ | ඉං<br>ම්හසෙ | ඉ<br>ම්හෙ | ස්සං<br>ස්සාම්හසෙ |

සැ. යු.

* අජ්ජතනී ක්‍රියාරූපවල විකල්ප වශයෙන් අකාරයක් මුලට ආගම වන බව දත යුතු ය.

උදා: ගමි, අගමි - ගච්ඡි, අගච්ඡි

* සත්තමී ක්‍රියා විභක්තියෙහි පඨමපුරිස ඒකවචන සඳහා රූප දෙකක් යෙදී ඇත.

උදා: ලභෙ, ලභෙය්‍ය - චරෙ, චරෙය්‍ය

**ඇමුණුම 02**

| වත්තමානා | භවිස්සන්ති | අජ්ජතනී |
|---|---|---|
| පතති | ගච්ඡිස්සථ | සම්මජ්ජි |
| පචාම | කරිස්සන්ති | නිපජ්ජිං |
| දෙමි | පවිස්සසි | ගණ්හි |
| භින්දන්ති | භවිස්සාමි | පලායිංසු |
| පචාම්හෙ | භින්දිස්සං | අපච |

**ඇමුණුම 03**

01. මෙහි අත්තනොපදය ඉවත් කරමින් / විවිධ හිස්තැන් ඇති කරමින් සම්පූර්ණ කරවන්න.

| විභක්තිය | පුරුෂය | වචනය | පරස්සපද | අත්තනොපද |
|---|---|---|---|---|
| වත්තමානා | පඨමපුරිස | ඒකවචන | චරති | චරතෙ |
| භවිස්සන්ති | මජ්ඣිමපුරිස | බහුවචන | යාචිස්සථ | යාචිස්සව්හෙ |
| අජ්ජතනී | උත්තමපුරිස | ඒකවචන | අභවිං | අභව |
| අජ්ජතනී | පඨමපුරිස | ඒකවචන | දදි | දදා |
| භවිස්සන්ති | මජ්ඣිමපුරිස | ඒකවචන | ලිඛිස්සසි | ලිඛිස්සසෙ |
| වත්තමානා | උත්තමපුරිස | බහුවචන | සයාම | සයාම්හෙ |
| වත්තමානා | මජ්ඣිමපුරිස | බහුවචන | ඛාදථ | ඛාදව්හෙ |
| අජ්ජතනී | උත්තමපුරිස | බහුවචන | භවිම්හා | භවිම්හෙ |
| අජ්ජතනී | පඨමපුරිස | බහුවචන | කිණිංසු | කිණු |
| භවිස්සන්ති | උත්තමපුරිස | ඒකවචන | යාචිස්සාමි | යාචිස්සං |

02. පහත සඳහන් වගුවෙහි හිස්තැන් පුරවන්න.

| ත්‍රෛකාලික ආඛ්‍යාත | විභක්තිය | පදය | පුරුෂය | බහුවචන පදය |
|---|---|---|---|---|
| හරති | | | | |
| පස්සිස්සසෙ | | | | |
| සයෙ | | | | |
| කිණො | | | | |
| අභවා | | | | |
| චරාමි | | | | |
| නමිස්සතෙ | | | | |
| දදි | | | | |
| පචිං | | | | |
| ලිඛසි | | | | |

# පාඩම 7 - පඤ්චමී සහ සත්තමී ආඛ්‍යාත

**නිපුණතාව** : 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.2 පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත වරනගා අර්ථ ගන්වයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල :**
- ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කරයි.
- ආඛ්‍යාත වගුගත කර ප්‍රදර්ශනය කරයි.
- ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ප්‍රකාශ කරයි.
- ඒ ඒ ආඛ්‍යාත පද අර්ථ ගන්වයි.
- විවිධ ධාතු ඒ ඒ ආඛ්‍යාතවල වරනගා වගුගත කර දක්වයි.
- නියමිත ආඛ්‍යාත මතකයෙන් කියයි, ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත විභක්තිවල මූලික අර්ථ හඳුන්වන්න.
- පෙළපොත ඇසුරු කරගනිමින් එම අර්ථ තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 01**
- අදාළ ආඛ්‍යාත යෙදෙන අර්ථ පිළිබඳ පැහැදිලි කරන්න.
- ඇමුණුම 01 යොදා ගනිමින් එම අර්ථ වාක්‍යවල යෙදෙන අයුරු පැහැදිලි කරන්න.
- ධාතුවක් නියමිත ආඛ්‍යාතවල වරනගා ශිෂ්‍යයන් සමග කියවන්න.
- ඒ ඒ ආඛ්‍යාතයට අයත් පදවල අර්ථ මාතෘ භාෂාවෙන් ප්‍රකාශ කරන්න.
- ඒකවචන පද බහුවචනයටත් බහුවචන පද ඒකවචනයටත් හරවා අර්ථය ද සමග ලියවන්න.
- ධාතු කීපයක් පෙන්වා දී ඒවා පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත විභක්තිවල වරනැගීමට සිසුන් මෙහෙයවන්න.
- ඇමුණුම 02 අනුව නියමිත ආඛ්‍යාත විභක්ති නියෝජනය වන පරිදි පද කිහිපයක් ඉදිරිපත් කරමින් ඒවායේ විභක්ති, පද, පුරුෂ, වචන භේදය විමසන්න.
- නියමිත ආඛ්‍යාත වරනැගීම්වල ප්‍රත්‍යයමාලා වාචෝද්ගත කරවන්න.
- ඇමුණුම 03 අභ්‍යාසවලට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණයඃ**
- නියමිත ආඛ්‍යාත විභක්තිවල අර්ථ පැහැදිලි කිරීම
- නියමිත ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මාලා වගුගත කොට දැක්වීම
- ධාතුවක් නියමිත ආඛ්‍යාත විභක්තිවල මතකයෙන් වරනැගීම
- පඤ්චමී ආඛ්‍යාත පද සත්තමී ආඛ්‍යාතයටත් සත්තමී ආඛ්‍යාත පද පඤ්චමී ආඛ්‍යාතයටත් හරවමින් වරනැගීම
- දෙනු ලබන ආඛ්‍යාත කිනම් ආඛ්‍යාත විභක්තියක කිනම් පදයකට, පුරුෂයකට, වචනයකට අයත් දැයි ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම අංක 01, 02 සහ 03
- පෙළපොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි නාම ආඛ්‍යාත වරනැගිල්ල

**ඇමුණුම 01**

| පඤ්චමී ආඛ්‍යාත විභක්තිය | සත්තමී ආඛ්‍යාත විභක්තිය |
|---|---|
| හවතු සබ්බමංගලං. | අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං. |
| සො සුඛී හවතු. | න හජෙ පාපකෙ මිත්තෙ. |
| නික්ඛම සමණ. පවිස සමණ. | ඉදානි මයං ධම්මං ච විනයං ච සංගායෙය්‍යාම. |
| අහං අවෙරො හොමි. | සචෙ ත්වං රොදෙය්‍යාසි නාහං කරෙය්‍යාමි. |
| දෙවො වස්සතු කාලෙන. | සචෙ සො පචෙය්‍ය මයං භුඤ්ජෙය්‍යාම. |

**ඇමුණුම 02**

| අඛ්‍යාත පදය | ආඛ්‍යාත විභක්තිය | පදය | පුරුෂය | වචනය |
|---|---|---|---|---|
| හවතු | පඤ්චමී | පරස්සපද | පඨමපුරිස | ඒකවචන |
| කරෙය්‍යුං | සත්තමී | පරස්සපද | පඨමපුරිස | බහුවචන |
| තිට්ඨාහි | පඤ්චමී | පරස්සපද | මජ්ඣිමපුරිස | ඒකවචන |
| ධාවෙය්‍යාසි | සත්තමී | පරස්සපද | මජ්ඣිමපුරිස | ඒකවචන |
| රක්ඛන්තු | පඤ්චමී | පරස්සපද | පඨමපුරිස | බහුවචන |

## ඇමුණුම 03

01. දී ඇති පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත පදවල අර්ථය හා බහුවචනය ලියන්න.

| ඒකවචන පදය | අර්ථය | බහුවචන පදය | අර්ථය |
|---|---|---|---|
| සුණාතු | | | |
| පීළෙහි | | | |
| දෙසෙය්‍යාමි | | | |
| චොරෙමි | | | |
| ජිනාතු | | | |
| පස්සෙය්‍යාසි | | | |
| ඔලොකෙහි | | | |
| ධපෙය්‍ය | | | |
| ජාලෙතු | | | |
| ගච්ඡෙය්‍යාමි | | | |

# පාඩම 8 - හීයත්තනී, පරොක්ඛා, කාලාතිපත්ති ආඛ්‍යාත

**නිපුණතාව** : 3.0 විවිධ ආඛ්‍යාත ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.3 හීයත්තනී, පරොක්ඛා, කාලාතිපත්ති ආඛ්‍යාත උභයපදයෙහි වරනගයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල :**

- ආඛ්‍යාත ප්‍රත්‍යය මාලා වගුගත කරයි.
- ආඛ්‍යාත වගුගත කර ප්‍රදර්ශනය කරයි.
- ආඛ්‍යාත පදයක් කිනම් ආඛ්‍යාතයකට අයත් දැයි ප්‍රකාශ කරයි.
- ඒ ඒ ආඛ්‍යාත පද අර්ථ ගන්වයි.
- විවිධ ධාතු ඒ ඒ ආඛ්‍යාතවල වරනගා වගුගත කර දක්වයි.
- නියමිත ආඛ්‍යාත මතකයෙන් කියයි, ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයː**

- හීයත්තනි, පරොක්ඛා හා කාලාතිපත්ති ආඛ්‍යාත විභක්තිවල මූලික අර්ථ හඳුන්වන්න.
- පෙළපොත ඇසුරු කරගනිමින් එම අර්ථ තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය**

- අදාළ ආඛ්‍යාත යෙදෙන අර්ථ පිළිබඳ පැහැදිලි කරන්න.
- ඇමුණුම 01 යොදා ගනිමින් හීයත්තනි, පරොක්ඛා හා කාලාතිපත්ති ආඛ්‍යාත විභක්තිවල අර්ථ හා ඒවා වාක්‍යවල යෙදෙන අයුරු පැහැදිලි කරන්න.
- ධාතුවක් නියමිත ආඛ්‍යාතවල වරනගා ශිෂ්‍යයන් සමග කියවන්න.
- ඒ ඒ ආඛ්‍යාතයට අයත් පදවල අර්ථ මාතෘ භාෂාවෙන් ප්‍රකාශ කරන්න.
- ඒකවචන පද බහුවචනයටත් බහුවචන පද ඒකවචනයටත් හරවා අර්ථය ද සමග ලියවන්න.
- ධාතු කීපයක් පෙන්වා දී ඒවා හීයත්තනි, පරොක්ඛා හා කාලාතිපත්ති ආඛ්‍යාත විභක්තිවල වරනැගීමට සිසුන් මෙහෙයවන්න.
- ඇමුණුම 02 අනුව නියමිත ආඛ්‍යාත විභක්ති නියෝජනය වන පරිදි පද කිහිපයක් තෝරා ඒවායේ විභක්ති, පද, පුරුෂ, වචන භේදය විමසන්න.
- නියමිත ආඛ්‍යාත වරනැගීම්වල ප්‍රත්‍යයමාලා වාචෝදගත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණයː**

- නියමිත ආඛ්‍යාත විභක්තිවල අර්ථ පැහැදිලි කිරීම
- නියමිත ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මාලා වගුගත කොට දැක්වීම
- ධාතුවක් නියමිත ආඛ්‍යාත විභක්තිවල මතකයෙන් වරනැගීම
- දෙනු ලබන ආඛ්‍යාත කිනම් ආඛ්‍යාත විභක්තියක කිනම් පදයකට, පුරුෂයකට, වචනයකට අයත් දැයි ප්‍රකාශ කිරීම
- හීයත්තනි, පරොක්ඛා හා කාලාතිපත්ති ආඛ්‍යාත විභක්තිවල අර්ථ පිළිබඳ අවබෝධයෙන් ඒවා වාක්‍යවල යෙදීම

**ගුණාත්මක යෙදවුම්ː**

- ඇමුණුම 01, 02 සහ 03
- පෙළපොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට :**

- පාලි නාම ආඛ්‍යාත වරනැගිල්ල
- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇමුණුම 01**

- **අතීතකාලය පැවසීමට භාවිත වන ආඛ්‍යාත විභක්ති**

| **ආඛ්‍යාත විභක්තිය** | **බාලාවතාර සූත්‍ර හා අර්ථ** | **උදාහරණ** |
|---|---|---|
| අජ්ජතනී | සමීපෙජ්ජතනී ( සමීප අතීතය) | බ්‍රහ්මබන්ධු පුරෙ <u>ආසිං</u> |
| හීයත්තනි | හීයොප්පභුති පච්චක්ඛෙ වා අපච්චක්ඛෙ වා හීයත්තනී (ඊයේ පටන් ප්‍රත්‍යක්ෂ වූ, ප්‍රත්‍යක්ෂ නොවූ අතීතය) | <u>අගා</u> ජෙතවනං ජිනො |
| පරොක්ඛා | අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ (අප්‍රත්‍යක්ෂ වූ අතීතය) | කුමාරො හීයො ගාමං <u>ජගාම</u> |
| කාලාතිපත්ති | ක්‍රියාතිප්පන්නෙතීතෙ (සිදු නොවූ අතීත ක්‍රියාව) | සචාහං යානං අල<u>භිස්සං</u> ත්වයා සද්ධිං <u>අගමිස්සං</u> |

**ඇමුණුම 02**

| **ආඛ්‍යාත පදය** | **විභක්තිය** | **පදය** | **පුරුෂය** | **වචනය** |
|---|---|---|---|---|
| අපචච්ඡං | පරොක්ඛා | පරස්සපද | මජ්ඣිමපුරිස | බහුවචන |
| අපචිං | හීයත්තනී | අත්තනොපද | උත්තමපුරිස | ඒකවචන |
| පපචි | පරොක්ඛා | අත්තනොපද | උත්තමපුරිස | ඒකවචන |
| අපචිස්සෙ | කාලාතිපත්ති | පරස්සපද | මජ්ඣිමපුරිස | ඒකවචන |
| අපචූ | හීයත්තනී | පරස්සපද | පඨමපුරිස | බහුවචන |

**ඇමුණුම 03**

01. දෙන ලද හීයත්තනී, පරොක්ඛා හා කාලාතිපත්ති ආඛ්‍යාත පදවල ප්‍රත්‍යය, අර්ථය හා බහු වචනය ලියන්න.

| ආඛ්‍යාත පදය | ප්‍රත්‍යය | අර්ථය | බහුවචන පදය |
|---|---|---|---|
| අපච | | | |
| අපචිස්සා | | | |
| පපචිත්ථ | | | |
| අපචසෙ | | | |
| අපචා | | | |
| පපච | | | |
| අපචිස්සථ | | | |
| පපචිත්ථො | | | |
| අපචසෙ | | | |
| පපචි | | | |

# පාඩම 9 - වාක්‍ය රචනය - 1

**නිපුණතාව** : 4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 සරල වාක්‍ය මගින් වාක්‍ය රචනාවක් ලියයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :

- මාතෘකානුකූල ව වැකි පහක රචනාවක් ලියයි.
- දින, මාස හා සංඛ්‍යා පාලියෙන් කියයි, ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**

- ක්‍රියාකාරකම් කිහිපයක් සහිත සිදුවීමක් පිළිබඳ පින්තූරයක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි ඇති ක්‍රියාකාරකම් මාධ්‍ය භාෂාවෙන් වාක්‍ය ලෙස ගොඩනගන්න.
- එම වාක්‍ය පාලියට නගමින් වාක්‍ය රචනය යනු කුමක් දැයි සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**

- වාක්‍ය කිහිපයක් ගොඩනැගීමට හැකි සුදුසු මාතෘකාවක් සිසුන්ට ලබා දෙන්න.
- එම මාතෘකාවට අදාළ ව උක්ත, ආඛ්‍යාත සහිත පාලි වාක්‍ය පහක් නිර්මාණය කරවන්න.
- එම වාක්‍ය කර්ම පද යොදා දිගුකර ලියවන්න.
- නාම විශේෂණ, ක්‍රියා විශේෂණ එක්කොට ඉහත වාක්‍ය අලංකාර කරවන්න.
- පූර්වක්‍රියා, තුමන්තක්‍රියා යොදා තවදුරටත් එම වාක්‍ය දිගු කරවන්න.
- එම වාක්‍ය පිළිවෙළට ගළපා රචනයක් ලෙස ගොඩනංවන්න.
- පරිවෙණාධිපති හිමි, ආචාර්ය මණ්ඩලය, පන්ති කාමරය, ගිහිපැවිදි සිසුන් හා පිරිවෙනේ නම ඇතුළත් වන සේ **අම්හාකං පරිවෙණං** යන මාතෘකාව යටතේ ඉහත පෙන්වූ පරිදි වාක්‍ය පහක් නිර්මාණය කරවන්න.
- එම වාක්‍ය පෙර දක්වන ලද අනෙකුත් අංග යොදා දිගු කොට ලියවන්න.
- මෙම ක්‍රමයට **සිරි ලංකාදීපං** යන මාතෘකාව යටතේ වාක්‍ය රචනයක් ලිවීමට සිසුන් යොමු කරන්න.
- සතියේ දින හා මාස දොළහට අදාළ පාලි වචන වාචෝද්ගත කරවන්න.
- සංඛ්‍යාවක් පාලියෙන් ලියා දක්වන අයුරු පැහැදිලි කර දෙන්න.
- ඇමුණුම 01 පරිදි වාක්‍ය රචනයෙහි දී යුගලපද උපයෝග කර ගන්නා අයුරු පැහැදිලි කරන්න.
- ඇමුණුම 02 අභ්‍යාස වෙත සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප:**

- **නාම විශේෂණ** - නාම පදය විස්තර කරනු ලබන පදය
- **ක්‍රියා විශේෂණ** - ක්‍රියා පදය විස්තර කරනු ලබන පදය
- **පූර්ව ක්‍රියා** - අවසාන ක්‍රියාවට පෙර අවසන් වූ ක්‍රියා
- **තුමන්ත ක්‍රියා** - 'තුං' ප්‍රත්‍යය අන්ත වූ ක්‍රියා පද

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සුදුසු තේමාවක් යටතේ වාක්‍ය කිහිපයක් ලිවීම
- රචනාවක් ලෙස වාක්‍ය ගළපා ඉදිරිපත් කිරීම

- එම වාක්‍ය විශේෂණ පද යොදා දිගු කිරීම
- පූර්ව ක්‍රියා සහ තුමන්ත ක්‍රියා භාවිත කොට වාක්‍ය සංවර්ධනය කිරීම
- දින, මාස හා සංඛ්‍යා පාලියෙන් නිවැරදි ව කීම සහ ලිවීම
- දිගු සංඛ්‍යාවක් පාලියෙන් නිවැරදි ව ලිවීම
- වාක්‍ය රචනයේ දී යුගල පද උපයෝග කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම 01 සහ 02
- පෙළපොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට:**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි රචනා 2 - බද්දේගම විමලවංස හිමි
- පාලි පාඨමඤ්ජරී - කහඳාමෝදර චන්ද්‍රකීර්ති ශ්‍රී පියරතන හිමි

ඇමුණුම 01

**භික්ඛු පත්තචීවරං ආදාය ගාමං පාවිසි.**

**සො කෙසමස්සුං ඔහාරෙත්වා පබ්බජි.**

**හට්ඨපහට්ඨො සො සබ්බදා මෙත්තං භාවෙති.**

**චරථ භික්ඛවෙ චාරිකං අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.**

**භික්ඛවො මඤ්චපීඨානි පටිසාමෙත්වා චාරිකං පක්කමිංසු.**

## ඇමුණුම 02

**01. පහත දැක්වෙන වැකි කිහිපය සුදුසු පරිදි එක් කොට සරල වාක්‍ය රචනාවක් නිර්මාණය කරන්න.**

i. සො සබ්බදා පාතො'ව වුට්ඨාය විහාරං ගච්ඡිත්‍වා විහාරඞ්ගණං සම්මජ්ජිත්‍වා කචවරං ඡඩ්ඩෙත්වා රමණීයං කරොති.
ii. අතීතෙ ලඞ්කායං සුන්දරො නාම එකො උපාසකො අහොසි.
iii. කාරුණිකො සො උපාසකො තං ආදාය ආරාමං සම්පාපුණි.
iv. එකදා සො විහාරං ගච්ඡන්තො අන්තරාමග්ගෙ එකං සුනඛපොතකං අපස්සි.
v. තස්මිං ආරාමෙ රාහුලො නාම එකො සාමණෙරො විහාසි.
vi. ''අහං ඉමං පොසෙතුං ඉච්ඡාමි. තස්මා මම දදාතු''ති යාචිත්වා ගහෙත්වා, සො සාමණෙරො තං සම්මා පොසෙසි.
vii. සො සාමණෙරො තං දිස්වා ''උපාසක, අතිසුන්දරො'යං සුනඛපොතකො. කස්සා'යං සුනඛපොතකො''ති පුච්ඡි.
viii. 'භන්තෙ, අහං අන්තරාමග්ගෙ ඉමං පස්සිත්‍වා කරුණඤ්ඤතං පටිච්ච ඉධා'නෙසිං. කස්සා'යන්ති න ජානාමී'ති උපාසකො ආහ.
ix. තතො පට්ඨාය අනුදිනං විහාරං ආගච්ඡන්තං තං උපාසකං පස්සිත්වා සො සුනඛො'පි අත්තනො නඞ්ගුට්ඨං චාලෙත්වා කතඤ්ඤුතං පකාසෙසි.
x. තස්මා මයම්පි සදා කතඤ්ඤුනො භවාම.

**02. පහත දැක්වෙන මාතෘකාවලට අදාළව වාක්‍ය පහකට නො අඩු රචනා නිර්මාණය කරන්න.**

i. මමාචරියො
ii. මම පණ්ණසාලං
iii. මම මාතා
iv. මම පිතා
v. රාහුලත්ථෙරො
vi. මම සහායකො

**03. වරහන් තුළින් සුදුසු පද තෝරා හිස් තැන් පුරවන්න.**

**(සච්චවාදි, කුසුමගච්ඡා, පච්චන්තගාමො, කුසුමගච්ඡං, ජානාමි, අකංසු, සද්දහි, දාරකෙහි, කුසුමගච්ඡො, කතො)**

අතීතෙ ලඞ්කායං එකො ……………. අහොසි. තස්මිං ගාමෙ ……… එකො දාරකො විහාසි. මාතා පිතරො තස්ස 'තිස්සො'ති නාමං ……….. තිස්සො කදාචි මුසා න භණි. තිස්සස්ස ගෙහඞ්ගනෙ නානා ………… අහෙසුං. සො දාරකො සහායකෙහි ………… සද්ධිං අත්තනො ගෙහඞ්ගනෙ කන්දුකකීළං කීළි. තදා තිස්සෙන දින්නකන්දුකපහාරෙන එකො …………… භින්නො. සායණ්හෙ තස්ස මාතා ඡින්නභින්නසාඛං …………….. දිස්වා දාසං පක්කොසාපෙත්වා, රෙ ! කෙන අයං අපරාධො …….. ඉති පුච්ඡි. භීතො සො දාසො, අහං තං න ………. ඉති අවදි. තිස්සස්ස මාතා තං න …………

# පාඩම 10 - වාක්‍ය රචනය - 11

**නිපුණතාව** : 4.0 පාලි භාෂා රීතියට අනුව වාක්‍ය රචනා කරයි.

**නිපුණතා මට්ටම** : 4.2 වර්තමානකාල කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියයි.
4.3 වර්තමානකාල කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- කර්තෘකාරක වාක්‍යයක මූලික ලක්ෂණ දක්වයි.
- කර්මකාරක වාක්‍යයක මූලික ලක්ෂණ දක්වයි.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයෙන් ලියා දක්වයි.
- කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයෙන් ලියා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- එක ම වාක්‍යයක් කර්තෘකාරක හා කර්මකාරක ක්‍රමයට හුණු පුවරුවේ ලියන්න.
- සිසුන්ගෙන් ඒවායේ වෙනස්කම් විමසන්න.
- පාලි භාෂාවේ කර්තෘකාරක හා කර්මකාරක ක්‍රම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**

- වාක්‍යයක වැදගත් ම අංගය ආඛ්‍යාතය බව පෙන්වා දෙන්න.
- ආඛ්‍යාතයෙන් කර්තෘ පදය උක්ත වන වාක්‍ය කර්තෘකාරක වාක්‍ය වන බව පහදා දෙන්න.
- පෙළපොත යොදා ගනිමින් කර්තෘකාරක වාක්‍යවල මූලික ලක්ෂණ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- කර්තෘකාරක වාක්‍යයක් බැගින් සෑම සිසුවකු ලවා ම නිර්මාණය කරවන්න.
- ක්‍රියාවෙන් කර්ම පදය උක්ත වන වාක්‍ය කර්මකාරක වාක්‍ය බව පෙළපොත ඇසුරින් පැහැදිලි කර දෙන්න.
- කර්මකාරක වාක්‍යයක් බැගින් සෑම සිසුවකු ලවා ම නිර්මාණය කරවන්න.
- කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හරවන අයුරු පෙන්වා දෙන්න.
- කර්මකාරක වාක්‍යයක් කර්තෘකාරකයට හරවන අයුරු පෙන්වා දෙන්න.
- පෙළපොත ඇසුරින් කර්මකාරක වාක්‍යවල කර්තෘ, කර්ම, ක්‍රියා යන මූලික පදවල සිදුවන වෙනස්කම් විස්තරාත්මක ව පැහැදිලි කරන්න.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයටත්, කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයටත් හරවා වාක්‍ය නිර්මාණය කරවන්න.
- අවසාන ක්‍රියාව වෙනුවට අතීත කිතක පද භාවිත කොට කර්මකාරක වාක්‍ය නිර්මාණය කර ගන්නා අයුරු පැහැදිලි කරන්න.
- ඇමුණුම 01 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්පයඃ**

- **කර්තෘකාරක වාක්‍ය** - කර්තෘ පදය උක්ත වන වාක්‍ය
- **කර්මකාරක වාක්‍ය** - කර්ම පදය උක්ත වන වාක්‍ය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කර්තෘ, කර්ම හා ක්‍රියා සහිත වාක්‍ය නිර්මාණය කිරීම
- වර්තමාන කාල කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලිවීම
- වර්තමාන කාල කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලිවීම
- අවසාන ක්‍රියාව වෙනුවට අතීත කිතක පද භාවිත කොට කර්මකාරක වාක්‍ය නිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම 01
- පෙළ පොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට:**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි රචනා 2 - බද්දේගම විමලවංස හිමි
- පාලි පාඨමඤ්ජරී - කහඳාමෝදර චන්ද්‍රකීර්ති ශ්‍රී පියරතන හිමි

**ඇමුණුම 01**

**01. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.**

i. බුද්ධො ධම්මං දෙසෙති.
ii. කුම්භකාරා චාටියො වික්කිණන්ති.
iii. රාජා රට්ඨං පාලෙති.
iv. දාසො මුඛං ධොවිතුං උදකං ආහරති.
v. සීහො මිගං මාරෙති.
vi. මයං නිවාසනානි කිණිතුං නගරං ගමිස්සාම.
vii. අහං ගාමං ගච්ඡාමි.
viii. මනුස්සා ජිව්හාහි වාචා භාසන්ති.
ix. ත්වං ධම්මං සුණාසි.
x. සුනඛො රත්තියං සාමිනො ගෙහං රක්ඛති.

**02. පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.**

i. පුරිසෙන රුක්ඛො ඡින්දීයතෙ.
ii. බිළාලෙහි කලන්දකා ඛාදීයන්තෙ.
iii. මයා ගොණො ඛෙත්තං නීයතෙ.
iv. භික්ඛුනා ගන්ථො රචිතො.
v. සූදෙන ඔදනො පච්චතෙ.
vi. රාජෙන විහාරො කාරිතො.
vii. චොරෙහි ධනානි හරීයන්තෙ.
viii. අම්හෙහි ලෙඛනං පෙසිතං.
ix. බාලකෙහි වානරා පහරීයන්තෙ.
x. පුරිසෙන උපකාරො කතො.

**03. සුදුසු ක්‍රියාපද යොදා හිස්තැන් පුරවන්න.**

i. කක්කටකා සදා ජලෙ ……………….
ii. අහං භික්ඛූහි සද්ධිං ගාමං …………...
iii. බාලකො හත්ථෙන වානරං …………..
iv. මාතා පුත්තං විපත්තියා ……………..
v. අනුරාධපුරෙ බහූනි චෙතියානි ………
vi. අම්හෙහි පොත්ථකානි ………………
vii. කස්සකෙන ඛෙත්තං ………………..
viii. උපාසකෙහි දානං …………………..
ix. ආචරියෙන ඔවාදො ………………...
x. සකුණෙහි කුළාවකානි ………………

# පාඩම 11 - වාක්‍ය පරිවර්තනය - 1

**නිපුණතාව** : 5.0 නිවැරදි ව්‍යාකරණ විධි සහිතව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.1 සරල පාලි ඡේද රීත්‍යානුකූලව මාධ්‍ය භාෂාවට නගයි.
5.2 මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවට නගයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :
- සරල පාලි ඡේද මාධ්‍ය භාෂාවෙන් ලියයි.
- මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවෙන් ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ගුරුවරයාට උපදෙස් :**
- 01, 02 හා 03 ශ්‍රේණිවල දී පරිවර්තන කාර්යයෙහි මූලිකාංග හා පාලි භාෂාමය වාක්‍ය මාධ්‍ය භාෂාවට නගන ආකාරය උගෙන ඇති බැවින් මෙහි දී වාක්‍ය කිහිපයක් එකතුවෙන් එක් අදහසක් ගොනු කෙරෙන ඡේදයක් ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙන්න.

**ප්‍රවේශය:**
- පෙළපොතෙහි එන **කන්තාරතරණං** ඡේදය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සිසුන්ගේ සහභාගිත්වය ඇතිව එම ඡේදය සිංහලට නගන්න.
- පරිවර්තන කාර්ය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**
- පාලි ඡේදයක් මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීමේ දී වැදගත් වන පහත කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරවන්න.
  - ඡේද වචනයෙන් වචනය පරිවර්තනය නො කිරීම
  - ඡේදයක තනි වාක්‍යවල අදහස පමණක් සලකා පරිවර්තනය නො කිරීම
  - සමස්ත ඡේදයේ අදහසට ගැළපෙන පරිදි වාක්‍යවල අර්ථ මතු වන සේ පරිවර්තනය කිරීම
- පාලි වාක්‍ය රචනයේ දී භාවිත පහත කාරක හා වාක්‍ය ප්‍රයෝග ඇසුරින් නිර්මාණය වන වාක්‍ය රටා සිසුන්ට ඉදිරිපත් කරන්න.
  - දුතියා විභක්ති ප්‍රයෝග
  - නිර්ධාරණාර්ථය
  - භාව සත්තමී
  - චතුත්ථී විභක්ති ප්‍රයෝග
  - පඤ්චමී විභක්ති ප්‍රයෝග
- ඉහත වාක්‍ය රටා ආශ්‍රයෙන් නිර්මාණය වූ පාලි වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීමේ දී පිළිපැදිය යුතු ක්‍රමවේද හඳුන්වන්න.
- සිසුන් දැනුවත් පිරිත් සූත්‍රපාඨ කිහිපයක් උපුටා ආඛ්‍යාතය වාක්‍යයේ විවිධ තැන්හි යෙදී ඇති ආකාරය ද අර්ථය ගැනීමේ දී පද පිළිවෙළ ඉක්මවා මාධ්‍ය භාෂාවෙන් අර්ථය පැහැදිලි වන සේ පරිවර්තනය කරන අයුරු ද ඉස්මතු කරන්න.

- පෙළපොත යොදා ගනිමින් පාලියේ ඇතැම් වාක්‍ය රටා **'නමො, සොත්ථි, සහ, සද්ධිං, සමං, නානා, විනා'** යනාදි නිපාත යෙදීමෙන් ගොඩනැගෙන ආකාරය නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.
- පරිවර්තනයේ දී එක් ප්‍රධාන වාක්‍යයක අන්තර්ගතව පවත්නා අනුවාක්‍ය හෝ අන්තර්වාක්‍ය වෙන් කර ගැනීමේ වැදගත්කම පහදන්න.
- ඇමුණුම 01 අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

## මූලික වදන් සංකල්පඃ

- **කාරක** - ක්‍රියා සිද්ධියට උපකාර වන හෙයින් කාරක නම් වේ. ඇතැම් විභක්ති මගින් මතු කෙරෙන අර්ථ සම්පූර්ණවීම සඳහා ක්‍රියාවක් අපේක්ෂා කෙරේ. එබඳු විභක්ති කාරක විභක්ති යනුවෙන් හඳුන්වනු ලැබේ.

## ඇගයීම හා තක්සේරුකරණය :

- සරල පාලි ඡේද මාධ්‍ය භාෂාවට නැගීම
- මාධ්‍ය භාෂාගත සරල වාක්‍ය පාලි භාෂාවෙන් ලිවීම
- කාරකාර්ථ පැහැදිලි කිරීම
- පාලියෙහි සුවිශේෂ වාක්‍ය රටා කෙරෙහි සැලැකිලිමත් වෙමින් පරිවර්තනය කිරීම

## ගුණාත්මක යෙදවුම්ඃ

- ඇමුණුම 01
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 1 හා 2, පොල්වත්තේ බුද්ධදත්ත හිමි

**ඇමුණුම 01**

**01. කාරක ප්‍රයෝග කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පහත ඡේදය සිංහලට නගන්න.**

තස්මිං පන කාලෙ උරුවෙලායං සෙනානි නාම නිගමො අත්‍ථි. තත්‍ථ සුජාතා නාම දාරිකා අහොසි. සා වයප්පත්තො එකදිවසං එකං නිග්‍රොධරුක්ඛං දිස්වා 'අයං රුක්ඛො දෙවතාය අධිග්ගහිතො භවිස්සති' ඉති චින්තෙන්තී එවං පත්‍ථනං අකාසි. 'දෙවතෙ, සචෙ අහං සමජාතිකං පතිං ලභිත්‍වා පඨමගබ්භෙ එව පුත්තං ලභිස්සාමි, තුය්හං මහාසක්කාරං කරිස්සාමි' ඉති. අථ පච්ඡා තස්සා පත්‍ථනා තථා එව සමිජ්ඣි. සා අතීව සන්තුට්ඨා හුත්‍වා දෙවතාය බලිකම්මං කාතුං ඉච්ඡන්තී වෙසාඛමාසෙ පුණ්ණමී දිවසෙ පාතොයෙව පායාසං පචිතුං ආරභි.

**02. පහත සඳහන් වාක්‍ය සිංහලට නගා ඒවායෙහි විභක්ති ප්‍රයෝග පෙන්වා දෙන්න.**

i. සො ථෙරෙන සහ රාජමන්දිරං අගමාසි.
ii. මහාසත්තො අත්තනො ජීවිතං පරෙසං අත්‍ථාය පරිච්චජි.
iii. පරිතො සාලං මහාරුක්ඛා වත්තන්ති.
iv. සො ආචරියං එතමත්‍ථං පුච්ඡි.
v. භද්දං භවතු තෙ භද්ද.
vi. නහි සීහෙන සමො තෙජවා බලවා පසු අත්‍ථි.
vii. අභිරූපා පාසාදිකා සා සාසනමාමකා උපාසිකා අහොසි.
viii. අතීතෙ ලඞ්කායං කල්‍යාණිපුරෙ තිස්සො නාම රාජා බභූව.
ix. මා තුම්හෙ දුම්මනා අභවත්‍ථ.
x. සා මහෙසි ඉස්සරියං පත්තා, තත්‍ථ මඞ්ගලවිහාරං නාම කාරාපෙසි.

**03. නිර්ධාරණාර්ථය, භාව සත්තමී යන ප්‍රයෝග සඳහා නිදසුන් වාක්‍ය පහ බැගින් ලියන්න.**

# පාඩම 12 - වාක්‍ය පරිවර්තනය - 11

**නිපුණතාව** : 5.0 නිවැරදි ව්‍යාකරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.3 කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවටත් පාලි භාෂාවෙන් මාධ්‍ය භාෂාවටත් නගයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :
- කර්තෘකාරක හා කර්මකාරක සරල වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.
- මාධ්‍ය භාෂාගත කර්තෘකාරක සරල වාක්‍ය පාලි භාෂාවට නගා ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- පහත සඳහන් වාක්‍ය යුගල හුණු පුවරුවේ ලියන්න.
  **දාසො ඔදනං පචති** (දාසයා බත පිසයි) - කර්තෘකාරක
  **දාසෙන ඔදනො පච්චති** (දාසයා විසින් බත පිසනු ලැබේ) - කර්මකාරක
- කර්තෘකාරක හා කර්මකාරක භේදය ඉහත වාක්‍ය ඇසුරින් හඳුන්වා දෙමින් පරිවර්තන කාර්යයෙහි දී එහි ඇති වැදගත්කම පහදන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**
- ඇමුණුම 01 යොදා ගනිමින් කර්මකාරක වාක්‍ය පරිවර්තනයේ දී කර්මය උක්ත වීමත් කර්තෘ අනුක්තවීමත් පෙන්වන්න.
- පහත නිදසුන ද යොදා ගනිමින් ඒවා යෙදෙන විභක්ති අර්ථ ප්‍රකාශ වන සේ මාධ්‍ය භාෂාවට නගන ආකාරය හඳුන්වන්න.
  **ආචරියො <u>සිස්සං පඤ්හං</u> පුච්ඡති.** (ගුරුවරයා ශිෂ්‍යයාගෙන් ප්‍රශ්නයක් අසයි)
  **යාචකො <u>සෙට්ඨිං ආහාරං</u> භික්ඛති.** (යදියා සිටුවරයාගෙන් ආහාර සිඟයි)
- පාලි භාෂාවේ ඇතැම් ධාතු මගින් නිර්මාණය වන ආඛ්‍යාත වාක්‍යයක යෙදෙන කල්හි කර්ම පද දෙකක් අපේක්ෂා කරන බව තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එබඳු වාක්‍ය පරිවර්තනයේ දී අර්ථය මූලික කොට ගෙන පරිවර්තනය කළ යුතු ආකාරය පෙන්වා දෙන්න.
- පහත සඳහන් නිදසුන් සිසුන්ට ඉදිරිපත් කරන්න.
  **දාරකො රොදති.** (දරුවා හඬයි) - **අකර්මක වාක්‍යය**
  **දාසී දාරකං රොදෙති.** (දාසිය දරුවා හඬවයි) - **සකර්මක වාක්‍යය**
  **දාසො භාරං හරති.** (දාසයා බර ගෙන යයි) - **සකර්මක වාක්‍යය**
  **සාමි දාසං භාරං හරාපෙති.** (ස්වාමියා දාසයා ලවා බර ගෙන යවයි) - **ද්විකර්මක වාක්‍යය**
- ප්‍රයෝජ්‍ය ක්‍රියාව යෙදෙන විට අකර්මක ක්‍රියා සකර්මක වන අතර සකර්මක ක්‍රියා ද්විකර්මක වන බව ඉහත නිදසුන් ආශ්‍රයෙන් පෙන්වා දෙමින් එබඳු වාක්‍ය පරිවර්තනය කළ යුතු ආකාරය විශද කරන්න.
- පාලි වාක්‍යවල භාවිත වන නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ කෙරෙහි වෙන් වෙන් වශයෙන් සැලැකිලිමත් වෙමින් පරිවර්තන කාර්යයෙහි යෙදිය යුතු බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 02 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්පඃ**

- **ද්විකර්මක ධාතු** - පාලි භාෂාවේ ඇතැම් ධාතු (**දුහ, යාච, රුධි, පුච්ඡ ...**) මගින් නිර්මාණය වූ ආඛ්‍යාත පද වාක්‍යයක අවසාන ක්‍රියාව ලෙස යෙදුනහොත් කර්ම පද දෙකක් අපේක්ෂා කරයි. එබඳු ධාතු ද්විකර්මක ධාතු නම් වේ.

## ඇගයීම හා තක්සේරුකරණය :

- වාක්‍යයක කර්තෘකාරක හා කර්මකාරක භේදය සැලකිල්ලට ගනිමින් පරිවර්තනය කිරීම
- වාක්‍යයක යෙදෙන කර්මපදය හා සම්බන්ධ විශේෂ රීති අනුව පරිවර්තන කාර්යයෙහි යෙදීම
- ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ භාවිතය අනුව වාක්‍ය මාධ්‍ය භාෂාවට නැගීම
- පාලි විශේෂණ පද නිවැරදි ව මාධ්‍ය භාෂාවට නැගීම

## ගුණාත්මක යෙදවුම්:

- ඇමුණුම 01 සහ 02
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය 1 හා 2, පොල්වත්තේ බුද්ධදත්ත හිමි

**ඇමුණුම 01**

| කර්තෘකාරක වාක්‍ය | කර්මකාරක වාක්‍ය |
|---|---|
| බුද්ධො ධම්මං දෙසෙති.<br><br>(බුදුන් වහන්සේ දහම් දෙසති) | බුද්ධෙන ධම්මො දෙසීයති.<br><br>(බුදුන් වහන්සේ විසින් ධර්මය දෙසනු ලැබේ) |
| දාසො ගොණං ආහරති.<br><br>(දාසයා ගවයා ගෙණෙයි) | දාසෙන ගොණො ආහරීයති.<br><br>(දාසයා විසින් ගවයා ගෙණෙනු ලැබේ) |
| හත්ථිනො රුක්ඛෙ ආකඩ්ඪන්ති.<br><br>(ඇත්තු ගස් අදිති) | හත්ථීහි රුක්ඛා ආකඩ්ඪීයන්ති.<br><br>(ඇතුන් විසින් ගස් අදිනු ලැබෙයි) |
| චොරා තුම්හෙ පහරන්ති.<br><br>(සොරු නුඹලාට පහර දෙත්) | තුම්හෙ චොරෙහි පහරීයථ.<br><br>(නුඹලා සොරුන් විසින් පහර දෙනු ලැබෙහු) |
| සාමණෙරො විනයං වාචෙති.<br><br>(සාමණේරයන් වන්සේ විනය කියවති) | සාමණෙරෙන විනයො වාචීයති.<br><br>(සාමණේරයන් වහන්සේ විසින් විනය කියවනු ලැබේ) |

**ඇමුණුම 02**

01. **පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරයට හරවා සිංහලට නගන්න.**

i. ථෙරො ලඞ්කාදීපෙ මිස්සකපබ්බතං පාපුණි.
ii. රාජා ථෙරානං සෙනාසනං අදාසි.
iii. දාසො සාමිකස්ස ඡත්තං ධාරෙති.
iv. බුද්ධො භික්ඛූනං ධම්මං දෙසෙති.
v. සො අත්තනො අචරියං වන්දති.
vi. මනුස්සො හත්‍ථිං බන්ධති.
vii. චොරා අම්හාකං ගොණෙ බන්ධන්ති.
viii. අස්සො රථං ආකඩ්ඪති.
ix. සෙට්ඨිධීතා තස්මිං ඛණෙ තං දාසිං අන්තරාපණං පෙසෙසි.
x. දාසො ච දාසී ච විසුං වනං ගන්ත්වා දාරූනි ආහරිංසු.

02. **පාලියෙහි ද්විකර්මක ධාතු යනු කුමක් දැයි හඳුන්වා එම ධාතු යෙදී නිර්මාණය වු වාක්‍ය පහක් ලියන්න.**

03. **පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.**

i. වඩුවන් විසින් ගෙවල් සාදනු ලැබේ.
ii. දාසයන් විසින් ඇත්තු නුවරට ගෙන එන ලදහ.
iii. අපි සතුරන් විසින් බඳිනු ලැබූවෙමු.
iv. ඇතා විසින් ගස ගෙනයනු ලැබේ.
v. ළමයා සතුරන් විසින් ගෙනයන ලද්දේ ය.
vi. අද උදේ අප විසින් අනුභව කරන ලද බත දාසිය විසින් පිසින ලද්දේ ය.
vii. මා විසින් සාදන ලද පුටු සොරු ගෙන ගියහ.
viii. උපාසකයන් විසින් වඳින ලද භික්ෂුව ධර්මය දේශනා කළේ ය.
ix. ගමට ගිය පුරුෂයා ඔහුගේ නෑයන් දුටුවේ ය.
x. කැලයෙන් ආවාවූ දාසයෝ ගඟෙහි නාත්.

# පාඩම 13 - පාලි පාඨ හා වරනැඟීම් වාචෝද්ගත කිරීම

**නිපුණතාව** : 6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැඟීම් වාචෝද්ගත කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 බාලාවතාරයේ නිර්දිෂ්ට කොටස් වාචෝද්ගත කරයි.
6.2 ආඛ්‍යාත වරනැගිල්ල වාචෝද්ගත කරයි.
6.3 ධාතුමඤ්ජුසාව වාචෝද්ගත කරයි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල** :

- බාලාවතාරය නාම හා සමාස කාණ්ඩවලට අයත් සූත්‍ර හා වෘත්ති මතකයෙන් කියයි, ලියයි.
- ආඛ්‍යාත වරනැගිල්ලේ නියමිත කොටස් මතකයෙන් ලියා දක්වයි.
- ධාතුමඤ්ජුසාවේ නියමිත කොටස් මතකයෙන් ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- බාලාවතාරයේ නාම කාණ්ඩයේ විශේෂ කොටසක් සිත් ගන්නා අයුරින් කියන්න.
- එය නිවැරදිව හඬනගා කියවීමට සිසුන් මෙහෙයවන්න.
- පාලි ව්‍යාකරණ හැදෑරීමේ දී අත්‍යවශ්‍ය කොටස් වනපොත් කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**

- බාලාවතාරය නාම හා සමාස කාණ්ඩවලට අයත් සූත්‍ර හා වෘත්ති සිසුන් සමග හඬනගා කියවන්න.
- නියමිත සූත්‍ර හා වෘත්ති වාචොද්ගත කරවා අර්ථ ගන්වන්න.
- නාමපද හා සමාස පද සාධනය සූත්‍රානුසාරයෙන් සිදු කරන ආකාරය පෙන්වා දෙන්න.
- නියමිත සූත්‍ර හා වෘත්තිවල අදහස මාධ්‍ය භාෂාවෙන් ලිවීමට සිසුන් උනන්දු කරවන්න.
- ආඛ්‍යාත විභක්ති අට හුණු පුවරුවේ ලියා දක්වා පැහැදිලි කරන්න.
- ඒ ඒ ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය වගුගතකොට ලියා දැක්වීමට සිසුන් යොමු කරවන්න.
- ධාතුමඤ්ජුසාවේ නියමිත ගාථා සිසුන් සමග නිවැරදි ව උච්චාරණය කරන්න.
- නියමිත ගාථා වාචෝද්ගත කිරීමට සිසුන් යොමු කරන්න.
- එම ගාථාවල ධාතුව හා ධාතු ගණය පෙන්වා දෙන්න.
- ඇමුණුම 01 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01
- පෙළපොත

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අදාළ නාම හා ආඛ්‍යාත නිවැරදි ව වරනැගීම, වගුගතකර දැක්වීම
- බාලාවතාර නාම හා සමාස කාණ්ඩ මතකයෙන් කීම, ලිවීම
- පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට අදාළ බාලාවතාර සූත්‍ර හා වෘත්ති ඇතුළත් ලැයිස්තුවක් සැකසීම
- ලේඛන කාර්යයේ දී නාම හා ආඛ්‍යාත නිවැරදි ව භාවිත කිරීම
- ධාතුමඤ්ජුසාවේ නියමිත ගාථා නිවැරදි ව උච්චාරණය කොට මතකයෙන් ලිවීම

## ඇමුණුම 01

**01.** **බාලාවතාරයේ නියමිත කොටසෙහි එන වනපොත් කරන ලද සූත්‍රවලින් අහඹු ලෙස තෝරාගත් සූත්‍රවල වෘත්ති විමසන්න.**

**02.** **පහත සඳහන් ධාතු විවිධ ආඛ්‍යාත විභක්තිවල වෙනස්ව වරනැගීමට සිසුන් මෙහෙයවන්න.**

i. ඨා
ii. පා
iii. මුච
iv. රුච
v. රුජ
vi. භජ
vii. පච
viii. ගමු
ix. භූ
x. හස

**03.** **පහත ගාථාවල එන ධාතු හා ඒවායෙහි අර්ථ වෙන් කර දක්වන්න.**

භජ සෙවා පුථක්කාරෙ රුජ රොගෙ අටා'ටනෙ,
කුට ච්ඡෙදෙ ච කොටිල්ලෙ අගා සජ්ඣායනාදිසු.

හූ භූ සත්තාය මුච්චන්ති ඉ අජ්ඣානෙ ගතිම්හි ච,
ඛා ඛ්‍යා ද්වයං පකථනෙ ජී ජයෙ ඤා'වබොධනෙ.

ඩී ලී වෙහාසගමනෙ ඨා ගතී විනිවුත්තියං,
ණී පාපණෙ මුණ ඤාණෙ හන හිංසා ගතීසු පි.

පා රක්ඛණම්හි පා පානෙ බ්‍රෑ වාචායං වියත්තියං,
භා දිත්තියං මා පමාණෙ අථො යා පාපුනෙ සියා.

රුධි ආවරණෙ මුච මොචනෙ රිච රෙචනෙ,
සිච සෙකෙ යුජ යොගෙ භුජ පාලනභොජනෙ.

# පාඩම 14 - නිර්දිෂ්ට සූත්‍ර ගණසජ්ඣායනය

**නිපුණතාව** : 6.0 නිර්දිෂ්ට පාලි පාඨ හා වරනැගීම් වාචෝද්ගත කරයි.

**නිපුණතා මට්ටම** : 6.4 නිර්දිෂ්ට සූත්‍ර ගණසජ්ඣායනය කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- ධම්මචක්කප්පවත්තන සූත්‍රය ගණසජ්ඣායනා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**

- ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ කොටසක් ශ්‍රැතියට අනුකූල ව සජ්ඣායනා කරන්න.
- පෙර දැනුම ඇසුරින් පිරිත් සජ්ඣායනාවක් මෙහෙයවිය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**

- පිරිත් සජ්ඣායනය කිරීමේ දී වැරදි උච්චාරණය තුළින් සිදුවන හානිය හා ඉන් බුද්ධභාෂිතයට වන විකෘතිය පෙන්වා දෙන්න.
- පිරිත් සජ්ඣායනය කිරීමේ දී නිවැරදි උච්චාරණය ඉතා වැදගත් වන බව හා ඉන් ලබා ගත හැකි ආශීර්වාදය වටහා දෙන්න.
- සාම්ප්‍රදායික රටාවට සහ රිද්මයට අනුව සජ්ඣායනය කරන ලද දම්සක්පැවතුම් සූත්‍ර දේශනාවක් ඇතුළත් වන හඬ පටයක් ඇසීමට සලස්වා එයට අනුව දම්සක්පැවතුම් සූත්‍රය නිවැරදි ව ගණසජ්ඣායනා කරවන්න. (නිදඃ වත්තල සීලරතන නාහිමිපාණන් වහන්සේගේ දම්සක්පැවතුම් සූත්‍ර දේශනාව)
- හඬ පටයක් නොමැති ව නියමිත පිරිත් කොටස් නිවැරදි ව පන්ති කාමරයේ දී ගණසජ්ඣායනය කිරීමට සිසුන් යොමු කරන්න.
- වැඩි වාර ගණනක් පුහුණුව ලබා දී ධම්මචක්කප්පවත්තන සූත්‍රය නිවැරදිව සජ්ඣායනා කිරීමට හුරු කරවන්න.
- ගණසජ්ඣායනයේ දී සාමූහික ව (එකිනෙකාගේ හඬ වෙන් වෙන් ව ඉස්මතු නොවන පරිදි) කීම තුළින් එහි ඇති ශ්‍රැතිගෝචරත්වය පෙන්වා දෙන්න.
- දම්සක්පැවතුම් සූත්‍රය අන් සූත්‍රවලට වඩා වෙනස්ව සජ්ඣායනා කළ හැකි බව පෙන්වා දෙන්න.
- දම්සක්පැවතුම් සූත්‍රය දේශනා කරන විවිධ ශෛලි අතුරින් නිවැරදි හා ශ්‍රැතිගෝචර ශෛලිය පෙන්වා දෙන්න.
- ඇමුණුම 01 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දම්සක්පැවතුම් සූත්‍රය නිවැරදි ව උච්චාරණය කිරීම
- දම්සක්පැවතුම් සූත්‍රය ශ්‍රැතිගෝචර ලෙස ගණසජ්ඣායනය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01
- පෙළපොත

- පිරුවාණා පොත් වහන්සේ
- දම්සක්පැවතුම් සූත්‍ර දේශනාව ඇතුළත් වන හඬ පටයක් (නිදඃ වත්තල සීලරතන නාහිමිපාණන් වහන්සේගේ දේශනා)

**ඇමුණුම 01**

01. දම්සක්පැවතුම් සූත්‍රයෙන් උපුටා ගත් පහත පාඨයෙහි ගුරු-ලඝු, අල්පප්‍රාණ හා මහප්‍රාණ අක්ෂර ලකුණු කර පෙන්වීමට සිසුන් මෙහෙයවන්න.

යාවකීවඤ්ච මෙ භික්ඛවෙ ඉමෙසු චතුසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි. නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. යතො ච ඛො මෙ භික්ඛවෙ, ඉමෙසු චතුසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි. අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි. අකුප්පා මෙ චෙතොවිමුත්ති. අයමන්තිමාජාති නත්‍ථිදානි පුනබ්භවො'ති.

# පාඩම 15 - සන්ධි

**නිපුණතාව** : 7.0 පාලි භාෂාවේ සන්ධි හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 7.1 සන්ධි යනු මොනවා දැයි හඳුන්වා සන්ධි ප්‍රභේද නම් කරයි.
7.2 සන්ධි ප්‍රභේදවල ලක්ෂණ පෙන්වා දෙයි.
7.3 සන්ධි විධි යොදා ගනිමින් ඒ ඒ සන්ධි ප්‍රභේදය විස්තර කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- සන්ධි යනු මොනවා දැයි හඳුන්වයි.
- සන්ධි ප්‍රභේද ලියයි.
- ඒ ඒ සන්ධියේ මූලික ලක්ෂණ පෙන්වයි.
- ඒ ඒ සන්ධි ප්‍රභේදයට නිදසුන් සපයයි.
- සන්ධි විධි යොදා ගනිමින් විසන්ධි පද සන්ධි කරයි.
- සන්ධි පද විසන්ධි කොට දක්වයි.
- සන්ධි පදයක් කිනම් සන්ධි ප්‍රභේදයකට අයත් දැයි ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- සන්ධි පිළිබඳ පහත සඳහන් නිර්වචන හුණු පුවරුවේ ලියන්න.
  **'පෙර'පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්'**
  **'සන්ධීයතීති සන්ධි'**
  **'වණ්ණානං සන්නිධි සන්ධි නාම'**
- ඉහත නිර්වචන ඇසුරින් සන්ධියක පවත්නා මූලික ලක්ෂණ හා සන්ධි ප්‍රයෝජන ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**

- සිසු අවධානය පෙළපොතේ සන්ධි පාඩම වෙත යොමු කරන්න.
- සන්ධි යනු මොනවා දැයි හඳුන්වා ප්‍රධාන සන්ධි විධි වශයෙන් ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි හඳුන්වා දෙන්න.
- ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි ප්‍රභේදවල මූලික ලක්ෂණ සාකච්ඡා කරන්න.
- ස්වර සන්ධියේ ප්‍රභේද විස්තර කොට සූත්‍රානුසාරයෙන් විසන්ධි පද සන්ධි කරන අයුරු පැහැදිලි කරන්න.
- ව්‍යඤ්ජන සන්ධියේ ප්‍රභේද විස්තර කොට සූත්‍රානුසාරයෙන් විසන්ධි පද සන්ධි කරන අයුරු පෙන්වා දෙන්න.
- නිග්ගහීත සන්ධියේ ප්‍රභේද විස්තර කොට සූත්‍රානුසාරයෙන් විසන්ධි පද සන්ධි කරන අයුරු පැහැදිලි කර දෙන්න.
- ප්‍රභේදත්‍රයට අයත් විසන්ධි පද සමූහයක් සිසුන්ට ලබා දී ඔවුන් ලවා ඒවා සූත්‍රානුසාරයෙන් සන්ධි කරවන්න.
- පෙළපොතේ හමුවන පාලි ඡේදවල ඇතුළත් සන්ධි පද උපුටා ඒවා විසන්ධි කොට නැවත සූත්‍රානුසාරයෙන් සන්ධි කිරීමට සිසුන් යොමු කරවන්න.
- ඇමුණුම 01 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්පය:**

- **ස්වර සන්ධි ප්‍රභේද -** පූර්වස්වර ලෝපය, පරස්වර ලෝපය, පූර්වස්වර දීර්ඝය, පරස්වර දීර්ඝය, අසවර්ණාදේශය, යකාරාදේශය, වකාරාදේශය, දකාරාදේශය, රිකාරාදේශය, අබ්භාදේශය, ආගමය, ද්විත්වය යන ප්‍රභේද ස්වර සන්ධියට අයත් වේ.

- **ව්‍යඤ්ජන සන්ධි ප්‍රභේද-** ලෝපාගමය, අසමාන ද්විත්වය, ඔකාරාගමය, ඔකාරාදේශය යන ප්‍රභේද අයත් වේ.

- **නිග්ගහීත සන්ධි ප්‍රභේද -** ආදේශය (වර්ගාන්තාදේශය, මකාරාදේශය, දකාරාදේශය, ඤකාරාදේශය), ආගමය, ලෝපය, විසඤ්ඤොගය යන ප්‍රභේද අයත් වේ.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සන්ධි යනු කුමක් දැයි හඳුන්වා දීම සහ සන්ධි ප්‍රයෝජන පැහැදිලි කිරීම
- ස්වර, ව්‍යඤ්ජන, නිග්ගහීත යන සන්ධිවල මූලික ලක්ෂණ විස්තර කිරීම
- ස්වර සන්ධියේ ප්‍රභේද විස්තර කොට සූත්‍රානුසාරයෙන් විසන්ධි පද සන්ධි කිරීම
- ව්‍යඤ්ජන සන්ධියේ ප්‍රභේද විස්තර කොට සූත්‍රානුසාරයෙන් විසන්ධි පද සන්ධි කිරීම
- නිග්ගහීත සන්ධියේ ප්‍රභේද විස්තර කොට සූත්‍රානුසාරයෙන් විසන්ධි පද සන්ධි කිරීම
- දෙනු ලබන ඡේදයකින් සන්ධි පද උපුටා විසන්ධි කොට නැවත සූත්‍රානුසාරයෙන් සන්ධි කිරීම

**ගුණාත්මක යෙදවුම්:**

- පෙළපොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇමුණුම 01**

01. **පහත සඳහන් වාක්‍යවල ඇතුළත් සන්ධි පද විසන්ධි කොට සූත්‍රානුසාරයෙන් සන්ධි කරමින් සිංහලට ද නගන්න.**

    i. ද්වෙ'පි එකතො පානීයං පරිස්සාවෙත්වා පිවන්ති.
    ii. අථ'ස්ස මාතාපිතරො සමානජාතියා කුලතො දාරිකං ආනයිංසු.
    iii. තතො නං සුබමන්වෙති ඡායා'ව අනපායිනි.
    iv. මනුස්සා ආයුක්ඛයෙන කම්මක්ඛයෙන පුඤ්ඤක්ඛයෙන ච මරන්ති.
    v. තණ්හඞ්කරො මෙධඞ්කරො සරණඞ්කරො දීපඞ්කරොති චත්තාරො බුද්ධා එකස්මිඤ්ඤෙව කප්පෙ උප්පජ්ජිංසු.
    vi. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං.
    vii. අථ'ස්ස උපපරික්ඛතො එතදහොසි, පච්චන්තිමෙසු ඛො ජනපදෙසු සාසනං සුප්පතිට්ඨිතං භවිස්සතීති.
    viii. අයසා'ව මලං සමුට්ඨිතං, තදුට්ඨාය තමෙ'ව ඛාදති.
    ix. පාතුරහොසි මගධෙසු පුබ්බෙ, ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො.
    x. පුත්තා මත්ථි ධනම්මත්ථි ඉති බාලො විහඤ්ඤති.

02. පහත දැක්වෙන වාක්‍යවල සන්ධි කළ යුතු තැන සන්ධි කරමින් පාලියට පරිවර්තනය කරන්න.

i. ඔහු උදෑසන ම නැගිට පාසලට යයි.
ii. මා විසින් පව් කරන ලදැයි පව්කාරයා තැවෙයි.
iii. ඉදින් මොහු පැවිදි වන්නේ නම් රහත් වන්නේ ය.
iv. ඔවුහු පළමුව ද දෙවනුව ද තෙවනුව ද බුදුන් සරණ ගියහ.
v. ඉදින් යමක් හිත පිණිස වේ ද, එය ම කළ යුතු ය.
vi. ඇය මට ඤාතියෙකුට මෙන් සැලකුවා ය.
vii. නැවත නැවත මේ දුක වන්නේ ය.
viii. මාගේ උත්සාහය සඵල වේවා.
ix. සොරා ඇති පමණ ආභරණ ගෙන පලා ගියේ ය.
x. ගුරුවරයා මාගේ වැරැද්ද දැක මෙය කීවේ ය.

03. පහත සඳහන් සන්ධි පද කවර සන්ධි ප්‍රභේදයකට අයත් දැයි දක්වන්න.

i. ලහුමෙස්සති
ii. ස්වාගතං
iii. ආකාසෙව
iv. සල්ලෙඛො
v. ඔකාසො
vi. පරිච්චජති
vii. සම්මතො
viii. ඡළභිඤ්ඤා
ix. සමෙතායස්මා
x. එතදඤ්ඤාය

# පාඩම 16 - සමාස

**නිපුණතාව** : 8.0 පාලි භාෂාවේ සමාස හඳුනාගෙන භාවිතා කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 සමාස යනු මොනවාදැයි හඳුන්වයි.
8.2 සමාස ප්‍රයෝජන ලියයි.
8.3 සමාස ප්‍රභේද දක්වයි.
8.4 ඒ ඒ සමාස ප්‍රභේදයට නිදසුන් සපයයි.
8.5 සමාසවල පද සාධනය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :

- සමාස පදයක ලක්ෂණ පෙන්වයි.
- සමාස ප්‍රභේද නම් කරයි.
- ඒ ඒ සමාස ප්‍රභේදය සඳහා නිදසුන් දක්වයි.
- සමාස පද සකසා ගන්නා අයුරු පෙන්වයි.
- සමාස ප්‍රයෝජන ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- පහත සඳහන් වාක්‍ය යුගල සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
  සමාස කළ වාක්‍ය
  **'ථෙරපුත්තාභයත්‍ථෙරො මහාරඤ්ඤං පවිසිත්වා බුද්ධභාසිතවරධම්මං භාවෙති'**
  අසමාස කළ වාක්‍ය
  **'ථෙරපුත්තො අභයො ථෙරො මහන්තං අරඤ්ඤං පවිසිත්වා බුද්ධස්ස භාසිතං වරං ධම්මං භාවෙති'**
- ඉහත වාක්‍ය ආශ්‍රයෙන් සමාස හා අසමාස දෙක පහදා සමාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන සිසුන්ට පහදන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**

- පාලි නාමපද වර්ග පහ නම් කර එහි තෙවැන්න සමාස නාම ලෙස උපුටා දක්වන්න.
- පෙළපොත ඇසුරින් සමාස යනු මොනවා දැයි පහදන්න.
- ඇමුණුම 01 හි දැක්වෙන පරිදි සමාස පදයක් ගොඩනැගෙන පියවර පෙන්වා දෙන්න.
- සමාසවලින් භාෂාවට ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙන්න.
- ඇමුණුම 02 හි ඇතුළත් සමාස ප්‍රයෝජන දැක්වෙන පාලි පාඨය වාචෝද්ගත කරවන්න.
- සමාස ප්‍රභේද පිළිවෙළින් ලියවන්න.
- එක් එක් සමාසය තුළ ඇති අනුප්‍රභේද පැහැදිලි කරන්න.
  උදාඃ කම්මධාර සමාසයෙහි ප්‍රභේද 09
- පෙළපොතෙහි අඩංගු ඒ ඒ සමාසයට අයත් බාලාවතාර සූත්‍ර වාචෝද්ගත කරවන්න.
- පහත දක්වා ඇති සමාස පද කිනම් සමාසයට අයත් දැයි නම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  **ධම්මපාලාචරියො, තිදණ්ඩං, සරණගතො, මහොසධො, බුද්ධදෙය්‍යං, අග්ගිධූමා, ඛීණාසවො, බුද්ධනාගො, ජිතින්ද්‍රියො, චතුද්දිසා, සමණබ්‍රාහ්මණා, ඡත්තපාණී, සුබප්පත්තො, චක්ඛුවිඤ්ඤාණං**

- පෙළපොතේ ඇති සමාස පද ගොනු කොට ඒවා එක් එක් සමාසයට ප්‍රභේදයට වෙන්කර වගුගත කරන්නට සිසුන් මෙහෙයවන්න.
- ඇමුණුම 03 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්පඃ

- **නාමානං සමාසො යුත්තත්‍ථො** - යුක්තාර්ථවත් නාමවල සංක්ෂේපය සමාසයි.

## ඇගයීම හා තක්සේරුකරණය ඃ

- '**නාමානං සමාසො. . . .**' යනාදි පාඨය මතකයෙන් කියමින් සමාස යනු කුමක් දැයි නිර්වචනය කිරීම
- සමාස ප්‍රභේද පිළිවෙලින් නම් කිරීම හා උදාහරණ දැක්වීම
- එක් එක් සමාසය තුළ ඇති සමාස අනුප්‍රභේද ලිවීම
- සමාස පදවල පද සාධනය ලිවීම
- සමාස හයෙහි බාලාවතාර සූත්‍ර වාචෝද්ගතව ප්‍රකාශ කිරීම
- පෙළපොතෙහි ඡේද කිහිපයක ඇති සමාස පද උපුටා දැක්වීම
- සමාස සහිත පාලි වාක්‍ය සිංහලටත් සිංහල වාක්‍ය පාලියටත් පරිවර්තනය කිරීම

## ගුණාත්මක යෙදවුම්ඃ

- ඇමුණුම 01, 02 සහ 03
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජුසා - ජාතික අධ්‍යාපන ආයතනය
- පාලි භාෂාවතරණය I-II, පොල්වත්තේ බුද්ධදත්ත හිමි
- පාලි භාෂාව හා රචනය, පැණිහෙල සිරිසම්බෝධි හිමි
- බාලාවතාරය

**ඇමුණුම 01**

| | | |
|---|---|---|
| නීලං ච තං උප්පලං | - | විග්‍රහ වාක්‍යය |
| නීලං උප්පලං | - | අධික පද මකා දැමීම |
| නීල උප්පල | - | විභක්ති ප්‍රත්‍ය ලොප් කිරීම |
| නීලුප්පල | - | සන්ධි කිරීම/ළඟින් ලිවීම |
| නීලුප්පල + සි | - | විභක්ති ප්‍රත්‍යය යෙදීම |
| නීලුප්පලං | - | සමාස පදය |

**ඇමුණුම 02**

| | | |
|---|---|---|
| **සමාසො පදසංඛෙපො** | - | පද කෙටි කිරීම |
| **එකපදතා සංයුත්තා** | - | එක් පදයක් බවට පත් කිරීම |
| **එකොච්චාරණතො යුතං** | - | එක්ව උච්චාරණය |
| **එකවිභත්තිතා යුත්තා** | - | එක් විභක්තියක් වීම |

**ඇමුණුම 03**

01. පහත සඳහන් සමාස පද කිනම් සමාසයකට අයත් දැයි දක්වන්න.

i. දසලොකෙසු
ii. යථාබලං
iii. විමලො
iv. දාරුදකං
v. අසුරො
vi. ගරුළරක්ඛසනාගා

02. පහත සඳහන් වාක්‍ය සිංහලට නගා සමාස පද උපුටා දක්වන්න.

i. කණ්හසප්පො වම්මිකං පස්සිත්වා භීතතසිතමූසිකං ගිලති.
ii. විජිතමාරො තථාගතො බොධිපල්ලඞ්කෙ සත්තාහං වීතිනාමෙසි.
iii. දුක්ඛප්පත්තො යාචකො සප්පදට්ඨෙන කාලමකරි.
iv. සාහසිකසීහො සදා මංසලොහිතඛාදකො හොති.
v. දානසාලායං ගච්ඡන්තා භික්ඛවො යථාවුද්ධං පඤ්ඤත්තාසනෙසු නිසීදිංසු.
vi. භගවා අනාථපිණ්ඩිකෙන මහාසෙට්ඨිනා කාරිතෙ ජෙතවනමහාවිහාරෙ එකූනවීසතිවස්සං අවසි.

03. පහත සඳහන් අසමාස පද සමාස කර දක්වන්න.

i. සුමෙධො ච සො පණ්ඩිතො
ii. මහන්තං ච තං බලං
iii. න ඉට්ඨො
iv. හත්ථිනො පාදා
v. පුප්ඵස්ස ගන්ධො
vi. ගීතං ච වාදිතං ච
vii. දිට්ඨො ධම්මො යෙන සො
viii. දුට්ඨං සීලං යස්ස සො
ix. කුඩ්ඩස්ස තිරො
x. භත්තස්ස පුරෙ

# පාඩම 17 - තද්ධිත

**නිපුණතාව** : 9.0 පාලි භාෂාවේ තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 තද්ධිත පිළිබඳ හඳුන්වා තද්ධිත ප්‍රභේද නම් කරයි.
9.2 තද්ධිත ප්‍රභේද විස්තර කර ඒ ඒ ප්‍රභේදයට නිදසුන් සපයයි.
9.3 තද්ධිත පදවල ප්‍රභේද නම් කරයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :
- තද්ධිත නාමයක් යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- තද්ධිත ප්‍රභේද නම් කරයි.
- ඒ ඒ තද්ධිත ප්‍රභේද නිදසුන් මඟින් පැහැදිලි කරයි.
- දෙනු ලබන තද්ධිත පදවල ප්‍රභේද නම් කරයි.
- තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය පෙන්වයි.
- නාමයකට තද්ධිත ප්‍රත්‍යයක් එක්කොට තද්ධිත නාමයක් සාදයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය:**
- පෙර දැනුම විමසමින් පහත සඳහන් ගාථාව මතකයෙන් ප්‍රකාශ කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන ශිෂ්‍යයකුට අවස්ථාව දෙන්න.

**සාමඤ්ඤ වුද්ධි භාවත්‍ථා - ව්‍යයතො තද්ධිතං තිධා**
**තත්‍රාදි චතුධපච්චා - නෙකත්තථ්‍යෙථ සංඛතො**

**පාඩම සංවර්ධනය:**
**පියවර 1**
- ඇමුණුම 01 සිසුන්ට ලබා දෙන්න.
- තද්ධිත පිළිබඳ ලියවුණු ගාථාව සිසුන් සමග සජ්ඣායනා කර එහි සරලාර්ථය පැහැදිලි කර දෙන්න.
- පෙර දැනුම විමසමින් තද්ධිත හඳුන්වා ඒවායේ ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
- තද්ධිතපද සාධනයේ දී භාවිත වන බාලාවතාර සූත්‍ර හා ඒවායේ අර්ථ පැහැදිලි කරන්න.
- තද්ධිතපද සාධනයේ දී වෘද්ධිවීම් ආදී ව්‍යාකරණ විධි පැහැදිලි කරන්න.
- ඇමුණුම 01 හි සූත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් තද්ධිත ප්‍රභේද නිදසුන් සහිතව පැහැදිලි කර දෙන්න.
- තද්ධිත පදවල නාමය හා ප්‍රත්‍යය පෙන්වා දෙන්න.
- තද්ධිත ප්‍රභේද සාරාංශ කොට රුක් සටහනක් මඟින් දක්වන්න.
- ඇමුණුම 02 භාවිත කරමින් සිසු මතකය යාවත්කාලීන කරන්න.
- ඇමුණුම 03 හි අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

**මූලික වදන් සංකල්ප:**
- **තද්ධිත** - තද්ධිත යනු ප්‍රත්‍යාර්ථ නාම විශේෂයකි.

**ඇගයීම හා තක්සේරුකරණය :**
- තද්ධිත නාමයක් යනු කුමක් දැයි පැහැදිලි කිරීම
- තද්ධිත ප්‍රභේද නම් කිරීම

- තද්ධිත ප්‍රභේද නිදසුන් මගින් පැහැදිලි කිරීම
- දෙන ලද පදවල තද්ධිත ප්‍රභේද නම් කිරීම
- තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය බාලාවතාර සූත්‍රානුසාරයෙන් පෙන්වා දීම
- තද්ධිත ප්‍රභේද ඇතුළත් රූක් සටහනක් සකස් කිරීම
- තද්ධිත පදවල අර්ථය ප්‍රකාශ කිරීම සහ ලිවීම

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම 01, 02 සහ 03
- පෙළපොත

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය
- බාලාවතාරය (තද්ධිත කාණ්ඩය)

**ඇමුණුම 01**

**සාමඤ්ඤවුද්ධි භාවත්ථා - ව්‍යයතො තද්ධිතං තිධා**
**තත්‍රාදි චතුධා පච්චා - නෙකත්ථත්‍යත්ථ සංඛතො**

**ණො ණායනො ච ණානො ච - ණෙයියො ණි ච ණිකො තථා**
**ණවො ණෙරො ච ණ්‍යො චාති - නව ගොත්තෙ පතිට්ඨිතා**

### තද්ධිත නාම හැඳින්වීම

තද්ධිත යනු නාමයකින් පරව ප්‍රත්‍යයක් යෙදී සෑදෙන ද්විතීයික නාමයකි. සමාසයෙන් වන පද සංක්ෂේපයට වඩා තද්ධිතයෙන් පදවල අතිසංක්ෂිප්ත බවක් ඇති වේ. තද්ධිතවල සුවිශේෂ ප්‍රයෝජන

– භාෂාව විසිතුරුවීම
– අර්ථය හරවත් වීම
– ව්‍යක්ත වීම
– උච්චාරණය පහසු වීම
– එක පදයක් බවට පත් වීම

නාමයකින් පරව විශේෂ අර්ථයක් ගෙන දෙන ප්‍රත්‍යයක් එකතුවී සෑදෙන නාම තද්ධිත නම් වේ.

**නිද:** **සූකර +ණික - සූකරික - ඌරන් මරන්නා**

**වෘද්ධි වීම**

තද්ධිත පද සාධනයේ දී බොහෝවිට පදයේ මුල් ස්වරය වෘද්ධි වේ. වෘද්ධි වනුයේ ප්‍රත්‍යයේ යෙදෙන ණ කාරයේ බලපෑමෙනි. වෘද්ධි කාර්යය සිදු වනුයේ පහත සූත්‍රයට අනුව ය.

**ආයුවණ්ණානං චායො වුද්ධි - අකාර ඉවණ්ණුවණ්ණානං ආ එ ඔ වුද්ධියො හොන්ති.** ඒ අනුව,

අ > ආ වේ - **සමණ + ණෙර - සාමණෙර** (ශ්‍රමණයාගේ පුතා)
ඉ ඊ > එ වේ - **වීණා + ණික - වෙණික** (වීණා ශිල්පය දන්නා)
උ ඌ > ඔ වේ - **උපගු + ණව - ඔපගව** (උපගුගේ පුත්‍රයා)

**වෘද්ධිකාර්ය වනුයේ නාමයේ මුල ම ස්වරයටයි.**

පහත බාලාවතාර සූත්‍රානුසාරයෙන් තද්ධිත පද සාධනය වේ.

**සමණ +ණෙර - ණෙර විධවාදිකො**

**සා මණ +ණෙර - අයුවණ්ණානං චායො වුද්ධි**

**සා මණ් + එර - සරා සරෙ ලොපං**

**සාමණෙර - නයෙ පරං යුත්තෙ.**

**තද්ධිත ප්‍රභේද**

තද්ධිත පහත පරිදි ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදේ.

1. **සාමඤ්ඤ තද්ධිතය**
2. **භාව තද්ධිතය**
3. **අව්‍යය තද්ධිතය**

මෙම සාමඤ්ඤ තද්ධිතයේ ප්‍රභේද 4කි. අපච්චත්‍ථ තද්ධිතය, අනේකත්‍ථ තද්ධිතය, අත්ථ්‍යත්ථ තද්ධිතය, හා සංඛ්‍යා තද්ධිතය යනුවෙනි. මේ පහත ආකාරයට සමස්ත තද්ධිත ප්‍රභේද සංඛ්‍යාව හයකි.

i. අපච්චත්‍ථ තද්ධිතය
ii. අනෙකත්‍ථ තද්ධිතය
iii. අත්ථ්‍යත්ථ තද්ධිතය
iv. සංඛ්‍යා තද්ධිතය
v. භාව තද්ධිතය
vi. අව්‍යය තද්ධිතය

1. **අපච්චත්‍ථ තද්ධිත නාම** (සාමඤ්ඤ තද්ධිතය)

පුත්‍රාර්ථය ප්‍රකාශ කරන ණ ආදි ප්‍රත්‍යය එක් වී අපච්චත්‍ථ තද්ධිත පද සෑදේ. ණ **(වාණප්පච්චෙ)** ණායන, ණාන, **(ණායන ණානා වච්චාදිතො)** ණෙය්‍ය **(ණෙය්‍යො කත්තිකාදීහි)** ණි, ණික, ඛ, **(අතොණි වා)** ණව **(ණවොපග්වාදීහි)** ණෙර **(ණෙර විධවාදිතො)** යන ප්‍රත්‍යය අපත්‍යාර්ථය ප්‍රකාශ කරයි.

- ඡට්ඨී විභක්ත්‍යන්ත පදවලින් පරව පුත්‍රාර්ථය ප්‍රකාශ කිරීමට ණ ප්‍රත්‍යය යෙදේ. **(වාණප්පච්චෙ- ඡට්ඨන්තා සද්දා තස්සාපච්චමිච්චස්මිං අත්‍ථෙ ණො වා හොති)**

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| වසිට්ඨස්ස අපච්චං | වසිට්ඨ | ණ | වාසිට්ඨ | වසිට්ඨගේ පුතා |
| ගොතමස්ස අපච්චං | ගොතම | ණ | ගොතම | ගොතමගේ පුතා |
| වසුදෙවස්ස අපච්චං | වසුදෙව | ණ | වාසුදෙව | වසුදේවගේ පුතා |

- වච්ච ආදී ගෝත්‍ර, ගණ වාචක ශබ්දවලින් පරව ගෝත්‍රාර්ථයෙහි ණායන, ණාන ප්‍රත්‍යය යෙදේ. **(ණායන ණානා වච්ඡාදිතො - වච්ඡාදිතො ගොත්තගණතො ණායන ණානා ච හොති. අපච්චං පපුත්තප්පභුති ගොත්තං)**

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| කච්චස්ස අපච්චං | කච්ච | ණායන | කච්චායන | කච්චගේ පුතු |
| කච්චස්ස අපච්චං | කච්ච | ණාන | කච්චාන | කච්චගේ පුතු |
| වච්චස්ස අපච්චං | වච්ච | ණායන | වච්චායන | වච්චගේ පුතු |
| වච්චස්ස අපච්චං | වච්ච | ණාන | වච්චාන | වච්චගේ පුතු |

- කත්තිකාදි ස්ත්‍රීවාචක නාමවලින් පර ව ණෙය්‍ය ප්‍රත්‍යය වේ.**(ණෙය්‍යො කත්තිකාදීහි)**

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| විනතාය අපච්චං | විනතා | ණෙය්‍ය | වෙණතෙය්‍ය | විනතාවගේ පුතු |
| භගිනියා අපච්චං | භගිනි | ණෙය්‍ය | භාගිණෙය්‍ය | නැගණියගේ පුතු |
| රොහිණියා අපච්චං | රොහිණී | ණෙය්‍ය | රොහිණෙය්‍ය | රෝහිණියගේ පුතු |

- ණි, ණික, ඛ - අකාරාන්ත ශබ්දවලින් පරව ණි ප්‍රත්‍යය ද ඇතැම්විට ණික ප්‍රත්‍යය ද ඛ ප්‍රත්‍යය ද වේ. **(අතොණි වා අකාරන්තතො අපච්චත්‍ථෙ ණි වා හොති පුන වා සද්දෙන ණිකො අකාරන්තා අනකාරන්තා ච ඛො පි)**

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| දක්ඛස්ස අපච්චං | දක්ඛ | ණි | දක්ඛී | දක්‍ෂගේ පුතු |
| සක්‍යපුත්තස්ස අපච්චං | සක්‍යපුත්ත | ණික | සක්‍යපුත්තික | සක්‍යපුත්‍රගේ පුතු |
| භාතුස්ස අපච්චං | භාතු | ඛ | භාතුබ්බ | සොහොයුරාගේ පුතු |

- උපගු ආදී ශබ්දවලින් පර ව ණව ප්‍රත්‍යය වේ. **(ණවොපගවාදීහි)**

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| උපගුණො අපච්චං | උපගු | ණව | ඔපගව | උපගුගේ පුතු |
| මනුනො අපච්චං | මනු | ණව | මානව | මනුගේ පුතු |

- ණෙර ප්‍රත්‍යය - විධවා ආදි ශබ්දවලින් පරව ණෙර ප්‍රත්‍යය වේ. **(ණෙරවිධවාදිතො)**

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| විධවා අපච්චං | විධවා | ණෙර | වෙධවෙර | විධවාගේ පුතු |
| සමණස්ස අපච්චං | සමණ | ණෙර | සාමණෙර | ශ්‍රමණයාගේ පුතු |

2. **අනේකාර්ථ තද්ධිත නාම** (සාමඤ්ඤ තද්ධිතය)

ඇතැම් ප්‍රත්‍යයවල බොහෝ අර්ථ ඇත. ඒවා අනේකාර්ථ ප්‍රත්‍යය නම්. අනේකාර්ථ ප්‍රත්‍යයවලින් අනේකාර්ථ තද්ධිත නාම සෑදේ.

**සත + ණික - සාතික** - (ගිතෙලින් තැනූ)

**සකට + ණික - සාකටික** - (ගැලෙහි නියුතු)

- ණික ප්‍රත්‍යය **(යෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො - තමධීතෙ තෙනකතාදිසන්නිධානනියොගසිප්පභණ්ඩජීවිකත්‍ථෙසු ච)**

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| තෙන සංසට්ඨො | සත | ණික | සාතික | ගිතෙලින් යුතු |
| තෙන තරති | උලුම්ප | ණික | ඔලුම්පික | පාරුවෙන් එතෙරවන්නා |
| තෙන සංසට්ඨො | සකට | ණික | සාකටික | ගැල් පදවන්නා |
| තෙන වහති | සීස | ණික | සීසික | හිසින් ගෙනයන්නා |
| තං අධීයති | අභිධම්ම | ණික | ආභිධම්මික | අභිධර්මය උගත්තා |
| තෙන කථං | වචසා | ණික | වාචසික | වචනයෙන් කරන ලද |

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| තස්මිං සන්නිධානං | සරීර | ණික | සාරීරික | ශරීරයේ හටගත් |
| තස්මිං නියුත්තං | ද්වාර | ණික | දොවාරික | දොරටුවෙහි නියුක්ත |
| අස්ස සිප්පං | වෙණ | ණික | වෙණික | වීණා ශිල්ප දත් |
| අස්ස භණ්ඩං | තණ්ඩුල | ණික | තණ්ඩුලික | සහල් විකුණන |

- එය්‍යක, ණක ප්‍රත්‍ය එහි වසයි, එහි උපනි ආදි අර්ථවල '**ඉත්ථිලිඞ්ග**' නාමවලින් පරව යෙදේ. (**ඉතථිලිඞ්ගතො එය්‍යකො ණකො ච**)

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| චම්පා | එය්‍යක | චම්පෙය්‍යක | චම්පාවෙහි වසන්නා වූ |
| කුසිනාරා | ණක | කොසිණාරක | කුසිණාරාවෙහි වසන්නා වූ |

- ණ - එයින් පැහැ ගැන්විණි ආදී අර්ථවල යෙදේ. (**ණ රාගා තෙන රත්තං තස්සෙදමඤ්ඤත්‍ථෙසු ච**)

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| තෙන රත්තං | හලිද්ද | ණ | හාලිද්ද | කහපැහැ ගැන් වූ |
| තත්‍ථ ජාතං | මගධ | ණ | මාගධ | මගධයෙහි උපන් |

- ඉම, ඉය, කිය ප්‍රත්‍යය - ජාති ආදි ශබ්දවලට පරව යෙදේ. (**ජාතාදීන මිමියා ච- ජාතාදිසු ඉමො ඉයො ච හොති ච සද්දෙන කියො ච**)

| විග්‍රහ වාක්‍යය | නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|---|
| පච්ඡා ජාතො | පච්ඡා | ඉම | පච්ඡිමො | පසුව උපන් තැනැත්තා |
| මනුස්සජාතියා | මනුස්සජාති | ඉය | මනුස්සජාතියො | මනුස්ස ජාතියෙහි උපන් තැනැත්තා |
| අන්‍ධකෙ ජාතො | අන්‍ධක | කිය | අන්‍ධකියො | අන්ධක රටෙහි උපන් තැනැත්තා |

- එයට සුදුසු, එයට අයත් යන අර්ථවල ණෙය්‍ය ප්‍රත්‍යය යෙදේ.

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| වන | ණෙය්‍ය | වානෙය්‍ය | වනයේ හටගත් |
| දක්ඛිණා | ණෙය්‍ය | දක්ඛිණෙය්‍ය | දක්ෂිණාවට සුදුසු |

3. **අස්ත්‍යර්ථ තද්ධිත නාම** (සාමඤ්ඤ තද්ධිතය)

ඇත, අතිශය යන අරුත් ඇති ප්‍රත්‍යය එකතු වී සෑදෙන තද්ධිත පද අස්ත්‍යර්ථ තද්ධිත නම් වේ.

**ප්‍රත්‍යය මාලාව**

ආලු (**ආලුතබ්බහුලෙ**), තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ, (**විසෙසෙ තරතමිස්සිකියිට්ඨා**) වි, (**තදස්සාත්ථීති වි**), සී (**තපාදිතො සි**), ඉක, ඊ (**දණ්ඩාදිතො ඉක ඊ**), වන්තු (**ගුණාදිතො වන්තු**), මන්තු (**සත්‍යාදීහි මන්තු**), ණ (**සද්ධාදිතො ණ**), ආදී ප්‍රත්‍යය මෙහි වේ.

- ආලු ප්‍රත්‍යය - එය බහුලව ඇත යන අරුත දෙයි. (ආලුතබ්බහුලෙ)

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| අභිජ්ඣා | ආලු | අභිජ්ඣාලු | අභිධ්‍යාව බහුලව ඇති |
| දයා | ආලු | දයාලු | දයාව බහුලව ඇති |

- තර, තම, ඉසසික, ඉය, ඉට්ඨ ප්‍රත්‍යය අතිශයාර්ථය ප්‍රකාශ කරයි. (**විසෙසෙ තරතමිස්සිකියිට්ඨා**)

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| පාප | තර | පාපතර | අතිශයින් පව් ඇති |
| පාප | තම | පාපතම | අතිශයින් පව් ඇති |
| පාප | ඉස්සික | පාපිස්සික | අතිශයින් පව් ඇති |
| පාප | ඉය | පාපිය | අතිශයින් පව් ඇති |
| පාප | ඉට්ඨ | පාපිට්ඨ | අතිශයින් පව් ඇති |

- වී, සී, ඉක, ඊ, වන්තු, මන්තු, ණ යනාදි ප්‍රත්‍යය ඇත යන අරුත් දෙයි. **(තදස්සත්ථීති වී) (තපාදිතො සි) (දණ්ඩාදිතො ඉක ඊ) (ගුණාදිතො වන්තු) (සත්‍යාදීහි මන්තු) (සද්ධාදිතො ණ)**

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| මෙධා | වී | මෙධාවී | නුවණ ඇත්තා |
| මායා | වී | මායාවී | මායා ඇත්තා |
| තප | සී | තපස්සී | තපස් ඇත්තා |
| යස | සී | යසස්සී | යසස් ඇත්තා |
| දණ්ඩ | ඉක | දණ්ඩික | දඬු ඇත්තා |
| දණ්ඩ | ඊ | දණ්ඩී | දඬු ඇත්තා |
| ගණ | ඉක | ගණික | සමූහ ඇත්තා |
| ගණ | ඊ | ගණී | සමූහ ඇත්තා |
| ගුණ | වන්තු | ගුණවන්තු | ගුණ ඇත්තා |
| සති | මන්තු | සතිමන්තු | සිහි ඇත්තා |
| සද්ධා | ණ | සද්ධ | සැදැහැ ඇත්තා |

## 4. භාවාර්ථ තද්ධිත නාම

භාවාර්ථවත් ණ්‍ය ආදි ප්‍රත්‍ය යෙදී සෑදේ. **(ණ්‍යත්තතා භාවෙ තු - භාවත්ථෙ ණ්‍යත්තතා හොන්ති. තු සද්දෙන ත්තනො වා) ණ (ණවිසමාදිහි) කණ් (රමණීයාදිතො කණ්)** ආදි ප්‍රත්‍යය භාවාර්ථයෙහි වේ.

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| කුසල | ණ්‍ය | කොසල්ල | දක්ෂ බව |
| අරොග | ණ්‍ය | ආරොග්‍ය | නිරෝගී බව |
| දුබ්බල | ණ්‍ය | දුබ්බල්‍ය | දුබල බව |
| මනුස්ස | ත්ත | මනුස්සත්ත | මිනිස් බව |
| අරහ | ත්ත | අරහත්ත | රහත් බව |

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| යාවක | ත්ත | යාවකත්ත | යාවක බව |
| අප්පිච්ච | තා | අප්පිච්ඡතා | අල්පේච්ඡ බව |
| ලහු | තා | ලහුතා | සැහැල්ලු බව |
| කතඤ්ඤු | තා | කතඤ්ඤුතා | කළගුණ දත් බව |
| විසම | ණ | වෙසම | අසමාන බව |
| පටව | ණ | පාටව | දක්ෂ බව |
| ගරු | ණ | ගාරව | ගරුත්වය |
| රමණීය | කණ් | රාමණීයකං | සිත් අලවන බව |
| මනුඤ්ඤ | කණ් | මානුඤ්ඤකං | මිනිස් බව |

5. **සංඛ්‍යා තද්ධිත නාම**

සංඛ්‍යා ශබ්දයකින් පරව පූරණාර්ථ ප්‍රත්‍යය යෙදී සෑදේ. **(සංඛ්‍යා පූරණෙ මො)**

තිය **(ද්විතීහි තියො)** ථ, ඨ **(චතුච්ඡේහි ථඨා)** ම **(සංඛ්‍යා පූරණෙ මො)** ක **(ද්වාදිතො කො නෙකත්‍ථෙච ච)** ආදි ප්‍රත්‍යය වේ.

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| ද්වි | තිය | දුතිය | දෙවෙනි |
| චතු | ථ | චතුත්‍ථ | සිව්වැනි |
| ඡ | ඨ | ඡට්ඨ | සවැනි |
| පඤ්ච | ම | පඤ්චම | පස්වැනි |
| එක | ක | එකක | පළමු |

6. **අව්‍ය තද්ධිත නාම**

වාර, විභාගාදි අර්ථ ප්‍රකාශ කරන ප්‍රත්‍යය එක් වී තැනේ. මෙහි දී තද්ධිත නාමය අව්‍ය බවට පත්වේ.

| නාමය | ප්‍රත්‍යය | තද්ධිත පදය | අර්ථය |
|---|---|---|---|
| ද්වි | ඛත්තුං | ද්විඛත්තුං | දෙවරක් |
| එක | ධා | එකධා | එක්වරක් |
| සබ්බ | ථා | සබ්බථා | හැමතින් |
| ක | ථං | කථං | කෙසේ |
| අජ්ජ | තන | අජ්ජතන | අද්‍යතන |

### ඇමුණුම 02

| | | | | | |
|---|---|---|---|---|---|
| දළ්හතරං | - | දැඩි ලෙස | වණිජ්ජං | - | වෙළඳාම |
| සත්තධා | - | සත්කඩ | පුඤ්ඤවා | - | පින් ඇති |
| පුරිමකා | - | පෙර සිටි | ජෙට්ඨක | - | ජ්‍යෙෂ්ඨ |
| කණිට්ඨස්ස | - | කනිෂ්ඨ | පරිග්ගහිතත්තා | - | රැකගත් බැවින් |
| පුරිමතරං | - | කලින් ම/මුලින් ම | | | |
| අබ්භන්තරිකො | - | ඉතා විශ්වාස කටයුතු | | | |
| ආහුණෙය්‍යං | - | දුරබැහැරින් ගෙනත් දීමට සුදුසු වූ | | | |

### ඇමුණුම 03

1. **පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

    i. තද්ධිත නාමයක් යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
    ii. තද්ධිත ප්‍රභේද නම් කරන්න.
    iii. තද්ධිතවල ප්‍රයෝජන ගෙනහැර දක්වන්න.
    iv. තද්ධිත පදයක් සාදා ගන්නා ආකාරය ලියා දක්වන්න.
    v. **සාමණෙර** යන තද්ධිත පදය සෑදෙන ආකාරය බාලාවතාර සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.
    vi. සාමඤ්ඤ තද්ධිතයේ ප්‍රභේද කීය ද? ඒවා නම් කරන්න.
    vii. සාමඤ්ඤ තද්ධිතයේ ඒ ඒ ප්‍රභේද නිදසුන් මගින් පැහැදිලි කරන්න.
    viii. අස්ත්‍යර්ථ තද්ධිත ප්‍රත්‍යය මොනවා ද?
    ix. භාවාර්ථ තද්ධිතය හැඳින්වෙන බාලාවතාර සූත්‍රය ලියන්න.
    x. වාර, විභාගාර්ථාදිය පැවසෙන තද්ධිත ප්‍රභේදය කුමක් ද?
    xi. තද්ධිත පද සාධනයේ දී භාවිත වන සූත්‍රවල සිංහලාර්ථ ලියන්න.
    xii. වෘද්ධිවීම යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

2. **පහත දැක්වෙන තද්ධිත පදවල තද්ධිත වර්ගය හා අර්ථය ලියන්න.**
දක්ඛී / මානව / සාතික / වාසුදෙව / සාරීරික / පච්ඡිමො / හාලිද්ද / චම්පෙය්‍යක / පාපිස්සික / දයාලු / මෙධාවී / කොසල්ල / මනුස්සත්ත / පාටව / කතඤ්ඤුතා / රාමණීයකං / පඤ්චම / එකධා / සබ්බථා / බුද්ධිමන්තු

3. **වරහන් තුළ ඇති පද යොදා හිස්තැන් පුරවන්න.**
**(කොසල්ලං, මනුස්සත්තං, අප්පිච්ඡතා, රාමණීයකං, පඤ්චමො, පාපතරො, යසස්සී, සතිමන්තො, සාමණෙරා, යාචකත්තං)**

    i. කොපි කදාචිපි ........................... න පසංසති.
    ii. ........................... ආරාමෙ වසන්ති.
    iii. සමණස්ස ........................... පසංසිතො.
    iv. ........................... නිබ්බාණස්සෙව සන්තිකෙ පටිවසති.
    v. ධාවන්තානං ........................... වීරො.
    vi. ........................... බහූනි පාපකම්මානි කරොති.
    vii. ........................... ගුණවන්තො ච භවති.
    viii. බාලකස්ස ........................... පස්සාමි.
    ix. රඤ්ඤා ........................... උළාරං භවති.
    x. අම්හාකං ලංකාදීපං ........................... රට්ඨං.

4. පහත සඳහන් තද්ධිත පදවල නාමය හා ප්‍රත්‍යය වෙන්කොට අර්ථය ද ලියන්න.

| නාමය | ප්‍රත්‍යය | අර්ථය |
|---|---|---|
| වෙණික | ණික | |
| ගොතම | | |
| සාකටික | | |
| වෙණතෙය්‍ය | | |
| සක්‍යපුත්තික | | |
| කොසිණාරක | | |
| මාගධ | | |
| වාණෙය්‍ය | | |
| අභිජ්ඣාලු | | |
| පාපිට්ඨ | | |
| මානුඤ්ඤකං | | |

5. පහත සඳහන් තද්ධිත පදවල බහුවචනය හා අර්ථය ලියන්න.

| නාමය | බහුවචනය | අර්ථය |
|---|---|---|
| සාකටික | සාකටිකා | |
| වාසුදෙව | | |
| කච්චායන | | |
| සාමණෙර | | |
| සාතික | | |
| දොවාරික | | |
| මාගධ | | |
| ආභිධම්මික | | |
| ගුණවන්තු | | |
| පාපිට්ඨ | | |
| දණ්ඩික | | |

# පාඩම 18 - කිතක

**නිපුණතාව** : 10.0 පාලි භාෂාවේ කිතක හඳුනා ගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 10.1 කිතක පද භාවිතය පෙන්වා දෙයි.
10.2 කිතක හඳුන්වා ප්‍රභේද නම් කරයි.
10.3 කිතක ප්‍රභේදවලට නිදසුන් සපයයි.

**කාලච්ඡේද** : 07 යි.

**ඉගෙනුම් පල** :

- කිතක යනු මොනවා දැයි හඳුන්වයි.
- නාමපද වශයෙන් කිතක යෙදෙන අයුරු දක්වයි.
- ක්‍රියාපද වශයෙන් කිතක යෙදෙන අයුරු දක්වයි.
- කිතක ප්‍රභේද නම් කරයි.
- ඒ ඒ කිතක ප්‍රභේදයට නිදසුන් සපයයි.
- විවිධ ධාතු යොදා ගනිමින් කිතක පද සකස් කරයි.
- නිර්දිෂ්ට පාඨවල ඇති කිතක පද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**

- පහත සඳහන් වාක්‍යය හුණු පුවරුවෙහි ලියන්න.
  අම්ම, පතිකුලෙ වසන්තියා නාම අන්තො අග්ගි බහි න **නීහරිතබ්බො**, බහි අග්ගි අන්තො න **පවෙසෙතබ්බො**, දදන්තස්සෙව **දාතබ්බං**, අදදන්තස්ස න **දාතබ්බං**, සුඛං **නිසීදිතබ්බං**, සුඛං **භුඤ්ජිතබ්බං**, සුඛං **නිපජ්ජිතබ්බං**, අග්ගි **පරිචරිතබ්බො**, අන්තො දෙවතා **නමස්සිතබ්බොති.**
- එහි යෙදී ඇති කිතක පද ඉරි ඇඳ පෙන්වන්න.
- කිතක පද භාවිතයෙන් භාෂාවට ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**

- සිසුන්ගේ ද සහයෝගය ඇති ව පෙළපොත ඇසුරු කර ගනිමින් කිතක පද ලැයිස්තුවක් සකස් කරන්න.
- කිතක යනු මොනවා දැයි පැහැදිලි කර දෙන්න.
- කිතක පදයක් සාදා ගන්නා අයුරු පහදා දෙන්න.
- නාමපද වශයෙන් කිතක යෙදෙන අයුරු පැහැදිලි කර දෙන්න.
- කිතක පද විභක්තිවල වරනැගෙන අයුරු පහදා දෙන්න.
- ක්‍රියාපද වශයෙන් කිතක යෙදෙන අයුරු විස්තර කරන්න.
- ඇමුණුම 01 හි දැක්වෙන ආකාරයට ආඛ්‍යාත පදයක හා කිතක පදයක වෙනස පැහැදිලි කරන්න.
- නිදසුන් සහිත ව ඒ ඒ කිතක ප්‍රභේදය විස්තර කරන්න.
- සිසුන් ලවා කිතක පද නිර්මාණය කරවන්න.
- ඇමුණුම 01 සහ 02 ඡේදවල කිතක පද උපුටා දැක්වීමට සිසුන් යොමු කරවන්න.
- ඇමුණුම 02 හි අභ්‍යාස කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**මූලික වදන් සංකල්පඃ**

- **කිතක භාවිතය** - නාම පද වශයෙන් හා ක්‍රියාපද වශයෙන් භාවිත වේ.
- **කිතක ප්‍රභේද** - ත්‍රෛකාලික කිතක, අතීත කාලික කිතක, වර්තමාන කාලික කිතක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කිතක යනු මොනවා දැයි හැඳින්වීම
- කිතක පදයක් සාදා ගන්නා අයුරු පෙන්වා දීම
- නාමපදයක් වශයෙන් කිතක යෙදෙන අයුරු විස්තර කිරීම
- කිතක නාමවිභක්තිවල වරනගා දැක්වීම
- ක්‍රියාපදයක් වශයෙන් කිතක යෙදෙන අයුරු පැහැදිලි කිරීම
- ආඛ්‍යාත පදයක හා කිතක පදයක වෙනස විස්තර කිරීම
- නිදසුන් සහිත ව ඒ ඒ කිතක ප්‍රභේදය පැහැදිලි කිරීම
- විවිධ ධාතු ඇසුරෙන් කිතකපද නිර්මාණය කිරීම
- නිර්දිෂ්ට පාඨවල ඇති කිතක පද උපුටා දැක්වීම

**ගුණාත්මක යෙදවුම්ඃ**

- ඇමුණුම 01 සහ 02
- පෙළපොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට**

- පාලි පාඨමඤ්ජූසා - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇමුණුම 01**

| ආඛ්‍යාත පද | කිතක පද |
|---|---|
| ක්‍රියාර්ථයත්, කාලාර්ථයත් ප්‍රකාශ වේ. | ක්‍රියාර්ථයත්, කාලාර්ථයත් ප්‍රකාශ වේ. |
| ධාතුව අගට ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයක් එක් කොට තනා ගනී.(උදා: ✓පච + ති = පචති) | ධාතුව අගට විශේෂ ප්‍රත්‍යයක් එක් කොට කිතක පද තනා ගනී. (උදා: ✓දිස + අනීය = දස්සනීය) |
| කර්තෘ, කර්ම, භාව යන කාරකත්‍රය ම කියැවේ. | කාරක හයේ (කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අපාදාන, ආධාර) හා භාව කාරකයේ යෙදේ. |
| පුරුෂ භේදය ඇත. | පුරුෂ භේදය නැත. |
| පුරුෂ වශයෙන් බෙදී ඒකවචන බහුවචනවල වරනැගේ. (උදා: ගච්ඡති, ගච්ඡන්ති) | කිතක පද නාමවිභක්තිවල වරනැගේ. (උදා: ගච්ඡං, ගච්ඡන්තො, ගච්ඡන්තා) |
| ආඛ්‍යාතය කිසිවිටෙකත් නාමපදයක් නො වේ. | ඇතැම් විටෙක කිතකය නාමපදයක් වෙයි. |
| ආඛ්‍යාතය ලිංග භජනය නො කරයි. | කිතක පද ලිංග භජනය කරයි. |

**ඇමුණුම 02**

01. **සුදුසු කිතක පද යොදා පහත දැක්වෙන ඡේදයෙහි හිස්තැන් පුරවන්න.**

**(දිස්වා, මනසිකරොන්තො, ගතො, ගච්ඡන්තො, සුත්වා, කත්තබ්බං, කතං, උග්ගණ්හිත්වා, පසන්නො, මාරෙන්තං, නිට්ඨාපෙත්වා, කරණීයන්ති, යුත්තන්ති, කථෙතබ්බං, හුත්වා, අකරණීයන්ති, තුට්ඨො)**

එකදා එකො සාමණෙරො නගරං ………….. මිගං ………… මනුස්සං ……….. පාණාතිපාතං ……….. තස්ස ඔවාදං අදාසි. සො තං සුත්වා අත්තනො කම්මං සාවජ්ජන්ති …………. තතො පට්ඨාය පාණාතිපාතං න අකාසි. එකස්මිං පණ්ණරසී දිවසෙ මයාපි පණ්ණසාලං ගච්ඡිතුං ……….. චින්තෙත්වා අත්තනො දාරකෙහි සද්ධිං සො මනුස්සො විහාරං ………. සාමණෙරො තං පුග්ගලං සංජානිත්වා අතීව ………… තං පවත්තිං අත්තනො ආචරියස්ස අවදි. තං ………… ආචරියො එවමාහ. ''සාමණෙර, තයා යුත්තං ........... අම්හෙහි සබ්බදා ලොකස්ස ධම්මසංගහං …………. ධම්මෙන විනා සුඛං නත්ථීති ……… ආචරියස්ස පකාසං සුත්වා ……….. සො සාමණෙරො, මයා සබ්බදා සබ්බෙසං හිතත්ථාය සබ්බකිච්චං …………. අධිට්ඨානං අකාසි. භික්ඛවෙ, තස්මා මයම්පි සො සාමණෙරො විය සුමනා …………… සම්මා සබ්බසිප්පානි …………. අජ්ඣයනකිච්චං …………. ලොකත්ථචරියං චරාම.

02. පහත දැක්වෙන වගුව නිවැරදිව සම්පූර්ණ කරන්න.

| ධාතුව | තබ්බ | අනීය | මාන | අන්ත | ත | තුං | ත්වා |
|---|---|---|---|---|---|---|---|
| √ගමු | | | | | | | |
| √හස | | | | | | | |
| √භුජ | | | | | | | |
| √පච | | | | | | | |
| √ධාව | | | | | | | |
| √කථ | | | | | | | |
| √පුච්ඡ | | | | | | | |
| √වන්ද | | | | | | | |
| √ඛාද | | | | | | | |
| √පූජ | | | | | | | |

03. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| කිතකපදය | ධාතුව | ප්‍රත්‍යය | අර්ථය |
|---|---|---|---|
| චරිතබ්බං | | | |
| සොතුං | | | |
| මුත්තො | | | |
| කරිත්වා | | | |
| තිට්ඨන්තො | | | |
| ලිඛිතො | | | |
| හසමානො | | | |
| වජ්ජං | | | |
| පාලෙන්තො | | | |
| ඛාදනීය | | | |

# පාඩම 19 - නිර්දිෂ්ට පද්‍ය පාඨ - මහාවංශය

**නිපුණතාව** : 11.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.

**නිපුණතා මට්ටම** : 11.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
11.2 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට නගයි.
11.3 නිර්දිෂ්ට කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි.
11.4 නිර්දිෂ්ට පාඨවල ඇති වටිනාකම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස්වල අර්ථය පහදයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය රස වින්දනයේ යෙදෙයි.
- පාලි පාඨ මාධ්‍ය භාෂාවට නගයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍යවල සාරධර්ම චරිතායනය කරයි.
- නියමිත කතාවස්තු කෙටියෙන් කියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය:**
- මහාවංශය පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසන්න.
- ලාංකික සමාජ, ආගමික හා දේශපාලික ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් මූලාශ්‍රයක් වශයෙන් මහාවංසයේ ඇති වටිනාකම පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**
- පෙළපොතේ 'මහාවංශය' පාඩම වෙත සිසු අවධානය යොමු කරන්න.
- මහාවංසයේ ඒ ඒ කොටස් සම්පූර්ණ කළ කතුවරු, කාලය හා අන්තර්ගත කරුණු කෙටියෙන් විස්තර කරන්න.
- මහාවංසයේ හය වන පරිච්ඡේදයේ ගාථා නිවැරදි ව සජ්ඣායනා කරන්න.
- නියමිත කොටසේ ගාථාවලට අන්වය සකස් කරන ආකාරය පෙන්වා දෙන්න.
- නිර්දිෂ්ට කොටසට පදගතාර්ථයක් සපයන්න.
- විශේෂ පද කීපයක් ගෙන ඒවා ව්‍යාකරණානුකූල ව විග්‍රහ කරන්න.
- නියමිත කොටසට අදාළ ඓතිහාසික තොරතුරු සාරාංශගත කරන්න.
- ඉතිහාස වාර්තා පිළිබඳ සවිඥානික වීම පෞරුෂ සංවර්ධනයට බලපාන ආකාරය පෙන්වා දෙන්න.
- අලංකාරාත්මක පද යෝජනයක් සහිත පහත සඳහන් අර්ථවත් පද්‍ය කීපය වනපොත් කරවන්න.

**සා සබ්බ'මබ්‍රවී තස්ස - "කිං න යාමා"ති සො'බ්‍රවි,**
**ගුහං ඵකෙති තාතො තෙ - පාසාණෙනා"ති, සා බ්‍රවි.**

**විසුං විසුං තෙ විස්සට්ඨා - පුරිසි'ත්ථී කුමාරකා,**
**විසුං විසුං දීපකස්මිං - ඔක්කමිංසු වසිංසු ච.**

**ලංකායං විජයස'නාමකො කුමාරො**
**ඔතිණ්ණො ථිරමති තම්බපණ්ණිදීපෙ**
**සාලානං යමකගුණාන'මන්තරස්මිං**
**නිබ්බාණං සයිතදිනෙ තථාගතස්ස.**

- ඇමුණුම 01 අභ්‍යාසය කිරීමට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් සංකල්ප:

- **මහාවංශය** - පාලි වංසකථා ගණයට අයත් පැරණිතම ග්‍රන්ථයකි. ආරම්භයේ සිට ලක්දිව ඉතිහාසය අඛණ්ඩ ව වාර්තා කරයි. මහානාම හිමියන්ගේ පටන් විවිධ යුගවල වාසය කළ විද්වතුන් විසින් මෙහි කොටස් සම්පාදනය කොට ඇත. වර්තමානය වන විටත් මෙය රචනා වෙමින් පවතින කෘතියකි.

## ගුණාත්මක යෙදවුම්:

- ඇමුණුම 01
- මහාවංශය
- පෙළපොත

## ඇගයීම හා තක්සේරුකරණය :

- මහාවංශයේ නිර්දිෂ්ට පද්‍ය කොටස නිවැරදි ව සජ්ඣායනය කිරීම
- නියමිත පාලි පද්‍ය නිවැරදි ව මාධ්‍ය භාෂාවට නැගීම
- විශේෂ පද විග්‍රහාත්මක ව පැහැදිලි කිරීම
- නියමිත කොටසට අදාළ ඉතිහාස තොරතුරු මතකයෙන් කීම

## ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට:

- මහාවංසය - පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි

**ඇමුණුම 01**

01. මහාවංශයේ 06 වන පරිච්ඡේදයේ අන්තර්ගතය කෙටියෙන් ලියන්න.
02. පහත සඳහන් පුද්ගල හා ස්ථාන නාමවල ඓතිහාසික සම්බන්ධය ලියන්න.
    වංග රජු / කලිඟු රජු / ලාට රට / සිංහබාහු / සිංහසීවලී / සිංහපුර / සුමිත්ත / නාගදීප / සුප්පාරක පටුන / විජය රජු
03. 'මහාවංශයේ ඓතිහාසික අගය' යන මාතෘකාව යටතේ වචන 300 කට නො අඩු රචනයක් ලියන්න.
04. පහත සඳහන් ගාථාවල සරල සිංහල අදහස ලියන්න.

සෙනාපති වංගරඤ්ඤො - ඨිතො පච්චන්තගාමකෙ
නිසින්නො වටමූලෙ සො - කම්මන්තං සංවිධාපයං

දිස්වා තෙ පුචඡි තෙ'වොචුං - "අටවීවාසිනො මයං"
ඉති සො දාපයී තෙසං - වත්ථානි ධජිනීපතී.

තානාහෙසුං උළාරානි - හත්තං පණ්ණෙසු දාපයී,
සොවණ්ණභාජනානාසුං - තෙසං පුඤ්ඤෙන තානි ච.

තෙන සො විම්හිතො පුච්ඡි - "කෙ තුම්හෙ"ති, චමූපතී.
තස්ස සා ජාති ගොත්තානි - රාජධීතා නිවෙදයී.

පිතුච්ඡාධීතරං තං සො - ආදාය ධජිනීපතී,
ගන්ත්වාන වංග නගරං - සංවාසං තාය කප්පයී.

# පාඩම 20 - නිර්දිෂ්ට ගද්‍ය පාඨ

**නිපුණතාව** : 11.0 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය සඳහා කියවයි.

**නිපුණතා මට්ටම** : 11.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
11.2 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට නගයි.
11.3 නිර්දිෂ්ට කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි.
11.4 නිර්දිෂ්ට පාඨවල ඇති වටිනාකම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල** :
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් රුචිකත්වයෙන් යුතු ව කියවයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස්වල අර්ථය පහදයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය රස වින්දනයේ යෙදෙයි.
- පාලි පාඨ මාධ්‍ය භාෂාවට නගයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍යවල සාරධර්ම චරිතායනය කරයි.
- නියමිත කතාවස්තු කෙටියෙන් කියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශයඃ**
- නියමිත පාඨ ඇසුරෙන් සුදුසු කථාවක් සරල ව මාධ්‍ය භාෂාවෙන් රසවත්ව ඉදිරිපත් කරන්න.
- එවැනි පාලි භාෂාමය කථා කියවීම හා පරිවර්තනය තුළින් ගද්‍ය රචනය, ගද්‍ය පරිවර්තනය, ව්‍යාකරණය පිළිබඳ දැනීම හා ජීවිත පරිඥානය ලබා ගත හැකි බව පෙන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනයඃ**

**පියවර 1**
- පෙළපොතෙහි අදාළ පාඩම වෙත සිසු අවධානය යොමු කරන්න.
- නියමිත කථා නිවැරදි උච්චාරණය සහිත ව කියවීමට සිසුන් මෙහෙයවන්න.
- සිසුන් සමග එක්ව නිර්දිෂ්ට ගද්‍ය පාඨ අර්ථවත් ව මාධ්‍ය භාෂාවට නගන්න.
- දුෂ්කර පද කීපයක් ගෙන ව්‍යාකරණ විභාග දක්වන්න.
- නියමිත කථා සරල මාධ්‍ය භාෂාවෙන් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒ ඒ කථාවලින් ප්‍රකාශිත උපදේශ උපුටා දක්වන්න.
- 'පුද්ගල චරිත හැඩගැස්වීමට කථාවලින් ලැබෙන පිටිවහල' යන මැයෙන් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම 01 යොදා ගනිමින් නියමිත ගද්‍ය පාඨවල අලංකාරාත්මක උපදේශාත්මක සංවාද ස්වරූපී ප්‍රකාශ උපුටා දක්වන්න.
- නියමිත පාඨවල වාක්‍ය ක්‍රමය ආදර්ශයට ගෙන මාධ්‍ය භාෂාවෙන් වැකි කීපයක් ගොඩ නගා පාලියට නැගීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 02 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**
- ගද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කිරීම
- නිර්දිෂ්ට පාඨ මාධ්‍ය භාෂාවට නැගීම
- දුෂ්කර පද විග්‍රහාත්මක ව පැහැදිලි කිරීම

- නියමිත කථා මාධ්‍ය භාෂාවෙන් සාරාංශ ගත කිරීම
- අදාළ කථා තුළින් කියවෙන උපදේශ උපුටා දක්වීම
- පාලියේ විවිධ වාක්‍ය රටා අවස්ථාවෝචිත ව භාවිත කිරීම

**ගුණාත්මක යෙදවුම්:**

- පෙළපොත

**ගුරුවරයාගේ වැඩිදුර පරිශීලනයට:**

- පාලි පාඨාවලී

**ඇමුණුම 01**

- තස්මිං කාලකතෙ බ්‍රාහ්මණො තස්ස සරීරං ඣාපෙත්වා දෙවසිකං ආළාහනං ගන්ත්වා කහං එකපුත්තක කහං එකපුත්තකා'ති රොදි.
- සා චින්තෙසි, අහං එතස්ස පුත්තධීතාහි සද්ධිං දාසී භවිස්සාමීති පටිජානිං. 'වඤ්චෙස්සාමී නන්ති' සා වෙජ්ජෙන කීදිසං භද්දෙති පුට්ඨා, පුබ්බෙ මෙ අක්ඛීනි ථොකං රුජිංසු. ඉදානි අතිරෙකතරං රුජන්තී' ති ආහ.
- සො තුට්ඨමානසො තං තං සාඛං ගහෙත්වා නච්චන්තො අට්ඨාසි. තස්ස ගහිතසාඛාපි අක්කන්තසාඛාපි භිජ්ජි.
- පච්චෙකබුද්ධො වෙහාසං අබ්භුග්ගන්ත්වා ගච්ඡන්තෙ, හුඞ්කරිත්වා ඨිතස්ස සුනඛස්ස හදයං ඵලි. තිරච්ඡානා නාමෙතෙ උජුජාතිකා හොන්ති. කුටිලා මනුස්සා පන අඤ්ඤං චින්තෙන්ති අඤ්ඤං වදන්ති.
- කාරණාකාරණං ජානන්තෙහි පන මනුස්සෙහි අවස්සං පච්චුපකාරො කාතබ්බොව හොති. තථාපෙකච්චෙ නරාධමා අත්තානං උපකාරකානං හිතෙසීනං සප්පුරිසානං අනත්ථමෙව කරොන්ති. තෙ පනෙතෙ අසප්පුරිසා තිරච්ඡානගතෙහිපි ගුණහීනාති ඤාතබ්බා.
- අථස්ස භරියා අඤ්ඤෙන සද්ධිං සංවසන්තී අයං මං පහාය පබ්බජිතො'ති බ්‍රාහ්මණෙ පදුට්ඨචිත්තා හො, බ්‍රාහ්මණං මාරෙහී'ති සාමිකෙන සද්ධිං මන්තෙසි.

**ඇමුණුම 02**

01. පෙළපොතේ අදාළ පාඩමෙහි පාලි පාඨාවලී යටතේ දක්නට ලැබෙන කථා අතුරින් 05 ක් සරල සිංහල මාධ්‍යයෙන් ලියා දක්වන්න.

02. 'සත්ව ලෝකයෙන් ගත හැකි ජීවිතාදර්ශ' යන මාතෘකාව යටතේ වචන 300 කට නො අඩු රචනයක් ලියන්න.

03. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

    i. සචෙ මෙ අක්ඛීනි පාකතිකානි කාතුං සක්ඛිස්සසි අහං තෙ පුත්තධීතාහි සද්ධිං දාසි භවිස්සාමීති.
    ii. සො එකං භෙසජ්ජං යොජෙත්වා තස්සා සන්තිකං ගන්ත්වා භද්දෙ, ඉමං භෙසජ්ජං අඤ්ජාහී'ති අඤ්ජාපෙසි.
    iii. සො කිර එකදිවසං පුබ්බණ්හසමයෙ ධනුං ආදාය සුනඛපරිවුතො අරඤ්ඤං ගච්ඡන්තො අන්තරාමග්ගෙ එකං පිණ්ඩාය පවිසන්තං භික්ඛුං දිස්වා කුජ්ඣිත්වා කාලකණ්ණී මෙ දිට්ඨො, අජ්ජ කිඤ්චි න ලභිස්සාමීති චින්තෙන්තො පක්කාමි.
    iv. සක්ඛිස්සසි තස්ස මුඛෙ නාලිමත්තා අජලණ්ඩිකා ඛිපිතුන්ති?
    v. බොධිසත්තො එවං විනිච්ඡිතං අට්ටං සුත්වා ඉදානි දෙවතාභාවං වා අදෙවතාභාවං වා ජානිස්සාමීති පලාලං ආහරිත්වා සුසිරං පූරෙත්වා අග්ගිං අදාසි.

# තක්සේරුව සහ ඇගයීම

# හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් නිපුණතා පාදක විෂය මාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවා දියුණු කරමින් හා පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟාකර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයාගේ කාර්යභාරයයි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම

ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වූයේ ද යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයයි. යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක්මත්, සෑම විෂයක් සම්බන්ධයෙන්මත්, සෑම විෂය ඒකකයකටමත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

# ආදර්ශ ප්‍රශ්න පත්‍රය
## Model Paper

**4 ශ්‍රේණිය /Grade 4**

**පාලි භාෂාව** | **කාලය : පැය දෙකයි**

Pali | **විභාග අංකය :..........................................** | Time : Two hours

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

- **I කොටසේ ප්‍රශ්න සියල්ලටත් II කොටසේ 02, 03 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**
- **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

### I කොටස

**01.** **අංක 1 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවලට (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01. පාලි අක්ෂර මාලාවේ ඇති අඝෝෂාක්ෂර ගණන
i. 08 කි. ii. 11 කි. iii. 13 කි. iv. 21 කි.

02. උගුරෙන් උපදින අකුරු යුගලය ඇතුළත් නිවැරැදි වරණය වනුයේ
i. ක, හ ii. ක, ජ iii. ඡ, න iv. ඨ, ඪ

03. අක්ෂර වින්‍යාසය නිවැරැදිව ලියා ඇති වරණය වනුයේ
i. පුරිසදම්මසාරථී, වුස්සමාස, පන්නරසි, ඡායා
ii. පුරිසදම්මසාරතී, වුස්සමාස, පණ්ණරසි, ඡායා
iii. පුරිසධම්මසාරථී, වුස්සමාස, පණ්ණරසි, චායා
iv. පුරිසදම්මසාරථී, වුස්සමාස, පණ්ණරසි, ඡායා

04. ධම්ම, කම්ම, විහාර, ආකාස යන ශබ්ද වරනැගීම් රටාව අනුව
i. පුල්ලිංග වේ. ii. පුමනපුංසක ලිංග වේ.
iii. නපුංසක ලිංග වේ. iv. පුමිත්ථිලිංග වේ.

05. 'ගුණවන්තු' ශබ්දයේ චතුත්ථී විභක්ති බහුවචන රූපය කුමක් ද?
i. ගුණවතො ii. ගුණවන්තං
iii. ගුණවන්තානං iv. ගුණවන්තෙහි

06. වාක්‍යයක යොදන විශේෂ්‍ය - විශේෂණ පද පිළිබඳ සම්මත පාලි රීතිය වනුයේ
i. හැමවිටම ලිංගයෙන්, විභක්තියෙන් හා වචනයෙන් සමාන විය යුතුය.
ii. ඇතැම්විට ලිංගයෙන්, විභක්තියෙන් හා වචනයෙන් සමාන විය යුතුය.
iii. හැමවිට ම විභක්තියෙන්, වචනයෙන් පමණක් සමාන විය යුතුය.
iv. බොහෝ විට ලිංගයෙන්, විභක්තියෙන් සමාන විය යුතුය.

07. ක්‍රියාවක මූලය හඳුන්වනුයේ
i. ආඛ්‍යාතය යනුවෙනි. ii. ශබ්ද ප්‍රකෘතිය යනුවෙනි.
iii. ධාතුව යනුවෙනි. iv. කාරක යනුවෙනි.

08. අජ්ජතනී ආඛ්‍යාත උත්තම පුරිස ඒකවචන රූපය කුමක් ද?
i. අපචී ii. අපචිං iii. අපචිංසු iv. අපචූ

09. '1823' යන සංඛ්‍යාව පාලියෙන් ලියා ඇති නිවැරැදි වරණය කුමක් ද?
i. එකසහස්සාධික-අට්ඨසතුත්තර-තෙවීසතිං
ii. තෙවීසත්‍යාධික-අට්ඨසතුත්තර-සහස්සං
iii. සහස්සුත්තර-අට්ඨසත-තෙවීසති
iv. තෙවීසති-අට්ඨසත-එකසහස්සං

10. කාලාර්ථවාචී නිපාත පද ඇතුළත් යුගලය
i. එකදා - අධුනා ii. කතිධා - එකදා
iii. සබ්බත්ථ - සමන්තා iv. අධුනා - සබ්බත්ථ

11. 'එ'කාරයට යකාරාදේශයක් සිදුවන බාලාවතාර සූත්‍රය වනුයේ
i. යමෙදන්තස්සාදෙසො ii. ඉවණ්ණො යං නවා
iii. යවමදනතරළාචාගමා iv. එහෙඤ්ඤං

12. මහප්‍රාණ අක්ෂරවලට අල්පප්‍රාණ අක්ෂර ද්විත්ව වීමේ කාර්යය සිදුවන බාලාවතාර සූත්‍රය කුමක් ද?
i. පරද්වෙභාවො ඨානෙ
ii. බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො
iii. වග්ගෙ ඝොසා'ඝොසානං තතියපඨමා
iv. සයෙච

13. සමාස පදවල පවත්නා මූලික ලක්ෂණයක් **නො** වන්නේ
i. නාමයක් හා ආඛ්‍යාත පදයක් සමාස වීම
ii. පද කෙටි වීම
iii. එක් පදයක් බවට පත් වීම
iv. එක් විභක්ත්‍යන්ත පදයක් බවට පත් වීම

14. '**මාතාපිතරො**' යන පදය අයත් වනුයේ
i. කම්මධාරය සමාසයට ය. ii. දිගු සමාසයට ය.
iii. තප්පුරිස සමාසයට ය. iv. ද්වන්ද සමාසයට ය.

15. තප්පුරිස සමාසය සඳහා උදාහරණයක් ලෙස යෙදිය හැකි පදය කුමක් ද?
i. චතුද්දිසං ii. ජිනචරිතං iii. ජීතින්ද්‍රියො iv. පාවචනං

16. පාලි භාෂාවේ සමාස ප්‍රභේද ගණන
i. 4 කි. ii. 5 කි. iii. 6 කි. iv. 8 කි.

17. තද්ධිත සම්බන්ධයෙන් නිවැරැදි ප්‍රකාශය වන්නේ
i. නාමයකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදේ.
ii. ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදේ.
iii. නාම පද දෙකක් එකතු වීමෙන් සෑදේ.
iv. තද්ධිත පදවල ආදිස්වර වෘද්ධිය සිදු නො වේ.

18. සකට + ණික යන්නෙහි නිවැරැදි තද්ධිත පදය කුමක් ද?
i. සකටික ii. සකටණික iii. සාකටික iv. සාටික

19. මහාවංසයේ පළමු වන කොටසේ කතුවරයා වනුයේ
    i. ධර්මකීර්ති මාහිමි ii. මහානාම මාහිමි
    iii. ශාරිපුත්‍ර මාහිමි iv. මහාකාශ්‍යප මාහිමි

20. **සාමණෙරො** පොත්ථකං පඨති යන වැකියේ අංකිත පදය
    i. සමාස පදයකි. ii. සන්ධි පදයකි.
    iii. තද්ධිත පදයකි. iv. කෘදන්ත පදයකි.

(ලකුණු - 2 x 20 = 40)

## II කොටස

02. අ. පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

සීහලදීපෙ කිර දණ්ඩගොණගාමෙ එකො සිගාලො තත්‍ථ තත්‍ථ ගොචරං පරියෙසමානො එකං සල්ලකං දිස්වා ගණ්හිතුං ධාවි. තස්මිං ඛණෙ සල්ලො සූචියො විජ්ඣි. තතො එකා සූචි සිගාලස්ස අක්ඛිං භින්දි. තෙන සො 'කාණසිගාලො'ති පඤ්ඤායි. අපරභාගෙ ගොචරත්‍ථාය ඉතො චිතො විචරන්තං අජගරො භොගෙන බන්ධි. අථෙකො ගොපාලකො තං අජගරෙන නිප්පීලියමානං දිස්වා තස්ස කාරුඤ්ඤෙන අජගරෙන සද්ධිං වායමිත්‍වා තං විස්සජ්ජාපෙසි. අජගරො සිගාලං විස්සජ්ජෙත්‍වා ගොපාලං ගණ්හි. සිගාලො තං දිස්වා මයා කතඤ්ඤුනා භවිතබ්බන්ති මඤ්ඤමානො අජගරස්ස භොගෙ තත්‍ථ තත්‍ථ ඩසන්තො සද්දං කරොන්තොපි තං විස්සජ්ජාපෙතුමසක්කොන්තො සමීපඛෙත්තෙ කසන්තෙ මනුස්සෙ දිස්වා සීඝසීඝං තත්‍ථ ගන්ත්වා සද්දං කත්‍වා තත්‍ථ ඨපිතං එකං වත්‍ථං ඩසිත්‍වා ධාවි. මනුස්සා සද්දායන්තාපි වත්‍ථං පාතෙතුං අසක්කොන්තා ලෙඩ්ඩුදණ්ඩාදිහත්ථා තං අනුබන්ධිංසු සිගාලො අජගරස්ස සමීපෙ වත්‍ථං පාතෙත්‍වා පටික්කම්ම අට්ඨාසි. මනුස්සා අජගරං ච ගොපාලං ච දිස්වා අජගරං මාරෙත්‍වා ගොපාලං විස්සජ්ජාපෙසුං.

(ලකුණු - 9)

ආ. පහත සඳහන් පාලි ගාථා සිංහලට නගන්න.

සීහො සීඝං ගුහං ගන්ත්වා - තෙ අදිස්වා තයො ජනෙ
අට්ටිතො පුත්තසොකෙන - න ච ඛාදි න චාපිවි.

දාරකෙ තෙ ගවෙසෙන්තො - අගා පච්චන්තගාමකෙ,
උබ්බාසීයති සො සො'ව - යං යං ගාමමුපෙති සො

පච්චන්තවාසිනො ගන්ත්වා - රඤ්ඤො තං පටිවෙදයුං,
'සීහො පීළෙති තෙ රට්ඨං - තං දෙව පටිසෙධය'

(ලකුණු - 2 x 3 = 6)

03. අ. පහත වාක්‍ය පාලියට නගන්න.

i. රාහුල කුමාරයා කුඩා වියේ දී ම රහත් විය.
ii. ඔහු විහාරයට ගොස් බුදුන් වැඳ නැවත ගෙට එයි.
iii. පමාවීම මරණයට හේතු වේ. නොපමාව නිවනට හේතු වේ.

(ලකුණු - 3 x 3 = 9)

ආ. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එකස්මිං කිර සමයෙ ලංකායං දුට්ඨගාමිණී අභයො නාම රාජා රජ්ජං කාරෙසි. තදා තස්ස තිස්සො නාමෙකො චූළුපට්ඨාකො අබ්භන්තරිකො හුත්වා රාජකම්මං කරොති. තදා රඤ්ඤො කණ්ඩුලො නාම වාරණො නිගලඤ්ච ආලානඤ්ච භින්දිත්වා පාචීනපස්සං ගන්ත්වා වනං පවිසිත්වා කිසලපත්තාදයො ඡින්දිත්වා භින්දිත්වා ඛාදන්තො අනුක්කමෙන මහානිජ්ඣරවිහාරං ගන්ත්වා තෙසු තෙසු ඨානෙසු රුක්ඛමූලිකසුඤ්ඤාගාරිකාදයො යුත්තයොගෙ ඣානංගධරෙ භික්ඛු දිස්වා පසන්නමානසො තෙසං ඵලාඵලාදයො ආහරිත්වා උපට්ඨානං කරොන්තො විහාසි.

i. දුටුගැමුණු රජුගේ ඇතාගේ නම කුමක් ද?
ii. ඇතා නැගෙනහිර දෙසට ගියේ කුමක් බිඳගෙන ද?
iii. ඇතා උපස්ථාන කළේ කවර භික්ෂු පිරිසකට ද?
iv. 'වාරණො' යන්නට තවත් සමාන පද දෙකක් ලියන්න.

(ලකුණු - 1 + 1 + 2 + 2 = 6)

04. i. පාලි රීතියට අනුව විශේෂණ-විශේෂ්‍ය පද අතර පවත්නා සම්බන්ධය හඳුන්වා දෙන්න.
ii. අලිංග නාම පද 04 ක් ලියන්න.
iv. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ශබ්දය | දුතියා විභත්තිය | | චතුත්ථී විභත්තිය | | සත්තමී විභත්තිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| පුල්ලිංග 'බලවන්තු' | බලවන්තං | | | | | |
| ඉත්ථිලිංග 'එත' | | | එතාසානං | | | |
| නපුංසකලිංග 'ඉම' | ඉදං, ඉමං | | | | | එසු, ඉමෙසු |

(ලකුණු - 4 + 4 + 7 = 15)

05. i. අනුමති සහ පරිකල්පනාර්ථයේ යෙදෙන ආඛ්‍යාතය කුමක් ද?
ii. අතීත කාලය හැඟවීමට යෙදෙන ආඛ්‍යාත 03 නම් කරන්න.
iii. 'පච' ධාතුව පඤ්චමී ආඛ්‍යාත **පරස්ස**පදයේ හා **අත්තනො**පදයේ වරනගා වගුගත කර දක්වන්න.

(ලකුණු - 2 + 4 + 9 = 15)

06. i. පද සමාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.
ii. කම්මධාරය සමාසයේ ප්‍රභේද 05 ක් නම් කරන්න.
iii. පහත දැක්වෙන පද අයත් සමාස වර්ගය ලියා දක්වන්න.

1. නීලුප්පලං
2. සාරිපුත්තත්ථෙරො
3. තිලොකං
4. ජිනචරිතං
5. සමණබ්‍රාහ්මණා
6. චොරභයං
7. උපනගරං
8. ආරූළ්හවාණිජා

(ලකුණු - 2 + 5 + 8 = 15)

07. i. මහාවංසයට පෙර ලියා ඇති වංසකථා 02 ක නම් ලියන්න.
ii. මහාවංසයේ කතුවරුන් තිදෙනකු පිළිබඳ හැඳින්වීමක් කරන්න.
iii. පාලි වංසකථා රචනා කිරීමේ අරමුණු කවරේ දැයි කෙටියෙන් පහදන්න.

(ලකුණු - 2 + 6 + 7 = 15)

***

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය : තෙවැනි වාරය

2. ආධාරක අංකය : 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම : 11.1, 11.2, 11.3 සහ 11.4

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය : පාලි පාඨාවලී 1 සිට 10 දක්වා කථා

5. ආධාරකයේ ස්වභාවය : කෙටි ධර්ම දේශනා

6. ආධාරකයේ අරමුණු :
- නියමිත කතා වස්තු අධ්‍යයනය කිරීම
- උගත් දැනුම දේශනවලට යොදා ගැනීම දිරි ගැන්වීම
- ධර්ම දේශනා ප්‍රවීණත්වය ලබා දීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් :

- පාලි පාඨාවලී 1 සිට 10 දක්වා කථා පිළිබඳ මනා ව අධ්‍යයනය කිරීමට සිසුන් මෙහෙයවන්න.
- නිශ්චිත දිනයක් නම් කොට එම ඕනෑ ම තේමාවකට අදාළ ව කෙටි ධර්ම දේශනයක් පැවැත්වීමට සූදානම් ව සිටින ලෙසට උපදෙස් දෙන්න.
- නියමිත දිනයේ දී අහඹු ලෙස කුසපත් ඇදීම මඟින් සිසුන්ට මාතෘකා ලබා දෙන්න.
- පන්තිය ඉදිරියේ මිනිත්තු 05ක කාලයක් තුළ දේශනයක් පැවැත්වීමට අවස්ථාව සලසන්න.
- අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබා දෙන්න.

සිසු උපදෙස් :

- පවරනු ලැබූ තේමාවලට අදාළ තොරතුරු හොඳින් අධ්‍යයනය කරන්න.
- ධර්ම දේශනාව හොඳින් ගලා යන පරිදි කරුණු හසුරුවා ගැනීමටත් සූදානම් වන්න.
- කණ්ඩායම් වශයෙන් එක් ව පෙරහුරු වට කිහිපයක් පවත්වන්න.
- නිර්ණායකවලට අනුකූල ව මනා ව දේශනය පවත්වන්න.

**ලකුණු පරාසය :**

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු ය 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

| | |
|---|---|
| 9-10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව |
| 6-7 | සම්මාන මට්ටමේ නිපුණතාව |
| 4-5 | ආසන්න මට්ටමේ නිපුණතාව |
| 5 ට | අඩු  නිපුණතාවට ළඟා නො වූ |

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.

| නිර්ණායකය | සිසුන්ගේ නම් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| 1. මාතෘකාවට අදාළ බව | | | | | | | | |
| 2. සුගම ගලා යාම | | | | | | | | |
| 3. සාරවත් වීම | | | | | | | | |
| 4. කාලය කළමනාකරණය | | | | | | | | |
| 5. රිද්මයානුකූල උච්චාරණය | | | | | | | | |
| එකතුව | | | | | | | | |

**ඇමුණුම**

**කණ්ඩායම්වලට ලබා දීම සඳහා නිදර්ශක තේමා කිහිපයක්**

1. අපේ පිරිවෙණ ගැන කතා කරමු.
2. අප එකිනෙකා හඳුනා ගනිමු.
3. ධර්මබුද්ධි-පාපබුද්ධි කතාව ජීවිතාදර්ශයක් කර ගනිමු. (4 ශ්‍රේණියේ දී ඉගෙන ගත්)
4. අපේ දිනචරියාව කෙ බඳු විය යුතු ද?